ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ නොවැම්බර් 02 ඉරිදා 149 වෙළුම 23 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## පවුල පිළිබඳ ලෝක රදගුරු සංසද අත්දැකීම් ගැන හලාවත රදගුරු හිමි පවසයි

ධර්මදූතික සන්දර්භය තුළ පවුල් සංස්ථාවන්හි එඬේරික අභියෝගය තේමා කරගත් ලෝක රදගුරු සංසදයේ විශේෂ සැසිවාරයේ දී විවාහය පිළිබඳ වෙසෙස් අවධානයක් යොමු කළ බැව් ඊට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළු මහ ලේකම් හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ ප්‍රදීපයට ප්‍රකාශ කළහ.

විවාහයට පෙර ලබා දෙන පුහුණුව සැසිවාරයේ වෙසෙස් අවධානයට ලක් වූ අතර විවාහ අපේක්ෂක සමුළු මීසම් මට්ටමින් ආරම්භ වී දිනකට දෙකකට සීමා නොවී සිදුවිය යුතු බවට ද කරුණු පළ වී ඇත. දික්කසාද ඉහළ යෑමේ ප්‍රවනතාවය, සමලිංගික විවාහ, තරුණ යුවළ විවාහ නොවී එකට විසීම ආදි තත්ත්වයන් පිළිබඳවද අවධානය යොමු විය.

ශුද්ධවූ සභාව ලෙස විවිධ ගැටලු වලට මැදි වූ සියල්ලන් වෙත දයා කරුණාව දැක්වීමේ අගය විදහාපාමින් කිසිවකු ප්‍රතික්ෂේප නොකර සිටීමේ වැදගත්කම ගැන ද සාකච්ඡා වී ඇත. මේ අතර 2015 වසරේ පවත්වන්නට නියමිත ලෝක රදගුරු සංසදයට පෙර ඉදිරි වසරක කාලය තුළ ලොව සියලු රටවල රදගුරු සමුළු මේ කරුණු කාරණා පිළිබඳව මනා අවබෝධයෙන් අධ්‍යයනය කරන්නට සැදී පැහැදී ඇති බවද වාර්තා වේ.

(රදගුරු හිමිපාණන්ගේ විශේෂ ලිපියක් ලබන සතියේ බලාපොරොත්තු වන්න)



# සුදුතුම් පිය ලංකා ගමන ජනවාරියේදී ස්ථිරයි

## අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ අගරදගුරු පදවි වාර්ෂික පූජක රැස්වීමේදී තහවුරු කරති

**සැලසුම් කරගත් පරිද්දෙන් අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා ගමන සිදුවන බවටත්, යම් හෙයකින් ජාතික මැතිවරණයක් ප්‍රකාශයට පත්වුවහොත් අදාළ දිනවල දී සසුන් පිය සංචාරයට බාධාවක් වන පරිදි මැතිවරණ කටයුතු නොපැවැත්වීමට රජයෙන් ප්‍රතිඥාවක් ලැබී ඇති බවටත් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ. ඉකුත් දා අගරදගුරු මැදුරු ශ්‍රවණාගාරයේ පැවැති අගරදගුරු පදවි වාර්ෂික පූජක රැස්වීමේ දී උන්වහන්සේ එසේ පැවසූහ.**

15 පිටුවට »

## මාධ්‍ය නිවේදනයයි

2014 ඔක්තෝබර් 24 වැනි සෙනසුරාදා "දි අයිලන්ඩ්" පුවත්පතේ පළ වූ "ජනවාරියේ පාප් තුමාගේ පැමිණීම කරුණු කියා වැළැක්වීමට ශ්‍රී ලංකාවේ පියතුමන් සූදානම්" මැයෙන් වූ පුවතේ මුල් ඡේදයේ මෙසේ දැක්වේ. "කොළඹ පදවියේ කතෝලික පියතුමන් ලබන වසරේ ජනවාරි 13 සහ 15 අතර අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පිය ශ්‍රී ලංකා ගමනට සහය දැක්වීමට හෝ නොදැක්වීමට තීරණයක් ගැනීමට නියමිතව සිටී."

අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා ගමනට අදාළ සියළුම තීරණ ගනු ලබන්නේ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති තුමා සමග එකමුතුවෙන් බැව් පෙන්නා දීමට අපි කැමැත්තෙමු.

ඉහත දැක්වෙන පුවත ඊට අදාළ කිසිදු පුවත් මූලයක් නොදක්වා හුදු කොළඹ පදවියේ කතෝලික පියතුමන් ලෙස දක්වා තිබේ. මෙය පාඨකයන් නොමඟ යවන්නක් හා කොළඹ අගරදගුරු වසමේ කතෝලික පූජකවරුන් පිළිබඳ වැරැදි හැඟීමක් ඇති කරන්නක් විය හැකිය.

පාඨකයන් වෙතින් ද අප ඉල්ලා සිටින්නේ විවිධ හේතූන් නිසා දූෂමාන ආරංචි පතුරා හරින්නන් නිසා නොමඟ නොයන ලෙසයි.

මේ රටේ කතෝලික සැදැහැවතුන් වෙතින් අප ඉල්ලා සිටිනුයේ ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා ගමන සාර්ථක කරගන්නට දෙවියන් වහන්සේට යාච්ඤා කරන ලෙසයි. ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා ගමන සැලසුම් කර ඇති පරිදි සිදුවනු ඇති බව දන්වා සිටිමු.

**අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා**
2015 සසුන් පිය ලංකා ගමන
මාධ්‍ය හා ප්‍රවෘත්ති කාර්යාංශ අධ්‍යක්ෂ

## මළවුන්ගේ අවුරුදු දා..



දැලතුර රෝමානු කතෝලික සුසාන භූමියේ භූමදාන කර ඇති තම ආදරණීය ස්වාමිපුරුෂයාගේ සොහොන් වළ මළවුන්ගේ මංගල දිනයට ප්‍රථම එළිපෙහෙළි කර ජපමාලය උච්චාරණය කරන්නට අමතක නොකළ සෙනෙහෙබර පතිනිය. **(සේයා - ඩබ්. ටී. සී. පෙරේරා)**

## මරිය වසර නිමා කරන මරිය රැළිය 8 දා මීගමුවේ

මෙල්වින් ද කොස්තා විසිනි

මරිය වසරේ නිමාව නිමිත්තෙන් නොවැම්බර් මස 08 වැනි සෙනසුරාදා මීගමුව සා. පීතර දේවස්ථාන භූමියේදී මරිය රැළියක් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් අගරදගුරු පදවි සහයක රදගුරු හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

එදින සවස 3.30 ට මීගමුව දිසාවේ සියලු බැතිමතුන් මහවීදිය සා. මරියා දේවස්ථාන භූමියට ද, මීගමුව නැගෙනහිර දිසාවේ බැතිමතුන් මීගමුව බස්නැවතුම් පළ අසළට ද, කටාන දිසාවේ බැතිමතුන් මාරිස්ටෙල්ලා විදුහල් ක්‍රීඩාංගනයට ද රොක් වී ප.ව. 4.00 ට සා. පීතර දෙව්මැඳුර කරා පෙරහරින් ගමන් කරති. පෙරහැර ගමන් කරද්දී සා. පීතර දෙව්මැඳුරේ ප්‍රධාන වේදිකාව මත සිට ජපමාලය උච්චාරණය කරන අතර පෙරහර මාර්ගයේ සවිකර ඇති ශබ්ද විකාශන යන්ත්‍ර මගින් සැදැහැවතුන්ට ඊට සම්බන්ධ විය හැකිය.

15 පිටුවට »

## මළවුන් සිහි කිරීම

**2014 නොවැම්බර් මස 02 වන ඉරුදින සවස 4.30 ට බොරැල්ල පොදු සුසාන භූමියේ කතෝලික කොටසේ මළවුන් සිහිකර පිදෙන දිව්‍ය පූජා යාගය කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. සවස 4.00 ට ජපමාලය උච්චාරණය කරනු ලැබේ. (සුසාන භූමිය - පරිපාලක පියතුමා)**

## නිවේදනයයි

**ඥානාර්ථ ප්‍රදීපය ඇතුලු අනෙකුත් පුවත්පත් විවිධ මීසම්වලින් ගනු ලැබුවද විශාල හිඟ මුදල් ප්‍රමාණයක් පවතින බව සියලුම මීසම් සේවක පියතුමන්ට මතක් කරන අතර මේ වසර නිමා වීමට පෙර එම මුදල් ගෙවා අවසන් කරන මෙන් අධ්‍යක්ෂ පියතුමා සිහිකැඳවීමක් කරයි.**

Please Like pope visit sri lanka official facebook page.
www.facebook.com/popevisitsrilanka2015 ■ www.popefrancissrilanka.com

පදවියෙන් පදවියට

# තනතුර පුද්ගලයා හෙබවීමට නොව සේවාව ඔපවත් කිරීමටයි

## අම්පිටිය ජාතික දෙව්සත්හලේ දී බදුල්ල රදගුරු හිමිපාණෝ පවසති

**"තේවාචාර්යවරයණී පූජකවරය හෝ රදගුරු නිලය ගරු නම්බු ලැබීමට ලැබෙන පත්වීම් නොවේ. ඒවා සේවය කිරීම සඳහා ලැබෙන පත්වීම් වන හෙයින් එම තනතුරු වලින් සිදුවිය යුතු කාර්යයන් සඳහා තම ජීවිතයෙන්ම කැපවිය යුතු යැයි" බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණෝ පැවසූහ.**

උන්වහන්සේ මෙසේ පැවසුවේ ශ්‍රී ලංකාවේ රදගුරු පදවි හයක් සහ ධර්මදූත නිකායක් දෙකක් නියෝජනය කරමින් සහෝදරතුමන් විසි හය දෙනකුට අම්පිටිය ලංකා අප ස්වාමිදූගේ ජාතික දෙව්සත්හලේ දී පසුගිය දා පැවති තේවාචාර්යවර ප්‍රදානෝත්සව දේව මෙහෙයේ දී ය.

එහිදී අදහස් දැක්වූ එතුමන් තේවාචාර්යවරයේ ආරම්භය හා විකාශය පිළිබඳවත් වගකීම් හා යුතුකම් පිළිබඳවත් තේවාචාර්යවරුන් දැනුම්වත් කළහ. "තේවාචාර්යවරයා යනු තම නිදහස් කැමැත්තෙන්ම තමාට හිමි වූ අයිතිවාසිකම් තම රදගුරුතුමන්ට භාර කළ තැනැත්තෙකි. ඒ අනුව කීකරුකම හා රදගුරුතුමන්ට පක්ෂපාතීකම, පූජක බඹසර රැකීම හා දිළිඳුකම රැකීමට තම රදගුරුතුමන් ඉදිරියේ පොරොන්දු වෙමින් තම ලෞකික ජීවිතය අතහැර සාන්ත සබාව තුළ දේව සේවයට කැප වේ. එම කැප කළ ජීවිතය තම දෛනික ජීවිතයේ ක්‍රියාවන් තුළින් දේව ජනතාවට අත්දැකීමට සැලැස්විය යුතුයැයි" එතුමාණෝ තවදුරටත් පැවසූහ.

"දේව ජනතාවගේ අවශ්‍යතාවන් පරිදි ප්‍රසාද ස්නාපනය හා සරණ බැන්දුම් වැනි සක්‍රමේන්තු දානය කිරීමත් අවමඟුල් පිළිවෙත් සිදුකිරීම හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීම, රෝගීන් සඳහා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන යාම වැනි කාර්යයන් තේවාචාර්යවරුන්ට පැවරේ. පූජක ජීවිතය හා බැඳි පිළිවෙත් ඉටුකිරීමටත් තේවාචාර්යවරුන් බැඳී සිටි යැයි" රදගුරු හිමිපාණෝ වැඩිදුරටත් පැවසූහ.

## දහම් පාසලට පුස්තකාලයක්

බංඩිගොඩ නිර්මල හෘදය දේවස්ථානයේ දහම් පාසල සඳහා සමාජ සේවා අමාත්‍ය ෆීලික්ස් පෙරේරා මහතාගේ ප්‍රතිපාදන වලින් පුස්තකාලයක් ලබාදී ඇත.

පසුගියදා පැවති එම දේවස්ථානයේ වාර්ෂික මංගලෝත්සවය වෙනුවෙන් අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම් සුධීර පෙරමුණ මහතාගේ මූලිකත්වයෙන් එය ප්‍රදානය කෙරිණි.

## ආඩිඅම්බලම මංගල්ලය අද ගුවනේ

ආඩිඅම්බලම ජපමාල දේවමාතා දේවස්ථානයේ මංගල්‍යය ඇසුරින් සකස් කළ විශේෂ වැඩසටහන නොවැම්බර් 2 ඉරිදා (අද) පෙ.ව. 11.00 ට සිංහල ස්වදේශීය සේවයෙන් ප්‍රචාරය වේ. 91.7 91.9Fm ඔස්සේ සවන් දිය හැකිය. සම්බන්ධීකරණය ඉග්නේෂස් ප්‍රනාන්දු නිෂ්පාදනය ජූඩ් අයිවන්.

## අගරදගුරු පදවි පූජක ධර්ම විවේකය -4

**කොළඹ අගරදගුරු වසමේ පූජක ධර්ම විවේකය 04 නොවැම්බර් 09 ඉරිදා සිට නොවැම්බර් 14 සිකුරාදා දක්වා තේවත්ත ධර්ම විවේකාගාරයේදී පැවැත්වේ**

**දේශක - ගරු බොබ් බ්‍රීසන් පියතුමා**

**සහභාගි වන පියතුමන්ලා**

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි, ගරු ෆීලික්ස් ශාන්ත, ගරු අජිත් අප්පුහාමි, ගරු ක්‍රිස්ටි නිකලස්, ගරු දෙව්ශාන් අසංක, ගරු මහේෂ් ක්‍රිෂන්ත, ගරු නිලන්ත එදිරිවික්‍රම, ගරු ඉන්ද්‍රජිත් පෙරේරා, ගරු ලලිත් පෙරේරා, ගරු රෝහිත රුද්‍රිගු, ගරු රුවන් දේශප්‍රිය, ගරු ටෙරන්ස් බෝදියාබදුගේ, ගරු සුරාන් අත්තිඩිය, ගරු නිකලස් බටේපොල, ගරු ඇන්ටන් ග්‍රොමික්, ගරු චමින්ද ලක්නාත් කුරේ, ගරු ෂාම් දසනායක, ගරු සිස්වාන්ද කෘෂ්, ගරු ජ්ලැසිඩස්ද සිල්වා, ගරු ෂෙල්ටන් ඩයස්, ගරු බර්ට්‍රම් රංජිත්, ගරු චමින්ද රොෂාන්, ගරු සිසිර ප්‍රියශාන්ත, ගරු කමල් ප්‍රියශාන්ත, ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු, ගරු ජූඩ් සමන්ත, ගරු නිලන්ත හේෂාන්, ගරු ක්‍රිස්ටෝ විරාජ්, ගරු ජූඩ් ක්‍රිෂාන්ත, ගරු ප්‍රැන්සිස් ෆොන්සේකා, ගරු ෆ්‍රීලි මුතුකුඩආරච්චි, ගරු ට්‍රැවිස් ගේබ්‍රියල්, ගරු සිසිල් කුමාර, ගරු ලියෝ කැමිලස්, ගරු ප්‍රිය ජයමාන්න, ගරු වික්ටර් ජයමාන්න, ගරු වී. ඒ. ජේසුදාසන්, ගරු කලන පීරිස්, ගරු ලක්ප්‍රිය නෝනිස්, ගරු ලෙස්ටර් නෝනිස්, ගරු නොයෙල් නෝනිස්, ගරු බර්නාඩ් නෙවිල් පෙරේරා, ගරු දේශාන් ලසන්ත පෙරේරා, ගරු අයිවන් පෙරේරා, ගරු ජෝශප් ඇන්තනි පෙරේරා, ගරු ලියෝ පෙරේරා, ගරු මර්ල් ශාන්ති පෙරේරා, ගරු රවීන් සඳසිරි පෙරේරා, ගරු කෘෂන් පෙරේරා, ගරු ටෙරන්ස් කිත්සිරි පෙරේරා, ගරු ජෝශප් පැට්‍රික් පෙරේරා, ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම, ගරු ජූඩ් බර්නාඩ් රුද්‍රිගු, ගරු සිසිර සමරකෝන්, ගරු රුබන් ලෙස්ලි, ගරු සුසිත් සිල්වා, ගරු ගිහාන් ෂෙනෝ සිල්වා, ගරු අමිල වැන්ඩර්වෝල්, ගරු ඇන්ටන් සුධාරක, ගරු රොනි වික්‍රමසිංහ යන පියවරු සහභාගි වෙති.



මෝදර සා. මහා සන්තියාගේ දේවස්ථානයේ සිරිහද සමිතියේ වාර්ෂික සංවත්සරය මීසම් සේවක ගරු ඇන්ටන් ජයලත් පියතුමාගේ සහ ගරු පිලීෂියා පැවිදි සොයුරියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. සභාපතිනිය රෝසබල් ගුණතිලක ප්‍රධාන ලේඛිකා හිරානි සොයිසා, භාණ්ඩාගාරික ඇසන්ටා ප්‍රනාන්දු ඇතුළු පිරිසයි.

**රනිල් රාජපක්ෂ**

# ජාඇල කලාපීය දහම් ගුරු දිනයේදී දහම් ගුරු සේවාව අගයමින් තිළිණ පිරිනැමේ



සීදුව සුපුවත් අරණේ පැවැති ජාඇල කලාපීය වාර්ෂික දහම් ගුරු දිනය ගරු ඩැරල් කුඤ්ඤ පියතුමන් විසින් අර්ථාන්විතව මෙහෙයවන ලද අතර, දහම් ගුරුවර, ගුරුවරියන් මූලධර්මවාදීන්ට පිළිතුරු දෙන ආකාරය ගැන සීදුව සා. තෝමස් ජාත්‍යන්තර පාසලේ අධ්‍යක්ෂ ගරු කෙනඩි පෙරේරා පියතුමන් විසින් දැනුම්වත් කරන ලදි.

දහම් ගුරුවරුන්ගේ සේවය අගය කරමින් 'මරියෝත්තමාවෝ' පොත ලබා



දීමත්, කලාපයේ දහම් ගුරු 3 වෙනි විභාග යට පෙනීසිටි 250 කට 'කතෝලික සභා ධර්මෝපදේශය' පොත ප්‍රදානය කිරීමත් මෙහිදී සිදුවිය.

ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර් වැලිවිට පියතුමා පිළිගත් අතර අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් විසින් තුති පුදන ලදී. ගුරුවරුන් සඳහා මරියෝත්තමාවෝ පොත ලබාදීමට පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් මයිකල් පෙරේරා බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ශ්‍රිනාත් පෙරේරා මහත්වරුන්ගේ අනුග්‍රහයත්, කතෝලික සභා ධර්මෝපදේශය පොත ලබාදීමට බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නිමල් ලාන්සා, මීගමුව නගරාධිපති ඇන්ටනි ජයවිර, වර්ල්ඩ් විෂන් ආයතනයේ කළමනාකරු මංජුල මහත්වරුද, කොච්චිකඩේ ශා. අන්තෝනි සිද්ධස්ථාන පාලක ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා ද දායකත්වය ලබාදුන්හ.

මේ වාර්ෂික දහම් ගුරු දිනය සඳහා ජා-ඇල කලාපයේ දිසා නායක පියවරුන්ද, දිසා දහම් පාසල් අධ්‍යක්ෂ පියවරුන් ද, පැවිදි සොයුරියන් හා කලාපයේ දහම් ගුරුවර ගුරුවරියන් 1500 කට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ. ජා-ඇල කලාපීය දහම් පාසල් හා බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා කටයුතු සංවිධානය කළේය.

**මෙරිල් ගෝමිස්**

# හිඟුරක්ගොඩ වැඩිහිටි දිනය

හිඟුරක්ගොඩ ක්‍රිස්තුරජාණන්ගේ දේවස්ථානයේ මරිය හමුදා අප ස්වාමිදුවගේ ප්‍රසීඩියම සංවිධානය කරන ලද වැඩිහිටි දිනය පසුගියදා දෙව් මැඳුරු භූමියේදී පැවැත්විණ. මේ සඳහා මීසමේ දෙමාපියන් වැඩිහිටියන් පනහකට ආසන්න පිරිසක් සහභාගි වූහ.

මීසම් ඉතිහාසයේ දේවස්ථානය ගොඩනැගීම සඳහා ශ්‍රමය, කාලය පමණක් නොව අතමිට ඇති මුදල් පවා වැය කරමින් වෙහෙස මහන්සි වූ වැඩිහිටියන් අගය කරමින් දේව විශ්වාසය තුළ ජීවත් වන මෙම පිරිසට අවශ්‍ය මානසික, ශාරීරික සුවය ප්‍රාර්ථනය කරමින් දිව්‍ය යාගය පුදනු ලැබුවේ මීසම් සේවක ගරු එරික් ප්‍රනාන්දු පියතුමායි. මෙම වැඩිහිටියන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පැවැත් වූ අතර ඔවුන්ට සමරු තිළිණයක් ද පිරිනැමුනි. ඔවුන්ගේ සතුට විනෝදය වෙනුවෙන් සංගීතය සැපයුවේ මින්නේරිය කාල තුවක්කු හමුදා පාසලේ 'කැලිප්සො' සංගීත කණ්ඩායමයි. වැඩිහිටියන් අතර මිශ්‍ර විවාහක බෞද්ධ වැඩිහිටියන්ද පැමිණීම විශේෂත්වයකි. ශ්‍රී කුරුසියේ කන්‍යාරාමයේ ගරු මාග්‍රට් පැවිදි සොයුරිය සමග සෙසු පැවිදි සොයුරියන් මේ සඳහා සහයෝගය ලබාදුනි.

**ඩබ්. ජෝශප් ඇන්ටනි**



සමිඳු කෙත අස්වද්දන්නට ගාල්ල, කලේගාන ශාන්ත ප්‍රැන්සිස් සේවියර් කනිටු දෙව්සත්හලේ තෙදිනක් පුරා පැවති වර්ෂ අවසාන දේවකැඳවීම් කඳවුර ඉතා සාර්ථක අන්දමින් නිමාවිය. ගාලු පදවි රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ආශිර්වාදයෙන් ද, කලේගාන මීසම් සේවක ගරු හර්මන් ප්‍රනාන්දු පියතුමාගේ සහයෝගයෙන් ද, කනිටු දෙව්සත්හල් අධ්‍යක්ෂ ගරු සම්පත් විලේගොඩ හා සහාය අධ්‍යක්ෂ ගරු නවීන් ජූඩ් පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ සාර්ථක අන්දමින් නිමාවිය.

**දසිත් මිහිරාන්**

# ප්‍රතිමා දෙකක් ලබාදෙන්න!

දංකොටුව ගොඩැල්ල මීසමේ තඹරවිල නිර්දෝෂ දේවමාතාවන්ගේ දෙව්මැඳුරේ දෙසැම්බර් 14 වන දිනට යෙදෙන 175 වන ජයන්ති සංවත්සරය වෙනුවෙන් එම දෙව්මැඳුරේ ඉදිවන නව කොටසේ දේවමාතාවන් වහන්සේගේ අඩි 2 1/2 ක් පමණ උසැති ප්‍රතිමා ස්ථාපිත කිරීමට මේ වන විටත් සියලු කටයුතු සූදානම් කරමින් සිටි. ඒ සඳහා ගුවාඩලුපේ දේවමාතාවන්ගේ (මෙක්සිකෝ) සහ මෙජුගෝරි දේවමාතාවන්ගේ (යුගෝස්ලෝවියා) ප්‍රතිමාවන් දෙකක අඩුවක් පවති. එම ප්‍රතිමාවන් ලබාදීමට හැකි අයකු සිටිනම් ඉතා ඉක්මනින් ලබාදීමට කටයුතු කරනමෙන් මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා ඉල්ලා සිටි. වැඩි විස්තර දැනගැනීම සඳහා 031-2258277 දුරකථන අංකයට අමතන්න.

**ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

# බෝලවත්ත විසෙන්ති පාවුලා 40 සංවත්සරය සැමරේ

බෝලවත්ත සා. වින්සන්ද පාවුලා සමිතියේ 40 වැනි සංවත්සරය පසුගියදා සලාපුර විසෙන්ති පාවුලා සමිති අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් හා බෝලවත්ත මීසම් සේවක ගරු ජයන්ත පෙරේරා සහ සහායක ගරු ඩිලාන් සුසන්ත පියතුමන්ගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණි.

මෙදින ප්‍රදේශයෙ ආබාධිත, රෝගී, වැඩිහිටි සියලු දෙනා දේවස්ථානයට ගෙන්වා දිව්‍ය යාගයක් පවත්වා ඔවුන් ශු. තෛලයෙන් ආලේප කර ආසිරි ගන්වන ලදි. විසෙන්ති පාවුලා මුනිඳුන්ගේ මංගල්ලයද මෙදින සමරන ලද අතර සමිතිය ආරම්භයේ සිට මේ දක්වා සේවයේ නියුතු සාමාජිකයින් කිහිප දෙනෙකුටද වයෝවෘද්ධ සාමාජිකයින් කිහිප දෙනෙකුටම තිලිණ ප්‍රදානයක්ද සිදුකෙරිණි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



දේව මාතා මංගල්‍යය දැලතුර සාන්ත රෝකුස් මුනිඳුන්ගේ දේවස්ථානයේ ජ්‍යේෂ්ඨ කාන්තා ප්‍රසීඩියම ඉතා අලංකාරව පවත්වා මීසම් සේවක ගරු තුෂාර සම්පත් පියතුමා සමග ඡායාරූපයකට පෙනීසිටි අවස්ථාව.

**ඩබ්. ටී. සී. පෙරේරා**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 නොවැම්බර් 02 ඉරිදා

# පැවිදි වසර අර්ථවත් කරමු

අතිඋතුම් ප්‍රැන්සිස් පාප් වහන්සේ විසින් 2015 වසර ශුද්ධාසන දින දර්ශනයේ පැවිදි වසර ලෙස නම් කොට ඇති බව දැනටමත් ප්‍රකාශ වී ඇත. අප ශ්‍රී ලංකා දේශය තුළද විවිධ පදවි අතර ඒ ඒ වර්ෂයන් තම ආධ්‍යාත්මික ගුණ වගාව අරබයා නම් කිරීම් කරන අතර විවිධ විෂය පථයන් අවධානයට ගෙන විශ්ව සභාවේ නම් කිරීමද එයට සමගාමීව ගෙන ගොස් ඇති අයුරුද මෑත අතීතය කදිමට සාක්ෂ්‍ය දරා ඇත. ඒ අනුව කොළඹ අගරදගුරු පදවිය ප්‍රමුඛ අනෙක් සියලුම පදවිද තම දූත කාර්යයේ ප්‍රමුඛතාව අනුව කාලයේ සලකුණු අවධානයට ගෙන වර්ෂයන් නම් කිරීම කවදත් කර ඇති බව පැහැදිලිය.

2015 වසර පැවිදි වසර ලෙස නම් කිරීමට විශ්ව සභාවේ ප්‍රමුඛතාව වී ඇත්තේ ආලේප කරන ලද ජීවිත පිළිබඳව නැවුම් ආරකින් සොයා බලා එම ජීවිත පළමුව ඇගැයීමටත්, දෙවනුව කැඳවීමේ උතුම් බව විහිද හැරීමටත්, තුන්වෙනුව තව තවත් තරුණ ජීවිත ඒ කැඳවීම කරා ගෙන ඒමටත් විය හැකි බව තහවුරු කළ හැකියි. ඒ අනුව අප සසුන් පියාණන් විශේෂ අවධානයක් පැවිදි ජීවිත කෙරෙහි යොමු කිරීම විශ්වීය සභාව තුළ පමණක් නොව දේශිය වශයෙන් අප කතෝලික සභාවටද සුවිශේෂී බව සඳහන් කළ යුතුමයි.

අද ලෝකය පුරා විහිද ගොස් ඇති විශ්ව සභාව නම් මහා වෘක්ෂයේ ශක්තිමත් අතු බවට පත්වී ඇත්තේ පැවිදි නිකායන් බව අමුතුවෙන් කිව යුතු නොවේ. පදවි පූජක සංඝයන් ඒ ඒ පදවි තුළ දේව වන්දනාවට ප්‍රමුඛතාව දෙමින් ගෙන යන ආධ්‍යාත්මිකත්වයේ ජීවන රටා, සමාජීය වශයෙන් පොහොණි කරන්නේ පැවිදි අංශ බව කිව යුතුයි. ඔවුනට ආවේණික ප්‍රභා සම්පන්න බව තුළ සැදැහැවතුන්ගේ ආධ්‍යාත්මික ජීවිතයත්, සමාජීය ජීවිතයත් සමබර කරමින් ඔවුන් පුබුදුවා ලන්නට ගෙන යන ක්‍රියා දාමය සැබවින්ම නිහඬ විරෝදාර ජීවිත පැවැත්මක්වයි. ඒ අනුව සහෝදර පංති නිකායන් හා වනිතා පැවිදි නිකායන් තුළ දිවි ගෙවන මේ කැපවුණු උතුම් අය පිළිබඳව සිතන්නට මේ වසර තුළදී ජනතාවකට කරන ඇරයුම ලිහිල්ව ගත යුතු නොවන බව කාගේත් හැඟීමයි.

පැවිදි ජීවිතයක් අනුහස තුළ ප්‍රභා සම්පන්න කිරීම නිසා විවිධත්වයක් සභාව තුළ ඇති කරයි. ඒ විවිධත්වය ඒකත්වයක් කරා ගෙන ඒමේදී ඇතිවන ශක්තිය හා ඇතිකරවන ශක්තිය සැබවින්ම මෙතෙක් යැයි කිව නොහැකි තරම්ය. අප දේශිය සභාව ගොඩ නැඟුනේද මේ පැවිදි පංති නිසාමයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය, සෞඛ්‍ය සේවාව, ගොවිපල ආශ්‍රිත කෘෂිකාර්මික සේවාව, තාක්ෂණය මූලික කොටගත් කාර්මික පුහුණු සේවාව, උසස් අධ්‍යාපනයට අත්වැල, ළදරු අධ්‍යාපනය, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පිළිබඳ අවධානය, මහළු නිවාස සේවා, අනාථ ළමුන් උදෙසා මහඟු සේවාව, කිරි දරුවන් රැක ගැනීම ආදි මෙකී නොකී සියලු සේවාවන් මේ දේශය තුළ ආරම්භ කොට එතුළින් පූර්ණ මනුෂ්‍යත්වයේ ගමනක් ආධ්‍යාත්මිකව යාමට ප්‍රමුඛත්වයක් ගනු ලද්දේ අපේ පැවිදි සහෝදරයින් මෙන්ම පැවිදි වනිතා උත්තමාවියන් විසින්ම බව ආඩම්බරයෙන්ම පවසා ලිය හැකියි. එකිනෙකාට ආවේණික 'කරිස්මාව' නැතිනම් ප්‍රභා සම්පන්න බව තුළ ක්ෂේත්‍රයේ නිපුනතාව උපරිමයටම උකහා ගත් නිසා ඒ ඒ පැවිදි පංති අප දේශය තුළ ශීඝ්‍ර වර්ධනයක් කරාද ගමන් කළ බව ඉතා පැහැදිලිය. නොදියුණු ගම්මාන වල අන්‍යාගමිකයින් අතර පිළිගැනීමටත්, ගෞරව බහුමානයටත් ඔවුන් පාත්‍ර වූයේ ඒ නිසි නිපුනතාවයේ කරිස්මාව නිසාමයි.

එනමුදු මෑත අතීතය පිරික්සා බලමින් අද අපගේ පැවිදි පංති වල වර්තමාන තත්ත්වය ගැන අතීතාවලෝකනයකින් සමාලෝචනයක් කිරීම වටින්නේ මේ නම් කළ පැවිදි වසරට තවත් ශක්තියක් එකතු කළ යුතු බැවින්මයි. එය විටෙක ස්ව විවේචනයක් ලෙසද ගණන් ගැනෙනුයේ වර්තමාන තත්ත්වය සමහර විට වේදනාකාරී වන බව අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ පැවිදිවර උතුමන්, උත්තමාවන් පවසන අදහස් තුළින්මයි.

අද කැඳවීම අනුව බලන කළ අපේ පැවිදි පංති අතර ශීඝ්‍ර අවපාතයක් ඇති බව පැහැදිලියි. පුරුෂ පැවිදි පංති මෙන්ම වනිතා පැවිදි පංති අතරද මෙම අවපාතය දැකිය හැකියි. අද පැවිදි පංති රැකගෙන ආ විවිධත්වයේ කරිස්මාවද අපැහැදිලි බව වැඩිහිටියන්ගේ මතයයි. හැම කෙනෙක්ම එකම ආරක සමාජ ශෝධනයක් පිළිබඳව කථා කරන්නට ගන්නා උත්සහය තුළ ඒ විවිධත්වයේ කරිස්මාව ඉරිතලා ඇති බව ජ්‍යේෂ්ඨ පැවිදි උතුමන්ගේද මතයයි. අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් අප සමහර පැවිදි පංති ඈත්වී ඇත. තරුණ තරුණියන් අතර ගැවසීම දුරස් කරගෙන ඇත. පූජක සංඝ අතර සේවාවේ සබඳතාවට සම්බන්ධ වීම අමතක කර ඇත. මේ කරුණු නිසා ජනතාවගෙන්ද යම් දුරස් වීමකට මේ පැවිදි පංති මුහුණ දී ඇත. මේ පවසන්නේ පැවිදි පංති වල ජ්‍යේෂ්ඨ සහෝදර තුමන්ලායි. පැවිදි සොහොයුරියන්මයි.

නමුත් මේ පැවිදි වසර තුළ ආපසු හැරී බලා විශ්ව කතෝලික සභාවට දෙන මේ මාහැඟි සේවාව සැබවින්ම ඇගැයීමට ලක් කරන්නට අප දේශිය සභාව මූලිකත්වය ගත යුතුයි. පදවි පියතුමන්ලා මේ පැවිදි සේවාවේ අගය නිරන්තරයෙන්ම ජනතාවට සිහිපත් කළ යුතුයි. ඔවුන් හා සමග අත්වැල් බැඳ ගත යුතුයි. එක් ජාතියකට පමණක් සීමා නොවන එක් ජාතියකට සිදුවූ අගතියක් ගැන පමණක් කථා කරන, සමාජ ක්‍රියාධර ක්‍රියාවේ සීමා සහිත තත්ත්වයකට පත් නොවන සේ ක්‍රියා කරන්නටත් අපේක්ෂා කරන බව පවසන අපේ පැවිදි මේ සොයුරු සොයුරියන්ගේ දූත සේවාව ඔවුනට ආවේණික කරිස්මාවෙන්ම සොයා ශක්තිමත් කරන්නට අපිත් මේ වසර තුළදී ඔවුන් හා එකාත්මික වන්නට දැඩි අදිටනක් ඇතිකර ගත යුතු බව දැඩිව අවධාරණය කරමු.

# සසුන් පිය ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය රාජ්‍ය තාන්ත්‍රික ඇසින්

## සුදුතුම් පිය ලංකාගමන 2015 නිමිත්තෙනි

**කැලිස්ටස් ජයමාන්න**

**සිරිලක් ඉතිහාසයේ සිදුවූ පළමු සසුන්පිය ශ්‍රී ලංකාගමනය 1970 දෙසැම්බර් 04 දා ද දෙවැන්න 1995 ජනවාරි 20-21 දිනවලද සිදුවිය. මෙම අවස්ථාවන් ශ්‍රී ලාංකීය ජනතාවටත්, වෙසෙසින් මෙරට කතෝලික සැදැහැවතුන්ටත් ආනන්දනීය මතක සටහන් එක් කළ බවට සැකයක් නැත. තුන්වන සසුන් පිය ශ්‍රී ලංකාගමන 2015 ජනවාරි 13-14 දින වල සිදුවන බව තහවුරු කොට තිබියදී ඒ වෙනුවෙන් මෙරට කිතුදන ප්‍රබෝධය හා උද්දාමය සැමතින්ම ඉස්මතු වෙද්දී යම් යම් ආන්දෝලනාත්මක පුවත් ද පැතිර යනු අසන්නට දකින්නට ලැබිණි. එහෙයින් අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පිය ශ්‍රී ලංකා සංචාරය හුදු ආගමික නායක සම්ප්‍රාප්තියක් පමණක්ද යන්න විමසා බැලීම කාලෝචිත යැයි හැඟේ.**

කතෝලිකයෝ දෘෂ්‍යමාන හා අදෘෂ්‍යමාන වශයෙන් සභා නායකයන් දෙදෙනකුට ගරු බුහුමන් දක්වති. අප ඇසට නොපෙනෙන නායකයාණන් වනුයේ දේව පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය. එතුමාණන් විසින් ම තම සභාව ඉදිරියටත් පවත්වා ගෙන යනු සඳහා තම අග්‍රශ්‍රාවක පේදුරු තුමන්ට භාර කෙරිණි. පේදුරු තුමා ඒ අනුව ප්‍රථම පාප් වහන්සේ ලෙසින් ක්‍රි.ව. 33-67 අතර කාලය තුළ කටයුතු කළේය. ඒ නිසාම දෘශ්‍යමාන සභා නායකයාණන් වන පාප්වහන්සේට ක්‍රිස්තුන් වහන්සේ ලෙස ද ව්‍යවහාර කෙරේ. ලොව කුඩාම රාජ්‍යය වන වතිකානයේ පරිපාලනය භාරව ද කටයුතු කරන බැවින් පාප්වහන්සේ වතිකාන රාජ්‍ය පාලකයාද වේ. රෝමයේ වැඩ වෙසෙන බැවින් රෝමයේ රාජගුරු ප්‍රසාදින් වහන්සේ ලෙසද රෝමය ඉතාලියේ අග නගරය බැවින් ඉතාලි සභා නායකයා ලෙසද එතුමන් විවිධ ආකාරයෙන් ආමන්ත්‍රණය කෙරේ. කිතුනු අපට එතුමා වැදගත් වන්නේ මේ හැමටම වඩා එතුමා රෝමානු කතෝලික සභාවේ නායකයාණන් මෙන් ම අපගේ දෘෂ්‍යමාන නායකයාද වන නිසාය. අතිඋතුම් ප්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය සිය බැටළු කැළ බැහැදකිනු රිසින් මුල්වරට පැමිණෙන ප්‍රධානතම එඬේරාගේ එඬේරික චාරිකාව බැවින් මෙරට ජනතාවට බෙහෙවින් ම වැදගත්ය. රාජ්‍ය කතෝලික මට්ටමින් ගත් කල එය තවත් ප්‍රධාන රාජ්‍යයක රාජ්‍ය නායක නිල චාරිකාවක්ද ලෙස සැලකිය හැකිය.

පාප් වහන්සේ නිල රාජ්‍ය නායක ධූරය හොබවන වතිකාන පුරවරය ඉතාලියේ රෝම නගරයේ ටයිබර් ගඟේ බටහිර ඉවුරට වන්නට පිහිටා ඇත. එහෙයින් මෙය රාජ්‍යයක අගනුවරක් තුළ පිහිටි තවත් රාජ්‍යයක් ලෙස සැලකීමේ ද වරදක් නැත. අක්කර 110 ක් හෙවත් හෙක්ටයාර් 44 ක භූමි භාග යක පිහිටි වතිකානය ලොව රෝමානු කතෝලික සභාවේ මූලස්ථානයද වන්නේය. මෙම රාජ්‍යය බිහිවූයේ ක්‍රි.ව. 1923 පෙබරවාරි 11 දා අතිඋතුම් XI වන පියුස් සුදුතුම් පියාණන් වෙනුවෙන් අතිඋතුම් ජීන්රෝ පියෙට්‍රෝ ගස්පාරි කාදිනල් තුමා සහ ඉතාලියේ III වික්ටර් එම්මානුවෙල් රජතුමා වෙනුවෙන් අග්‍රාමාත්‍ය බෙනිටෝ මුසෝලිනි අතර අත්සන් තැබුණ ලැටරන් ගිවිසුම මගිනි. එහෙත් රෝම ජනරජය ආරම්භක වකවානුවේ සිට ම ටයිබර් නදියේ බටහිර ඉවුරේ වගුරු බිම් පෙදෙස් 'වතිකාන' යන නමින් හැඳින්වූ බවට සාධක පවති. කිතු සමිඳුන් ජීවමානව සිටි යුගයේ දී ද ක්‍රි.පූ. 14 - ක්‍රි. ව. 33 අග්‍රිපිනා ද එල්ඩර් (Agrifinna the Elder) අධිරාජිනිය හා ඇයගේ පුත්‍ර කලිගල අධිරාජ්‍ය (ක්‍රි. ව. 12-41) යුගයේ දී වතිකාන උද්‍යාන හා ගෘහ වලින් අලංකෘතව පැවතිනි. මෙහි ශු. පේදුරු තුමාගේ සොහොන් ගැබ මත පළමු ශාන්ත පීතර බැසිලිකාව ඉදිකළේ යැයි සැලකෙන්නේ ක්‍රි.ව. 326 දී පමණ කොන්ස්තන්තීනු අධිරාජයා වතිකානයට එතරම් පැරණි ඉතිහාසයක් තිබේ.

ලැටරන් ගිවිසුම මගින් ලොව කුඩාම ස්වාධීන රාජ්‍යය ලෙස ස්ථාපිත කෙරුණු වතිකානය එයට ම ආවේණික පරිපාලන රටාවක් පවති. නිල රාජ්‍ය නායකයා වන පාප් වහන්සේ වතිකාන ජාතිකයෙකු නොවන අතර වරින් වර විවිධ ජාතිකයන් එම තනතුරට පත්වීම ප්‍රධාන සෙයි. එසේම පත් වන්නේද විවිධ රටවල් නියෝජනය කරන වයස අවුරුදු 80 ට අඩු කාදිනල් හිමිපාණන්ගේ ඡන්දයෙනි. වතිකාන රාජ්‍යයේ ව්‍යවස්ථාදායක අධිකරණ හා විධායක බලතල පාප් වහන්සේට හිමිය. පාප් වහන්සේට පැවරි ඇති ව්‍යවස්ථාදායක බලතල වතිකාන පුරවර රාජ්‍යයේ ශුද්ධාසන කොමිෂම (Pontifical Commision for Vatican City State) නම් වූ ශුද්ධාසන කොමිසමට පවරා ඇති අතර එහි ප්‍රධානියා වශයෙන් ඉතාලි කාදිනල් හිමිපාණන් කෙනකු වන අතිඋතුම් ගුසෝ බර්ටෙල්ලෝ හිමිපාණෝ කටයුතු කරති. එතුමන්ගේ නිල කාලය වසර 5 කට සීමා වන අතර උන්වහන්සේ පත්වූයේ 2011-10-01 දිනදීය. විධායක බලතල මෙම කොමිසමේ සභාපති වන ප්‍රධාන ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත පැවරි ඇති අතර පාප් වහන්සේ විසින් පස් අවුරුදු කාලසීමාවකට ඔවුහු පත් කෙරෙති. මෙම කොමිසමේ තීරණය පාප් වහන්සේගේ අනුමතිය ඇතිව ක්‍රියාත්මක කෙරේ. පරිපාලන කටයුතු ඉටු කිරීමේ දී (Pontifieal Commision for Vatican City State) නමින් හැඳින්වෙන කොමිෂන් සභාවට පාප් වහන්සේ විසින් පස් අවුරුදු නිල කාලයකට කාදිනල් වරුන් 7 නමක් පත් කෙරේ. මීට අමතරව ප්‍රවාහන, සෞඛ්‍ය, විදුලි සංදේශ ආදි කටයුතු සඳහා වෙනම දෙපාර්තමේන්තු හා ඒවායේ අධ්‍යක්ෂ වරුන් ද පත් කර තිබේ.


එසේම 2014 පෙබරවාරි 24 දින සිට ආර්ථික කටයුතු සඳහා වෙනම ලේකම් කාර්යාලයක් අතිඋතුම් ජෝර්ජ් කාදිනල් පෙල් හිමිපාණන් යටතේ පිහිටුවා ඇත. විනිවිද භාවය බෙහෙවින් අගයන නව පාප්තුමා උන්වහන්සේගේ පදවි ප්‍රාප්තියට පසුව වතිකානය සඳහා විග ණකාධිපති වරයකු ද පත් කර තිබේ.

වතිකාන පුරවරයේ අධිකරන කටයුතු සඳහා වෙනම උසාවි පිහිටුවා ඇතත් බන්ධනාගාර නැත. යුද හමුදාවක් නැත. පාප් වහන්සේගේ ආරක්ෂාව සඳහා ස්විස් ගාර්ඩ් (Swiss Guard) නමින් වයස අවු. 19-30 අතර අවිවාහක කතෝලික ස්විස් තරුණයන් ගෙන් සැදි භට පිරිසක් වෙති.

තැපැල්, බැංකු, විදුලි පණිවුඩ, මුද්දර සේවා පවතී. 'Losservatore Romano' නමින් නිල පුවත් පතක්ද වතිකාන ගුවන් විදුලියද පවති. වතිකාන ගුවන් විදුලිය භාෂා ගණනාවකින් වැඩ සටහන් ලොවපුරා විසුරුවා හරි. වෙනම ගුවන් තොටුපලක් ද ඇත. 2002.10.01 සිට මුදල් ඒකකය ලෙස යූරෝ Euro භාවිතාවේ.

ඉදිරි සතියට... »

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට



වෙන්නප්පුව මීසමේ ගිහි සැදැහැවතුන් පරිණත ධර්මයාණෝ වෙත ඔසොවා තැබීමේ වැඩසටහන් මාලාවක් වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන් විසින් ආරම්භ කර ඇත. තෝරාගත් ගිහි නායකයන් උදෙසා අසිපා ක්‍රමවේදය වඩාත් පුළුල් ලෙස දැනුවත් කිරීම තුළින් මෙම වැඩ පිළිවෙළ සවිබල ගැන්වේ. සේයාරුවෙන් දැක්වෙන්නේ ගරු පියතුමන් සමග තෝරාගත් එම ගිහි නායකත්වයෙන් පිරිසකි.

**සටහන - ප්‍රියන්ත පීටර්ස්; සේයා - බර්නාඩ් විතාරණගේ**

# නොරොච්චෝල මංගල උලෙළ

නොරොච්චෝල ජේසුතුමන්ගේ දිව්‍යහෘදයේ වාර්ෂික මංගල්ලය හලාවත පදවි භාණ්ඩාගාරික අතිගරු ලූක් නෙල්සන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර ග්‍රාමයේ පූජක පුතකු වන හලාවත පදවි සහයක භාණ්ඩාගාරික ගරු නලින් ගීත් පියතුමාද සන්ධ්‍යා මෙහෙයට සහ දිව්‍ය මෙහෙයට සහභාගි විය.

**ඩෙල්සි පිලිෂියා**



ජා-ඇල වෑවල සා. ප්‍රන්සිස් සේවියර් මුණිඳුන්ගේ දෙව්මැඳුරු භූමියේ අභිනවයෙන් ඉදිකරන ලද ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ ප්‍රතිමා මණ්ඩපය වෑවල මීසම් පුතකු වන දැනට ඉතාලියේ සේවයේ නියුතු අතිගරු නෙවිල් ජෝ පෙරේරා පියතුමන් විසින් ආසිරි ගන්වන ලදි. පසෙකින් වෑවල මීසම් සේවක ගරු සුමිත් කුමාර පියතුමා සිටී.

**බීඩ්. සිල්වා**

# දේව මාතාවන්ට බොදුනුවෝ ගරුසරු දක්වති

ගාල්ල මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමාගේ සංකල්පයකට අනුව ගාල්ල මීසම් ධර්ම සේවා සභාවේ සංවිධානයෙන් මීසමේ වාර්ෂික මංගල්‍යයට සූදානමක් ලෙස දේව මාතාවන් වහන්සේගේ ප්‍රතිමාව කොට්ඨාශ මට්ටමින් නිවෙස් වලට වැඩම කෙරේ.

නාගරික, අර්ධ නාගරික හා ඈත ගම්මාන වල නිවෙස් කරා ද දෙව් මව් සුරුවම එසේ වැඩම කරන අතර බහුතර බෞද්ධ සැදැහැවතුන් මැද වෙසෙන අපගේ සැදැහැවතුන් සිටින නිවෙසකට එදින සුරුවම ස්ථාපිත කිරීමට තිබුණි. එදින එම නිවස උත්සවශ්‍රීයක් ලෙසින් සූදානම් වී තිබූ බැවින් අවට නිවසේ වල බෞද්ධ සැදැහැවතුන්ට ද ඇති වූයේ ඉමහත් සතුටකි. එමෙන් ම කුතුහලයකි.

මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමා සමග තවත් සැදැහැවතුන් එම නිවසට ළඟා වන විට අවට සහෝදර බෞද්ධ සැදැහැවත්හු සුහදශීලි සිනාවෙන් ද ගෞරවය මුසු තැන්පත් කමකින් ද ජපමාලය උච්චාරණයේදී නිහඬව එකත් පසෙකින් ද සිටිමින් ඔවුන්ගේ සහයෝගය දැක්වූහ.

**මංගල ජයවර්ධන**



නුවරඑළිය යහපත් එඬේරාගේ බාලිකා මහා විද්‍යාලයේ අභිනවයෙන් ඉදිකරන ලද 'ලූර්දු ගුහාව' මහත් උත්සවශ්‍රීයෙන් පසුගියදා විවෘත කෙරින. අප ස්වාමිදුගේ ද්විතිය පාසලේ අදියුරු ගරු ශිවන්ත රොද්‍රිගෝ පියතුමා 'ලූර්දු ගුහාවේ' තැන්පත් කරන පාතිමා මෑණියන්ගේ පිළිරුව ආසිරි ගැන්වූ අයුරු.

**ජේ. ඒ. බානබස්**

## ඉටිපන්දම් ගෘහය රදගුරු හිමිපාණන් අතින් විවෘත වේ

කුලියාපිටිය සා. ජෝශප් දේවස්ථානයට යාබදව අභිනවයෙන් ඉදිකරන ලද ඉටිපන්දම් ගෘහය කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් විසින් ප්‍රථම ඉටිපන්දම් හත දල්වා විවෘත කෙරිණි.

දිව්‍ය පූජාවෙන් අනතුරුව දේවස්ථානයේ සිට ඉටිපන්දම් ගෘහය දක්වා පෙරහරින් වැඩම කරවන ලද ශු. ජුසේ මුනිඳුන්ගේ ප්‍රතිමාව විශේෂ ආසනය මත ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඊට සහභාගිවූ සියලු දෙනා ඉටිපන්දම් දල්වා ගෞරවාදරය දැක්වූහ. කුලියාපිටිය මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් ලියනගේ පියතුමන්ගේ සංකල්පයක් මත සහයක ගරු ගෝමි දිවාකර පියතුමන්ගේ සහයෝගයෙන් කුලියාපිටිය දේවස්ථානයේ බර්නාඩ් වර්ණකුලසූරිය මහතාගේ ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුනකි.

**රීටා සේනානායක**



නාත්තන්ඩිය නිර්මල ලූර්දු සිද්ධස්ථානයේ සහයක ගරු ජූඩ් චානක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් ලූර්දු මහා විද්‍යාලයේ පැවැති ගුරු උපහාර උලෙළකදී ඔවුන් ආසිරි ගැන්වූ අයුරු.

**ශ්‍රියාංගණී පිලීෂියා**



තුඩැල්ල මීසම් සංඝයේ සදාසරණ බැතියට නව මුහුණුවරක් දෙමින් මාසයේ සෑම පළමුවන බදාදා විශේෂ සදාසරණ බැතියක් පැවැත්වීමට 2012 ඔක්තෝබර් මාසයේ සිට මීසම් සේවක ගරු සිසිල් කුමාර පියනමගේ සංකල්පයක් මත කටයුතු කැරිණ. ජපමාලය, දේවමාතා ප්‍රාර්ථනාව, දේශන සමග ගැයුමෙන්, වැයුමෙන්ද දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයෙන් පසු දිව්‍ය පූජාව පවත්වා මෙහෙය නිමාවට පත්වේ. මෙහි දෙවර්ෂ පූර්ණය පසුගිය දා පැවැත්විණි. ඔක්තෝබර් මස ජපමාල බැතියටද, මරිය වසරටද දායකත්වය දෙමින් සහභාගි වූ කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා දක්වාවු සෑම අයෙකුටම දේවමාතා පින්තූර සහ පුදුම පදක්කම් බෙදා දෙන ලද්දේ ගරු සිසිල් කුමාර පියතුමාගේ කැපවීමෙනි. මීසමේ පවුල් සේවා සමිතිය විසින් පැමිණි සිටි සැමට කේක් සංග්‍රහයක් පිරි නමන ලදි.

**අයිරින් පෙරේරා**

# බුරුල්ලපිටිය විසෙන්ති පාවුලා වැඩිහිටි දිනයක්

වැඩිහිටියන් මහල්ලන් අනාථ මඩම්වල මහ මාර්ගවල තනිකර දමායන යුගයක ඔවුන්ගේ ජීවිතවලට බලාපොරොත්තුවක්, විශ්වාසයක් ඇතිකිරීමට වැඩිහිටි දිනයන් පැවැත්වීම උතුම් සත්ක්‍රියාවක් යැයි බුරුල්ලපිටිය මීසම් සේවක ගරු ඩඩ්ලි සපරමාදු නි.ම.නි පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ පසුගියදා බුරුල්ලපිටිය මීසමේ සාන්ත වින්සෙන්තිද පාවුලා සමිතිය වාර්ෂිකව පවත්වන වැඩිහිටි දිනය නිමිත්තෙන් පැවැති දිව්‍ය පූජා මෙහෙයේදීය. දිව්‍ය පූජාවෙන් අනතුරුව වැඩිහිටියන් විශේෂ වේදිකාවකට කැඳවා ඔවුන්ට ගෞරවාන්විතව පිළිගන්නා ලදි.

ප්‍රදේශයේ දිළිඳු දරුවන් සඳහා පාසල් උපකරන බෙදා දීම, වෛද්‍ය සායන පැවැත්වීම, දිලිඳු පවුල්වලට නිවාස තනාගැනීමට ආධාර කිරීම, රෝගීන් බැහැදැකීමට යාම ආදි සමාජ සත්ක්‍රියා රාශියක් මෙම සමිතිය විසින් ක්‍රියාත්මක කර ඇත. ගරු මාරි එලිසබෙත් පැවිදි සහෝදරියගේ සහයෝගය ද මේ කටයුතු සඳහා ලැබුණි.

**වෙනීෂියස් ඇන්ටනි**

# කළඑළිය සා. තෙරේසා මහජන සභා නව නියමුවෝ

ශ්‍රී ලංකාවේ ඉපැරැණිම කිතුනු සමිතියක් ලෙස හැඳින්වෙන කළඑළිය ශා. තෙරේසා මහජන සභාවට වසර 88 ක් පිරීම නිමිත්තෙන් මීසම් සේවක ගරු තරංග සම්පත් පියතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවයක් පැවැත් වුනි.

දිව්‍ය පූජා මෙහෙයෙන් අනතුරුව නව නිලධාරි මණ්ඩලය මෙසේ පත්විය. සභාපති යු. එල්. නිහාල් ජනප්‍රිය පෙරේරා ලේකම් හයිසින්ත් ප්‍රනාන්දු, භාණ්ඩාගාරික ලීනස් පෙරේරා, උප සභාපති මිලාන් ප්‍රනාන්දු, උප ලේකම් - ඇන්ටනි ප්‍රියශාන්ත, උප භාණ්ඩාගාරික ජේ. එම්. ඩේවිඩ් පීරිස්, ප්‍රධාන සංවිධායක - ඇනස්ලි පීරිස්. නියෝජ්‍ය සංවිධායක මර්වින් ප්‍රනාන්දු වෙති.

**ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා**

# කළුදෑවල ධර්ම විවේකයක්!

මාතලේ සාන්ත විසෙන්තියානු කොන්පරන්සය මගින් සංවිධාන කරන ලද එක්දින ධර්මවිවේකය කලුදෑවල සා. අන්තෝනි ග්‍රාමයේදි සිදුකරන ලදී.

මාතලේ මීසමේ කිතුනු සංඝයක් වන කලුදෑවල / ග්‍රාමයේ කතෝලික පවුල් (10) ක් පමණ පදිංචි ඇත. විවිධ දුෂ්කරතා මධ්‍යයේ මෙම පවුල් ආත්මික වශයෙන් පෝෂණය වීම මෙහිදී සිදුවිය. මීසම් සේවක පියතුමා දිව්‍ය පූජාව පවත්වා නිවාස හා පවුල් බැහැදැක ඔවුන්ගේ ප්‍රශ්න නිරාකරණය කිරිම මෙහිදි සිදුවිය. මාතලේ සා. වින්සෙන්තියානු කොන්පරන්සයේ නිල මඬුල්ල පැමිණි සිටි අතර සහයක ගරු සමන්ත වර්ණකුල පියතුමා ද මීට සහභාගි විය.


**ඒ. ආර්. ඇෆ් මදසේකර**

# බංඩාරවත්ත සා. ලාසරුස් දෙව්මැඳුර

1691 හා. ජුසේ වාස් පියතුමා රහසින් බේරුවල ප්‍රදේශයට පැමිණීමත් සමග අසරණව සිටි කතෝලිකයන් ආගමික පිබිදීමකට පත්විය. පොල්කොටුව දෙව් මැඳුර ඉදි කිරීමට බංඩාරවත්ත ග්‍රාමයේ කිතුනුවෝ දායක වූහ. 1848 දී පොල්කොටුව දෙව් මැඳුරෙන් වෙන්වී වැල්ලවත්ත බංඩාරවත්ත ග්‍රාමයට වෙනම දෙව් මැඳුරක් ඉදිකිරීම සඳහා අවසර ඉල්ලූ නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කැරිණ. 1867 දී අතිඋතුම් සිල්ලානි රදගුරු තුමන් වෙතින් දෙව් මැඳුර සඳහා අවසරය ලබා ගැනීමට කතෝලික ග්‍රාම වාසින් සමත් විය. ලත් අවසරය මත පොල් අතු මඩු දෙකක් තනා එය දෙව් මැඳුරක් ලෙස භාවිතා කළහ. 1878 සැප්තැම්බර් මස 9 වන දින සාන්ත ලාසරස් මුනිඳුන්ට කැප කරන ලද නව දෙව් මැඳුරට ගරු පිච්චනෙල්ලි පියතුමා මුල් ගල 1875 දී තබා දෙව් මැඳුරේ ඉදි කිරීම් නිමා විය. 1901 මීසම් ගෘහය සාදන ලදි.

1975 සැප්තැම්බර් 08 වන දින සියවස් ජයන්තිය පැවැත්වූයේ අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි.

දෙව් මැඳුරට අයත් පාසලේ අනන්‍යතාවය සඳහා වූ ගැටළුවේදී එහි කතෝලික අනන්‍යතාවය රැක ගැනීම සඳහා ගරු සිස්වාන් ද ක්‍රෑස් පියතුමා සමත් විය. සුනාමි හේතුකොට ගෙන මෙම පාසලේ ළමුන්ට




වෙනත් පාසලකට ඇතුළු වීමට සිදු විය. ප්‍රශ්න හමුවේ රජයට පවරාගත් පාසල් භූමිය නැවත සභාවට ලබා ගැනීම සඳහා හිටපු ක්‍රිස්තියානි කටයුතු අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මහතා මගින් එය ඉටුකර ගැනීමට එකල සම්බන්ධිකාරක වශයෙන් මට හැකි විය.

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන්ගේ අදහසක් අනුව ඉදිකළ කල්වාරි පුදබිම ආසිරි ගන්වා විවෘත කරන ලද අතර ශු. අන්තෝනි මුනි තුමන්ගේ ප්‍රතිමාව ද එදිනම කාදිනල් හිමිපාණන් අතින් ආසිරි ගැන්විය. වර්තමාන මීසම් සේවක ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා සැදැහැවතුන්ගෙ මූල්‍යාධාර මත පුදබිම අංගසම්පූර්ණ කිරීමට වෙහෙස වේ.

**බර්ට්‍රම් එස්. ප්‍රනාන්දු**

## මළවුන්ගේ මාසයට බත් පැකට් 3000 ක්

නොවැම්බර් 09 ඉරුදින කඩලාන මීසම් සේවක මොරටුව දිසා නායක අතිගරු ලලිත් පෙරේරා පියතුමන් විසින් මීසමේ දුප්පත් ජනතාව අතර දිවා ආහාර පාර්සල් 3000 ක් බෙදාදීමේ වැඩ පිළිවෙලක් සංවිධානය කර ඇත.

මීසමේ වෙසෙන ජනතාවගේ සහය මත ක්‍රියාත්මක කරන මෙම 'දානමය පුන්‍ය කර්මය' මළවුන්ගේ මාසය ඉලක්කකොට සිදු කරන අතර කිසිදු ආගම් බේදයක් නොමැතිව කොට්ඨාශ නායකයින් හරහා කරන තෝරා ගැනීමක් මත ආහාර පාර්සල් දුගී ජනතාව අතර බෙදා දෙනු ලැබේ.

**සුමිත් මාර්ක් ද සිල්වා**



පේරාදෙණිය කුඩා මලේ තෙරේසා මුනිවරියගේ වාර්ෂික මංගල්‍යය පැවැත්විනි. එදින සැදැහැවතුන් සා. තෙරේසා මුනි තුමියගේ ප්‍රතිමාව රැගත් පෙරහරට සහභාගි වූ අයුරු.

**ජූඩ් ජේ. ප්‍රනාන්දු**



ජීවිත ගැටළුවලින් හෙම්බත්ව සිත තුළ ඇති මානසික ආරවුල් විසඳාගැනීමට මීට සිව් වසරකට පෙර පිහිටුවන ලද තෝප්පුව මීසමේ 'සිත් සවන' උපදේශක මධ්‍යස්ථානයේ සිව් වන සංවත්සරය ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. තෝප්පුව මීසම් සහයක ගරු නිලන්ත රංජුල පියතුමා, ශ්‍රී වර්ධනාරාම විහාරාධිපති පූජ්‍ය කලංවස්වර සුමන ස්වාමීන් වහන්සේ හා ගරු නාදන් කුරුක්කල් තුමන් විසින් ආගමික වතාවත් ඉටුකරන ලදි. උපදේශක මණ්ඩලයේ සේවය කළ උපදේශක මහත්ම මහත්මින් තිස්දෙනකුට උපහාර තිළිණ ප්‍රදානය කැරිණ.

**මෙල්වින් ද කොස්තා**

## හැකිද සමරන්නට මරණය හැමදාම

වසරකට එක් දිනක් මළවුන් සොයන්නට
ජීවත්ව සිටියදී නොබැලුවත් මළදාට
ගලයි ජන ගඟක් උතුරලා කනත්තට
සමරමු මරණය දිනක නොව හැමදාට

දානයක සාදයක වෙනස නැහැ මරණයදාට
වෙන්කරමු බත් කටක් දානයෙන් කුසගින්නකට
ලැබේවි පින් කුසල් මළ ආත්මයකට
සමරමු මරණය දිනක නොව හැමදාට

බරක් නොමවෙමු කිසිමදා කිසිවෙකුට
වදනකින් හෝ සැනසුමක් වී කෙනෙකු හට
හරසුනක් නැති බොල් බවින් ඈත් වන්නට
සමරමු මරණය දිනක නොව හැමදාට

**ඇග්නස් සියඹලාපිටිය - කටුවපිටිය**

## මරණය අබියස නිදිවරව නිති අවදිවන්න

දෙවිඳු අත රැඳි මැටි පිඩක් වෙත වැදී ජීවන හුස්ම රැල්ලක්
මැවුනි මිනිසෙක් අසමසම රුව දෙවිඳු හා සම නව මැවිල්ලක්
මැවුම්කරු වූ දෙවිඳු අබියස වතට වත දී දකින දසුනක්
ලැබෙනු රිසියෙන් මිනිස් හද වෙත ලැබුණි දෙවිඳුගෙ කැඳවුමක්

ලොව දිනන්නට ජයලබන්නට තව කොතෙක් නම් වෙහෙස වන්නෙද
කම් සැපෙන් පිරි අරුත් නැති දේ වෙත ඇලුම් වී සතුටු වෙන්නෙද
පව් මලින් පිරි ජීවිතේ අග නිරා දුක නුඹ හිමි කරන්නෙද
අහෝ දෙවිඳුන් දුන්න මිනිසත් බව රකින්නට වෙහෙස ගන්නෙමුද

පිනට දහමට දුගියා නැගුමට දෙවිඳු අභිමතෙ මත රැඳෙන්නට
හුස්ම ටික ගිය දිනදි දෙවිඳුන් වතට වත දී සඟ දිනන්නට
සොරකු ලෙස එන මරණෙ අබියස නිදිවරව නිති අවදි වන්නට
දොර කවුළු හැර හද කුටිය වෙත සමිඳු සුහදව කැඳව ගන්නට

**රංජිත් නෝනිස් - නාගොඩ**

# කතෝලික විශ්වාසය තුළ මරණය සදාතන ජීවනයේ ආරම්භයයි



**මෙ ඉල් මසයි. මෙම මාසය තුළ කිතුනුවන් වන අප මරණය හා මියගිය සිය ඥාතීන් විශේෂිතව සමරන කාලයයි. දේව සමානකමට මවන ලද මිනිස් දිවිය මරණින් පසුව ද නැවත ජීවිතය ලබන බව ප්‍රථම වරට ශුද්ධ බයිබලයේ සඳහන් වන්නේ පරණ ගිවිසුමේ යෙසායා දිවැසිවරයාගේ පොතෙනි. "අපේ මළ ගිය අය නැවත ජීවත් වනු ඇත. ඔවුන්ගේ මළ සිරුර නැවත පණ ගැන්වෙනු ඇත..." (යෙසායා 26:19)**

එහෙත් මනුෂ්‍යයන් ලෙස අප මරණයට දක්වන්නේ මහත් බියකි. එබැවින් අපි මරණය කල් දැමීමට මහත් වෙහෙසක් ගන්නෙමු. මන්දයත්, මරණය ඒ තරම්ම ත්‍රාසජනක, අතිශය වේදනාකාරී බියජනක අවස්ථාවක් වන හෙයිනි. විවිධාකාර මරණ බිය එක් එක් පුද්ගලයාගේ පැවැත්ම අනුව වෙනස් වේ. මේ ලෝකය තුළ තමා සතු කොට ගත් භෞතික වස්තූන් සියල්ල හැරදා යෑමට සිදුවීමේ දුක ද තමන් ආදරය කළ පුද්ගලයන්ගෙන් වෙන්වීමේ දුක ද තවකෙකි. එම නිසා ලෝකෝත්තර දේ පිළිබඳ විශ්වාසයකට එළඹීමට නොහැකියාවේ පාපයෙන් අපි පෙළෙන්නෙමු. එබැවින් මරණයෙන් පසු සියල්ල අවසානය යන්න අපගේ හැඟීමයි.

මරණය බියක් - ශාපයක් නොව ආශිර්වාදයක් ලෙස සැලකුවෝ අප්‍රමාණ අනන්ත වෙති. ක්‍රෝධයෙන්, වෛරයෙන්, තණ්හාවෙන් මිදුනු ධාර්මික මිනිසා මරණයට බිය නොවේ. දේව පනත් අනුසාර කරමින් ප්‍රේමයෙන් යුතු ධර්මිෂ්ඨ සිල්වත් ජීවිත ගත කළ සැදැහැවතුන් කිසිවකුට මරණය ශාපයක් නොව ආශිර්වාදයකි. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන්, එම දහම වෙනුවෙන් සිය ජීවිතය සතුටින් පූජා කළ ප්‍රාණ පරිත්‍යාගවරුන් කිසිම බියක් දුකක් නැතිව මරණයට මුහුණ දුන් අයුරු අපි දනිමු. ඔවුහු එමඟින් සදාතන දිවියේ පංගුකාරයින් වූහ.

එබැවින් මරණය සියල්ල අවසාන කරන නැවතීමේ ලකුණක් නොවේ. මරණයට පත් වූවන් දිනෙක අමරණීයත්වයට පත්වෙනු ඇත. අලුත් පැළයක් පොළොවෙන් මතු වීම සඳහා එම බීජය මැරී වැළලී යා යුතු මෙන් ම අප සදාතන ජීවනය ආරම්භ වනුයේ ද මරණයෙන් ය. එම නිසා මෙලොව සදාකල් නවාතැනක් කර ගන්නට වෙහෙස නොවී සෑම විටම මරණය පිළිබඳ සිතා කටයුතු කරමු. ඒ මඟින් ලෝකය ඉතා සොඳුරු නවාතැන් පොලක් බවට පරිවර්තනය වනවාට කිසිදු සැකයක් නොමැත.

**✍ ඩබ්. ඒ. එස්. ප්‍රියදර්ශනී**
ආරච්චිකට්ටුව

# මරණය සොරෙකි; පසුතැවිලි වන්න

**නැ සීගිය කතෝලිකයන්ගේ ආත්මයන් සිහිපත් කිරීම වෙනුවෙන්, කතෝලික දින දර්ශනය විසින් නොවැම්බර් මාසය මළවුන්ගේ මාසය ලෙසට හඳුන්වා දී තිබේ. මෙම මාසය තුළ දී මළ ගිය නෑ සිය හිතවතුන් සිහිපත් කරමින් මිනිපිටිවලට පිවිසෙන අප හට මළගිය ඇත්තන්ගේ සමරු කොත් අතරෙන් දෝංකාර දෙනු ලබන පණිවුඩය වන්නේ "මරණය ඔවුන් සොයා පැමිණියේ පෙර දැනුම්දීමකින් තොරව බවත්, එදා ඔවුනට මෙන් හෙට අප වෙත ද මරණය සොරෙකු මෙන් පැමිණෙන බවත්ය."**

උත්පත්ති කතාවේ 2:7 අනුව මනුෂ්‍යයාගේ උපත මෙලෙස සටහන් වී තිබේ. "දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළු සේක. මෙසේ මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය." අප ආදි මව්පියන් වන ආදම් සහ ඒව එම මැවුම්කරුවාණන්ට විරුද්ධව පාපයෙහි යෙදුන බැවින් මනුෂ්‍යයා සතු වූ එකී ජීවමානභාවය, ඔවුන්ගෙන් ඉවතලා "දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහිය" (උත්පත්ති 3:19) වදාළමින් උන්වහන්සේ මනුෂ්‍යයාට මරණයේ සන්නම තැබූ සේක. තවද ආදි මව්පියන් කළ පාපයට දඬුවමක් ලෙසට උන්වහන්සේ ඔවුන්ව ස්වර්ග යෙන් පිටුවහල් කර පොළොව ඔවුන්ගේ නිජභූමිය බවට පත් කරමින් දින වේලාව තැන නොදත් මරණයකට මිනිසා යටත් කළ සේක. ඒ අනුව සෑම මනුෂ්‍යයන් සහ සත්වයන්ද, තුරුලතා ආදි සෑම ප්‍රාණවාචික උපද්‍රවයයන් ද මරණයෙන් කෙළවර වන බව අපි දනිමු.

එහෙත් නූතන ලොව දෙස බලන කල පෙනී යන්නේ තමන්ගේ මැරෙන සුළු බව මිනිසා විසින් සහමුලින්ම අමතක කර දමා ඇති බවය. ඉඩකඩම් ගේ දොර අයිති කරගන්නට, දේශ සීමා පුළුල් කර ගන්නට, රට රාජ්‍යයන් අයත් කරගන්නට ජාතියක් ජාතියකට විරුද්ධවද, සමාජයක් සමාජයකට විරුද්ධවද, සහෝදරයා තම සහෝදරයාට විරුද්ධව ද නිරතුරුව කුළල් කා ගැනීමෙහි යෙදී සිටිති. සාමය, සමාදානය, සහෝදර දයාව පලවා හැර වෛරය, ක්‍රෝධය, ද්වේෂය හදවතට වඩවා ගෙන ඇත.




මිනිසා මෙලොව සුඛවිහරණය සහ වස්තූන් කෙරෙහි එකිනෙකා පරයමින් අසීමිත ඇල්මක් දැක්වීමෙන් පෙනී යන්නේ මරණයක් ගැන හෝ මරණයෙන් පසු ඇති මතු දේව නියමයක් ගැන හෝ කිසිදු බලාපොරොත්තුවක් නූතන මිනිස් සමාජය තුළ නොමැති බවය. එකී පදනම ඔවුන්ගේ පෞද්ගලික ආත්මාර්ථකාමිත්වය පවත්වා ගෙන යාමට යෙදා ගෙන ඇති උපකල්පනයක් මිස යථාර්ථය හඳුනා ගැනීමක් නම් නොවේ. ජීවිතයක යථාර්ථය, එනම් මරණයේ පසුබිම සිහිපත් කරවන කාලයක් කතෝලිකයන් වෙත ශුද්ධවූ සභා මාතාව විසින් හඳුන්වා දී ඇත්තේ එකී ලෞකික භාවයෙන් තාවකාලිකව හෝ මිදී ලෝකෝත්තර භාවයට නතු වී මරණය සහ එයින් පසු අත්වන දේව නියමය ගැන මෙනෙහි කිරීමට අවකාශයක් ලබා දෙන පිණිසය. දෙවි පියාණන් විසින් උතුම් වූ තත්ත්වයකින් යුතුව මවන ලද මනුෂ්‍යයා ස්වර්ගයෙන් නෙරපා හරින කල දෙවිපියාණන් වදාළේ, මනුෂ්‍යයා දහඩිය මහන්සියෙන් තම එදිනෙදා ජීවිතය සකසා ගත යුතු බවත්, ඔවුන් විසින් කරන ලද ජන්ම පාපයෙන් ලෝකය මුදා ගැනීමට තමන් වහන්සේගේ ඒක ජනිත පුත්‍රයා මිනිසත් බව ගෙන මෙලොවට එවන බවටත්, සකල ලෝකයම ගින්නෙන් විනාශ කරමින්, උන්වහන්සේ නැවතත් සියලුම මියගිය ආත්මයන් මළවුන්ගෙන් නැගිටුවන බවටත්, එම සියල්ලන්ම නැවතත් අවසාන නඩු තීන්දුවට භාජනය කරනු ලබන බවත් ය. එහිදී දේව වචනයට අනුව යහපත්ව ජීවත් වූවන් ස්වර්ග රාජ්‍යයට කැඳවමින් අයහපත්ව ජීවත් වූවන් සදාකාලික නිරාගින්නට පලවා හරින බව ශු. බයිබලයේ සඳහන් වී තිබේ. ඒ අනුව මෙලොව ජීවිතය මරණයෙන් පසුව අවසාන වන බව අප දැන ගත යුතු අතර පාපයෙන් බැහැර වී යහපත්ව ජීවත් වීම එලොව ජීවිතයට වැඩදායක බව අප කවුරුත් දැනගත යුත්තේ ය.

එකී අවසාන විනිශ්චය මිනිසා වෙත පැමිණෙන ආකාරය ක්‍රිස්තුන් වහන්සේ විසින් "අත්තික්කා ගසේ උපමාවෙන්" (ශු. ලූක් 21:34) මෙසේ වදාළ සේක. "ඒ දවස මලපතක් මෙන් හදිසියෙන් ඔබ අසුකර නොගන්නා පිණිස කම්සැපෙන් ද, බීමත්කමෙන් ද, මේ ජීවිතයේ කරදර වලින්ද ඔබේ සිත් නොවෙහෙසෙන සැටියට වග බලා ගන්න. මන්ද එය මුළු පොළොවෙහි සකල ලෝක වාසීන් පිට පැමිණෙන්නේ ය. එබැවින් ඒ සිදුවන ආපදා සියල්ලෙන් ජයාන්විතව ගැළවෙන පිණිසද, මනුෂ්‍ය පුත්‍රයාණන් ඉදිරියෙහි පෙනී සිටින පිණිසද අයැදිමින් හැම වේලේම අවදිව සිටින්න."

මනුෂ්‍යයා පෘථග්ජන පුද්ගලයකු වන අතර නිරතුරුවම යක්ෂයා, ලෝකයා සහ මාංශයා යන ත්‍රිවිධ සතුරන්ගේ උපායෙහි ගැලීමෙන් පාපයට ගොදුරු වේ. එවැනි වූ පාපයන් මගින් මිනිසා තම ආත්මය කිළිටි කරගන්නා අතර දෙවි පියාණන් පොරොන්දු වූ පරිදි මරණයෙන් පසු අත්වන සදාතනික ජීවිතය ලැබීමට නුසුදුසු වන්නේ ය. මේ නිසාම උන්වහන්සේ දුර්වල අපට අනුකම්පා කර අවංක පසුතැවීමක් ඇත්තාට සමාව ලබා දෙන බවට පොරොන්දු වූ සේක. ඒ බව ශු. බයිබලය සහ අලුත් ගිවිසුම මඟින් අපට සනාථ කළ සේක.

මරණයෙන් පසුව පාප කිළිටෙන් තොරව දෙවිපියාණන් ඉදිරියට යාමට අප සූදානම්ව සිටිය යුතුය. එසේ නම් අප කවුරුත් මැරෙන මිනිසුන් බවත්, මරණයෙන් පසුව අවසාන නඩුවට පෙනී සිටිය යුතු බවත් නිරන්තරයෙන්ම සිහිපත් කළ යුතුය.

මනුෂ්‍යයාගේ දුර්වලකම දන්නා දෙවිපියාණන් වහන්සේ අපගේ පාපයන්ට සමාව දීමට නිරතුරුවම සූදානම්ව සිටින සේක. (ශු. ලූක් 15:20-24) උන්වහන්සේ වෙත හැරී යන්නේ ද - නොයන්නේ ද යන තීරණය ගත යුත්තේ අප විසිනි. බොහෝ අවස්ථාවල දී උන්වහන්සේම පසුතැවීමේ අවස්ථාව ලබා දෙන සේක. ජීවිතයේ යම් යම් සිද්ධීන් තුළින් එකී අවස්ථා අප වෙත පැමිණේ. බොහෝ විට එම සිද්ධීන් හි පසුතලය බලාපොරොත්තු කඩවීමක් විය හැකිය. සමහර විට සතුටුදායක අවස්ථාවක් විය හැකිය. මෙලෙස කිනම් අයුරකින් හෝ පසුතැවී නැවත තමන් වහන්සේ වෙතට පැමිණීම උන්වහන්සේගේ අභිප්‍රාය වන්නේය. පසුතැවීම අවංක චේතනාවකින් සිදුවිය යුතුය. අවංක පසුතැවීම පව් සමාවේ අඩිතාලමය.

☛ ලබන සතියට

**✍ ඊ. පී. රේමන් සිල්වා**
කලමුල්ල

දෙවියන් හා බැතිබර සංවාද
ප්‍රදීපය

## ජන වන්දනාව

POPE FRANCIS
Sri Lanka 2015

### ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

### විශ්වාසිකයන්ගේ යැදුම් 2014 නොවැම්බර් 02 ඉරුදින දේව මෙහෙයට




- ජේසුස් ස්වාමින් වහන්සේ අඛණ්ඩව හමුවීමේ සහ උන්-වහන්සේ සමඟ සබැඳියාවේ අපගේ අත්දැකීම පදනම් කරගෙන, අප තුළ බැහැපත්කමේ ආකල්පය වර්ධනය කර ගැනීමට ද වර්තමානයෙහි 'ආත්මික රෝගයක්' ලෙස දිස්වන බොරු පුරසාරම් දෙඩීමෙන් බැහැර වීමට ද සත්‍යය සහ ශුභාරංචිය නමැති පව්ව මත අපගේ ජීවිත ගොඩනඟා ගැනීමට ද ඔබවහන්සේගේ ශක්තිය ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.
- ජේසුස් ස්වාමින් වහන්සේ මිනිස් අපගෙන් ඉල්ලා සිටින පරිදි අප සැම දෙනාට ආදරය තුළ එක්සත්ව පවතින්නට ද විශේෂයෙන් ජේසු සමිඳාණන් තම ස්වාමින් සහ ගැලවුම්කාරයාණන් ලෙස පිළිගන්නා අන් කිතුනු සභාවන් සමඟ එකමුතුව ක්‍රියා කිරීමට ද ඔබ තුමන් දිරි ගැන්වීම ලැබෙන පිණිස.... අපි යාච්ඤා කරමු.
- මෙලොව වසන අප සැම සාමය පිළිබඳ උතුම් පරමාර්ථය ප්‍රමුඛ ලෙස හදවතෙහි රුවා ගනිමින් ජාත්‍යන්තර ජන සමාජය විසින් එඩිතර සාමුහික ප්‍රයත්නයන් තුළින් ලොවේ යුද අවි භාවිතය පැතිර යාමට එරෙහි වෙමින් එම යුද අවි භාවිතය අඩු කිරීමට පියවර ගැනීම පිළිබඳ බලාපොරොත්තුව අවධාරණය කිරීමට ද ඔබතුමන්ගේ වරම් ලැබෙන පිණිස .. අපි යාච්ඤා කරමු.
- භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන්ගේ ධර්මදූතික ජීවිතය ආදර්ශයට ගනිමින් ද අපගේ ජීවිතයේ සැබෑ පල දැරීමක් ඇතිවන්නේ දෙවියන් වහන්සේගේ අභිමතය අප ජීවිත තුළ ඉටුවීමෙන් මිස, අප අරමුණු අප ජීවිත තුළ ඉටුවීමෙන් නොවන බව තේරුම් ගනිමින් ද, අපගේ කිතුනු කැඳවීමට අනුව දිරිමත්ව දිවි ගෙවීමට හැකියාව ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.

# ජීවිත වෙනසකින් දේව රාජ්‍යයේ වටිනාකම් පතල කරමු

**පසුගිය සතියෙන්**

දේව රාජ්‍ය ලබා ගැනීමට ක්‍රිස්තුන් වහන්සේ අපට පෙන්වූ ප්‍රේමයට අප උරුමකම් කිව යුතුය. ප්‍රේමය යනු කිමෙක්ද? යන්න අප දන්නේ ක්‍රිස්තුස් වහන්සේ සිය ජීවිතය අප උදෙසා පරිත්‍යාග කළ බැවිනි. ජීවිත වෙනසකට අපද අප සහෝදරයන් උදෙසා ජීවිත පරිත්‍යාග කළ යුතුය. (1 ජොහාන් 3:16) ජීවිත වෙනසකට අපට මඟ පහදා දෙන ලෙස අප දිව්‍ය සත්ප්‍රසාදයේ ජීවමානව වැඩසිටින ජේසු තුමා ලබා ගන්නා සැමවිටම එම වරම පතා යාච්ඤා කළ යුතුය. ශු. ජෝන් ක්‍රිසෝස්තම් තුමා පවසන අන්දමට දිව්‍ය සත්ප්‍රසාදය යනු ''ක්‍රිස්තුන් වහන්සේමය'' එතුමා අප තුළට වඩින විට ජේසු තුමාගේ සිතුම් පැතුම් අපගේ සිතුම් පැතුම් කරගත යුතුය. එතුමාගේ මුළු ජීවිත රටාවම අපගේ ජීවිත රටාව බවට පත් කර ගත යුතුය. දිව්‍ය සත්ප්‍රසාදීය ජේසුතුමා වෙනුවට අන් අය වෙනුවෙන් කැඩීමට, පොඩිවීමට, පරිත්‍යාග වීමට අප ක්‍රියා කළ යුතුය. ජීවිත පරිත්‍යාග කිරීම දේව රාජ්‍යයේ උරුමයක්ය. එම උරුමයට නෑකම් කියන්නට අප කවදා සූදානම් වේද? ''කිසිවෙකු කිසි කලෙක දේව රාජ්‍ය හෝ දෙවියන් වහන්සේ දුටුවේ නැත. එහෙත් අපි එකිනෙකාට ප්‍රේම කරමු නම් දෙවියන් වහන්සේ පමණක් නොව දේව රාජ්‍යයේ උත්තරීතර ගතිගුණ අප තුළ ජීවත් වනු ඇත (ජොහන් 4:12).

06. දේව රාජ්‍ය පැතිරීමට මෙම වටිනාකම් අපට ක්‍රියා දුන් උදාර පුද්ගලයන් සහ සමිති සමාගම්......

i. 1822 ප්‍රංශයේ ලියෝන් නුවර උපන් මාරි පෝලින් ජෙරිකෝ මෙනවිය මෙම සංගමය ආරම්භ කරන ලදි.: යාච්ඤාවට හා පරිත්‍යාගය මඟින් ධර්මදානයට දේව රාජ්‍ය පතළ කිරීමට උදව් කිරීම මෙම සංගමයේ අරමුණයයි.

ii. භූ. පියතුමාගේ ධර්මදූත ළමා සමාජය : 1843 ප්‍රංශයේ නැන්සි නුවර චාල්ස් ෆෝබැන්ද ජැක්සන් රදගුරුතුමන් විසින් ආරම්භ කරන ලද ළමා සමාජය කුඩා දරුවන්ගේ පිරිහී ගිය කිතුනු දිවිය නැවත පෝෂණය කරන්නටත්, කිතු සමිඳුන් පිළිබඳව ගැඹුරට හදාරන්නටත්, ඒ තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් හඳුනාගැනීමින් ජීවිත රටාව වෙනස් කර ගන්නටත් උදව් වේ.

iii. ශු. පේදුරු තුමාගේ ධර්මදූතසංගමය සහ ශු. පියතුමාගේ පැවිදි සංගමය : පූජක පුතුන්ගේ ආධ්‍යාත්මික ජීවිත දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් කරවන්නටත්, දේව රාජ්‍යයේ වටිනාකම් හරියාකාරව වටහාගෙන ඒ තුළින් ජීවන රටාව තේරුම්ගත්, දේව රාජ්‍යයට සේවය සඳහා පූජක පුතුණුවන් බිහි කිරීමටත් මෙම සංගම් මඟින් සිදුවේ.

07. ජීවිත වෙනසකින් දේව රජ්‍යයේ වටිනාකම් පතළ කරන්නට නම්.....

අසීසියේ විසූ ශු. ෆ්‍රැන්සිස් තුමාගේ ජීවන රටාව ගැයෙන මෙම ගීතිකාව අපගේ ජීවිත තේමාව කර ගැනීමට අප වෙර දරමු.

''සාමයේ මිහිර බෙදා දෙන්නට ලෝකේ පුරා
සමිඳුනි මා ඔබගේ දෑතේ ආයුධයක් වේවා

වෛරය අසමඟි තැන් සොයලා
ප්‍රේමය සමඟිය එහි යොදලා
විශ්වාසය මඳ තැන් සොයලා
බලාපොරොත්තුව ඇති කරමු

ශෝකය ඇති සැනසුමලා - අඳුරු තැනට අලෝකයලා
සොවින් පිරුණු තැන් මකා දමා - සොම්නස අපි එහි

ඇති කළ තරමට සැනසුම් අප පතනවට වඩා අනුන්ව නිතරම සනසන්නට හැකි නම්, තේරුම් ගනු ලබනවාට වඩා සහෝදරයන්ව තේරුම්ගෙන ජීවත්වන්නට හැකියාවක් ඇත්නම් - ඒ අනුව අප ජීවිත දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් කරවමින් දිනක සමිඳුන්ගේ කුඩාරමට ඇතුළුවන්නට පිහිට අයැද යැදුම් යදිමු දෙවිඳුන් සැමවිට, සැමකල.

✍ **ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**
හාල්දඬුවන - දන්කොටුව

# මළවුන්ගේ දා ජීවතුන්ගේ භාවනාව

ඉපදෙන සැවොම දිනක මියයන බව අමතකව සිටින මිනිසාට මරණය පිළිබඳ සිහිපත් කරවීම ''මළවුන්ගේදා'' නිතැතින්ම සිදුවේ. මෙම දිනයට තවත් වටිනාකමක් ලැබෙනුයේ, ජීවත්ව බොහෝ අය මෙදින දිවය පූජාවකට සහභාගිවීම, යාච්ඤාවකට යොමුවීම හා මළාවූ අය වෙනුවෙන් දානයක් දීමටද යොමුවන බැවිනි. මේ සියල්ල යහපත්ය. එහෙත් මේ සියල්ල තුළින් ජීවත්වන අය සමිඳාණන් වෙත ළඟා කරවන්නටත්, සමිඳාණන්ගේ ප්‍රේමයෙහි පවතින්නටත් පොළොඹවන්නේ නම් එය ඊටත් වඩා යහපත්ය. සැමදෙන භාවනාවකට යොමුකරවන මහා සත්‍යයක් මේ තුළ ඇත. එනම් තවත් මරණයට කොතරම් අකමැති වූවත්, තමන් මරණයට කොතරම් බිය වූවත්, තමන් නොදන්නා, නොසිතූ මොහොතක මරණය සිදුවිය හැකි බව පසක්වීමයි. එදිනෙදා ජීවිතයේ දී මෙන් නොව ''මළවුන්ගේදා'' මේ සිතිවිලි උඩුසිත යටිසිත දක්වා ගෙනයනු නිතැතිණි.



එහෙත් ඒ සියල්ලෙන් හිස්වී ශුද්ධාත්මයාණන් වහන්සේ වැළඳ ගැනීමෙන්, නව මිනිසත්බව ලබාගන්නට එතුමාණෝ මෙහෙයවන සේක. මිනිසා ශුද්ධව හා නොකැලැල්ව ජීවත්විය යුතුය යන දෙවිඳුන්ගේ බලාපොරොත්තුව ඉටුකරනු වස් තමන්ගේ ඇතුළාන්තය සෝදිසිකර බැලීමේ භාවනාවකට මෙදින ඇතුළුවීම මහත්සේ ඵලදායකය. එවිට අවංක පසුතැවිල්ලෙන් හා යැදුවෙන් ලබාගත හැකි දේවදරුකම තමන්ට උරුමවනු ඇත. මක්නිසාද මළාවූ අය වෙනුවෙන් යදින්නට පෙර තමා සිටිනා මඩ වලෙන් ගොඩවී පිවිතුරු මාවතේ ගමන් කළ යුතු නොවේ ද?

✍ **නිමල් වාස්** - ඇත්ගාල

# ඉවසලා ඉවසලා බැරිම තැන ඉවසිය යුතුම තැනයි...

**දියණියකගේ ආවර්ජනා**

ජීවිත ගමනේ එක් නවාතැන්පලක් වන පාසල් දිවිය ගත කරන මා හට පසුගිය දිනක අහම්බෙන් වගේ නොසිතූ විලසට එක් පුද්ගලයෙක්ව මුණගැසුණි. ඔහු කවුරුන්ද? කොයිවගේ පුද්ගලයෙක් දැයි කිසිත් මා හරිහැටි නොදත් නිසා මගේ කාලයෙන් බික් ඔහු වෙනුවෙන් වැය කර ඒ පුද්ගලයා හා මොහොතක් කතා කරන විටයි මට තේරුණේ ඒ තැනැත්තා ජීවිතේ කඩා වැටෙන්නට පුළුවන් ගැඹුරුම අගාධයකට මේ වන විටත් වැටිලා ඉවරයි කියන ඇත්ත කතාව.

ඒ වැටීමට, ඒ පසුබැසීමට හේතු වෙලා තියෙන්නෙත් හිතට මහා දුකක් දැනෙන, වචනවලින් ඒ දුක කියා ගන්නට බැරි, ඒත් කඳුළු වලින් ඒ වේදනාව පිටවෙන අයුතු චෝදනා, ගැරහුම්, ප්‍රතික්ෂේප කිරීම්, හෙලා දැකීම්, තමන් නොකළ වරදකට අපහාස විඳීමට සිදුවීම, තමන්ටම කියලා හිටපු අය තමන්ගෙන් ඈත් වීම හා සමාන වූ ඉවසා ගැනීමට නොහැකි ජීවිත අභියෝග, කටුක අත්දැකීම් කියලා මං තේරුම් ගත්තේ ඒ පුද්ගලයා පැවසූ කරුණු කාරණාවලින්මයි.

ඉතිං මේ ලිපිය කියවන ඔබ සිතයි මා කුමකටද එවැනි අහම්බෙන් හමු වූ පුද්ගලයෙක් පිළිබඳව ඔබ හා බෙදා ගන්නට මේ සූදානම් වෙන්නේ කියලා. මා හට ඔහු කෙරේ යම්කිසි විශේෂත්වයක් ඇති වුණේ ඔහුට උරුම වී ඇති වේදනාබර ජීවිතය හරිම පුදුමාකාර නිසයි. මේ පුද්ගලයා තුළින් මම ජේසුව දුටුව නිසයි. ඒ අපි හැමදාමත් දකින ප්‍රශංසාත්මක, නැතිනම් ප්‍රාතිහාර්යාත්මක ජේසු සමිඳුන් නොවේ. කුරුස ගමන තුළ දුක් වේදනා විඳපු, ගැරහුම්, බැනුම් අපහාස වලට ලක්වුණු, පීඩිත වූ ජේසුස් වහන්සේවයි.

එදා කල්වාරි ගමන තුළ ජේසුස් වහන්සේට විඳීමට තිබෙන ලොකුම අපහාසය විඳීමට සිදුවුණා. අපිටත් අපේ ජීවිත හමුවේ එවැනිම වූ අපහාසාත්මක චෝදනා එල්ල වන්නට පුළුවනි. අපි සැමවිටම තීන්දු තීරණ ගන්නවා. නමුත් ඔබට එවිට අමතක වුණු දෙයක් තියෙනවා. ඒ තමයි තීරණයක් කියන්නේ හැමවිටම සතුට හා දුක කියන මේ දෙකම එක හා සමානව ගැබ්වුණු දෙයක් කියන එක. අපේ මේ මිනිස් ජීවිතෙත් යම්කිසි ආකාරයක එක් තීරණයක්. සරළවම කිවහොත් දෙවියන් වහන්සේගේ තීරණයක්. අපේ ජීවිතේට පැමිණෙන සැම සතුටකදීම වගේම දුකකදීත් ඒ වේදනා දරාග න්නට කතෝලික අපට ශක්තිය තිබිය යුතුයි. අපි ජේසු සමිඳුන්ට ඇබ්බැහි වුවහොත් ඒ සැම දෙයක්ම අපට දරා ගන්නට පුළුවනි.

යම් කිසි ගැටලුවක් හෝ වේවා දුකක් හෝ වේවා ඇති වූ පසුව අපි කවුරුත් පවසන්නේ ඉවසලා ඉවසලා බැරිම තැන තමා අපි ජීවිතේ ගැන අසුබවාදිව සිතන්නේ කියා. ජේසු සමිඳුන් අපිව අතහැර ඇති බවක් සිතන්නේ කියා. ඉවසලා ඉවසලා බැරිම වූ මොහොතේ දී තමා අන් අය කෙරේ කෝප වෙන්නේ කියා. නමුත් සැදැහැවතුනේ මා හට හැඟෙන දැනෙන හැටියට නම් ඉවසලා ඉවසලා බැරිම තැනයි ඉවසිය යුතුම තැන වන්නේ. මා ඉහතදී ඔබට ප්‍රකාශ කළ තැනැත්තාට සමාන වූ තවත් බොහෝ අය ඔබ අතරත් ඉන්නට පුළුවනි. හැරෙන්න ඔබේ ජීවිතය දෙසම හැරී බලන්න.

ඔබ මෙහොතකට මෙනෙහි කර බලන්න ඔබ සැමවිටම කතා කරන්නේ ප්‍රාතිහාර්ය සිදුකරන, වරප්‍රසාද ලබා දෙන ජේසු සමිඳුන් ගැන විතරයි. නමුත් මං අද ඔබ හා කතා කරන්නේ එදා අපි වෙනුවෙන් දිවි පුදන්නට ගිය ගමනේ දී පීඩාවට පත් වූ ජේසුස් වහන්සේ පිළිබඳවයි. බලන්න එතුමා කොයි තරම් නම් ඒ මොහොතේ ඉවසන්නට ඇති ද? එතුමාට ඕන තරම් හැකියාව තිබුණා ඒ නිමේෂයේදී තමන්ට බොරු චෝදනා නගන්නන්ට විරුද්ධව තම බලය යොදා ගනිමින් ඔවුන් විනාශ කර හෝ දමන්නට. නමුත් එතුමා සිදු කළේ ඉවසලා ඉවසලා බැරිම තැනදිත් ඉවසීමොන් කටයුතු කිරීමයි. ජේසු සමිඳුන්ගෙන් මරියාණන් දෙසට අපි හැරුණොත් එහිදිත් අපට දකින්නට ලැබෙන්නේ ඒ ඉවසීමයි. එදා මරියාණන්ට සිදු වූ ප්‍රාතිහාර්යාත්මක ජේසු සමිඳුන් උපත වර්තමානයේ දී මවකට සිදුවුනි නම් කෙසේ ක්‍රියා කරයි ද? එහෙත් එදා මරිය තුමී තමන්ට පැමිනි හැම ප්‍රශ්නයක් ම දෙවිඳුන් තුළ විශ්වාසයෙන් යුතුව රැඳී සිටිමින් ඉවසීමෙන් දරා ගත්තා. අන්න එතැනයි ඔබට මට අමතක වුණු තැන. ඒ තමයි ඉවසලා ඉවසලා බැරිම තැන ඉවසිය යුතුම තැන කියන සත්‍යය.

ඒ නිසාම නේද ඔබට මට පැමිණෙන වේදනා හමුවේ අපි කඩා වැටෙන්නේ, වැලපෙන්නේ, තමන්ව හෙළා දකින්නන්ට එරෙහිව කටයුතු කරන්නේ. එදා ජේසු සමිඳුන් තමන්ට ලැබුණු අනිසි චෝදනා වලට කිසිවෙකුට වරදක් කීවේ නැත. එතුමා ඒ දේ ඇසුවේ තම පියාණන්ගෙන්මයි. එනම් "පියාණනි ඔබ මා, අත් හැරියේ මන්ද?" යන්නයි. මෙන්න මේ වදන ඔබේ මනස තුළත් නිතරම රැඳෙනවා විය හැකිය. නමුත් ඔබ කිසි විටෙක අමතක කරන්නට එපා ඒ වේදනා තුළ ඔබට මට ළං වෙන්නේ අපගේම ආදරණීය දෙවියන් වහන්සේ කියන යථාර්ථය.

කිතුනුවන් සැටියට අප කළ යුත්තේ අපට පැමිණෙන වේදනා, බොරු චෝදනා, අයුතු ප්‍රහාර මේ සියල්ලක්ම සතුටින් බාරගෙන සතුට, කඳුළු මේ දෙකම මිනිස් ජීවිතයට උරුම වීමේ යථාර්ථය තේරුම් ගැනීමයි. ඔබට යම් විදිහකින් එය තේරුම් ගත නොහැකි නම් පැමිණෙන්න ජේසු සමිඳුන් වෙතට. අවනත වී එතුමාව වැළඳගන්න. ඔබට අමතක වුනු ඒ තැන ඉවසලා ඉවසලා බැරිම තැන ඉවසිය යුතුම තැනයි යන වදන සිහියේ තබා ගන්න.

✍ **කේ. ඒ. නිම්නාදි රොද්‍රිගු**
සිරිකුරුස විදුහල - ගම්පහ

# සුදුතුම් පියාගේ ලංකා ගමන මීගමු පාරෙන් විය යුතුයි

**කතුතුමනි,**

ඔක්තෝබර් මස 12 වන ඉරුදින ජනතා හඬ තීරයේ කඩලානේ සුමිත් මාර්ක් ද සිල්වා මහතා විසින් 'සසුන් පියා අධිවේගි මගෙහි ආවොත්' ලිපිය හා බැඳේ. ප්‍රථමයෙන් ඒ මහතාට අතීතය මඳකට සිහිගැන් වීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම කාදිනල් ධූරයට ඔසවනු ලැබූ තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් එම ධූරය ලබා ලංකාවට පැමිණි අවස්ථාවේ දී කොළඹට ගමන් කළේ මීගමු පාර ඔස්සේය. ඒ අතරට අතිඋතුම් 2 වන ජුවාම් පාවුළු සුදුතුම් පිය ාලංකාවට සැපත් වී කොළඹට ගමන් කළේ ද මීගමු පාර ඔස්සේය. වත්මන් අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ද කාදිනල් ධූරයට ඔසවනු ලැබූ පසු ලංකාවට පැමිණ කොළඹට පැමිණියේද මීගමු පාර ඔස්සේය. එම අවස්ථා තුනේ දීම කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයක් නොතිබුනි.

එහෙත් 20-20 ලෝක කුසලානය දිනූ ශ්‍රී ලංකා කණ්ඩායම කටුනායක ගුවන් තොටුපලේ සිට කොළඹට ගමන් කරනු ලැබුවේ ද අධිවේග මාර්ගයේ නොව මීගමු පාර ඔස්සේය. කිතු බැතිමතුන් විශාල සංඛ්‍යාවක් වෙසෙන කොළඹ - මීගමු පාර ඔස්සේ සසුන් පියා කැඳවා ගෙන ඒමට සභා නායකයන් දැනටමත් තීරණය කර ඇති බවත් ඒ මහතාගේ ලිපියේ සඳහන් වේ. අධිවේග මගට ගමන් කොට සුදුතුම් පියා දැක බලා ගැනීමට වඩා මීගමු පාරේ සිට එතුමා සියැසින් දැක බලා ගැනීම සැදැහැවතුන්ට වඩාත් පහසු කාර්යයකි. ශ්‍රී ලංකාවේ සුන්දරත්වය හෝ ස්වභාවික අලංකාරය බලා ගැනීම එතුමාගේ ශ්‍රී ලංකා ගමනේ අරමුණ නොවන අතර, භාග්‍යවන්ත ජුසේ වාස් මුනි සුදුවරයට එසවීමේ කාර්යය එතුමාගේ මෙම ශ්‍රී ලංකා ගමනේ මූලික අරමුණ වේ.

**ක්ලැරන්ස් ලෙනාඩ්**
කැළණිය

# කතෝලික ධර්මෝපදේශ දෙකක්!



**කතුතුමනි,**

කතෝලික දෙව්මැඳුරක් ඉදිරිපිට මාර්ගය අබියස තනා ඇති ශු. අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාවකි. මෙම ප්‍රතිමාව අසලට ගෙනවුත් දමන දැ අතර කැඩී බිඳී ගිය කිතුනු ආගමික ප්‍රතිමා හා පින්තූර ද වේ.

ඒ අතර කිතුනුවන් විසින් මිථ්‍යාදෘෂ්ටික දෙවි දේවතාවුන් හා 'යකුන්' වශයෙන් හඳුන්වනු ලබන හින්දු ආගමික ප්‍රතිමා හා පින්තූරද දක්නට ලැබේ. මේ පිළිබඳව විපරම්කර බැලීමේදී, ද්‍රවිඩ කිතුනු බැතිමතුන් විසින් මේවා මෙහි දමායන බැව් දැන ගන්නට ලැබුණි. තවදුරටත් මේ පිළිබඳව සොයාබැලීමේදී තමන්ගේ නිවෙස්වල හා ව්‍යාපාරික ස්ථානයන්හිදී ද්‍රවිඩ කිතුනු බැතිමතුන් විසින් කිතුනු ආගමික ප්‍රතිමා අතරට හින්දු ආගමික දේව ප්‍රතිමා හා පින්තූරද තබා වන්දනාමාන කරන බැව් දැනගන්නට ලැබුණි. කිතුනු ධර්මෝපදේශයේ සඳහන් අන්දමට නම් කිතුනුවනට ඇත්තේ එකම සර්බලධාරි දෙවිකෙනෙක් පමණෙකි.

**පී. ඩී. එච් වින්ස්ටන් පෙරේරා** - කොලොන්නාව

# සුදුතුම් පිය ආගමනයයි. ජනපතිවරණයයි වාස්පිය සුදුවරයයි

**කතුතුමනි,**

ඉදිරි මාස දෙක තුන තුළ ශ්‍රී ලාංකික ජනතාවගේ සුවිශේෂී අවධානයක් යොමු වන කරුණු තුනක් ලෙස සුදුතුම් පිය අගමනය ජනපතිවරණය සහ වාස් පිය සුදුවරය සඳහන් කළ හැක්කේය. ඒ අතර දේශපාලන වාසි ලබා ගැනීමේ ඉඩ කඩක් ද මතුවන්නා සේම මහින්දට බැරිද යන මතවාදයක් ද පොදු අපේක්ෂක රංගනයක්ද ඉස්මතු වී ඇත්තේය.

මැතිවරණ තබා පළාත්, ප්‍රාන්ත මැතිවරණ වලදීත් පූර්ව සහ පශ්චාත් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවන අප රටේ සාමකාමී පරිසරයකට ඉඩක් නොමැති බව අතීතය සාක්ෂි දරන්නේය. තතු දත් ආරංචි වලට අනුව මැතිවරණ සමයක සුදුතුම් පිය ආගමනයත් සිදු නොවන බව කියවෙයි.

මෙහිදි මැතිවරණ දිනය නක්ෂත්‍රය අනුව තීරණය කරන බව ජනමාධ්‍ය වාර්තා කර ඇති අතර එය අප විශ්වාස නොකළත් බලධාරින්ගේ විශ්වාසය එය වන්නේය. එතනදි ඇති හිඩැස වන්නේ ප්‍රතිවාදි ජනපති අපේක්ෂකයන්ගේ නක්ෂත්‍ර පිළිගැනීමට ඉඩක් නොමැති වීමය. මෙවන් තත්ත්වය හමුවේ සුදුතුම් පිය ආගමනය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් ඇති බව ජනමාධ්‍ය වාර්තා කර ඇත්තේය.

අපගේ අදහස වන්නේ මේ තත්ත්වය හමුවේ ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකික ජනතාවට සුදුතුම් පියාණන් පියවි ඇසින් දැක බලාගැනීමට ඇති අවස්ථාව අහිමිවීමය. මුදල් වැය කිරීමට හැකි අයට පවා වතිකානයට ගියද සුදුතුම් පියාණන් දැක ගැනීමට අවශ්ථාව නොලැබීම මෙහිලා සඳහන් කළ යුතු එසේම වසර ගණනාවක සිට භාග්‍යවත් ජුසේවාස් පියතුමන් සුදුවරයට ඔසවා දැක බලා ගැනීමට ඇති අවස්ථාවද අහිමිවීමය. එය රෝමයේදී සිදු කළ හොත් ඇති හැකි සුවිශේෂී පිරිසකට හැරෙන්නට ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකික කතෝලික බැතිමතුන්ට එම අවස්ථාව අහිමි වන්නේය. අපි දේව සැලැස්ම හමුවේ නොසැලි සිටිමු.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර

# දෙවිඳු වැඩසිටින සැබෑ කිතුනු නිවාස තුළින් හෙනහුරා පැල දොරින් පලායයි

**කතුමනි,**

2014 ඔක්තෝබර් 05 වැනිදා 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත් පතේ 'පහන් කැදැල්ල' තීරයේ වැලිවිට එම්. ජෝ. පාරිස් මහතා විසින් ලියන ලද 'හෙනහුරාගේ පාත්‍රයට වැටෙන්නේ සැබෑ කිතුනුවෝද?' යනුවෙන් වූ ලිපිය කිතුනු අප කොයි කව්රුත් කියවිය යුතු අර්ථාන්විත එකකැයි මට හැඟේ.

සිංහල පුවත් පතක් සමග නොමිලයේ බෙදා හරින ජ්‍යොතිෂ අතිරේකයක පිටුවක් පුරා පළකර තිබූ 'කිතුනු ඔබගේ සෙනසුරු ඒරාෂ්ඨක අපලයට පිළියම්' යනුවෙන්වූ ලිපියට පිළිතුරු ලිපියක් වශයෙන් පාරිස් මහතා ඉහත ශීර්ෂය යටතේ තම පැන හසුරුවා තිබුණි.

එයට තුති! බොහෝ කාලයක සිට කිතුනු ලබ්ධික වැඩි පිරිසක්, අතිරේකයේ පළකර තිබූ ලිපියේ ලියුම්කරුගෙන් ඉල්ලා සිටි පරිදි එම ලිපිය සකස් කරන ලද බවත් එයින් බේරීම සඳහා කළයුතු ප්‍රතිකර්මද යස රඟට පහදා දී තිබූ බවත් පාරිස් මහතා 'ප්‍රදීපය' හරහා කියයි.

මුදල් හදල් යහමින් තිබේනම් පුවත්පත්වල අතිරේකවලට පිටු ගණනින් දැන්වීම් දමන්නට, ලිපි ලියන්නට කාගෙන්වත් තහංචියක් නොමැත. කුමන භාෂාවකින් ලිපි, දැන්වීම් පළවූවත් මාධ්‍ය පිළිබඳ අපට ප්‍රශ්නයක් නැත. එහෙත් වැරැදි 'වචන' ශීර්ෂ පාඨ සඳහා යොදා පළකිරිම එතරම් සුබවාදි යයි මට නොසිතේ. මේ ලිපිය ලියන මාද කිතුනුවෙකි. සමස්ත කිතුනු ජනතාවම උපත ලබා, මුලින්ම ලබා ගන්නා ප්‍රසාද නිධානය වන්නේ 'ප්‍රසාද ස්නාපනයයි.' 'මොළකැටි දරු පැටියා' දෙව්මැඳුර වෙත ගෙන ගොස් විශේෂ මණ්ඩපයක් ඉදිරියේ ආත්මික දෙමව්පියන් යුවළ දරුවාගේ මවුපියන් ඥාති සහෝදර කැළ පිරිවරා දෙවි සමිඳු ඉදිරියේ පොරොන්දු වන්නේ පාපයේ අන්ධකාරය, සියලු නපුරු බලවේග මෙන්ම සාතන් පරාජය කරන බවය.

මෙම 'ප්‍රසාද නිධානය' තුළින් දරුවා දෙවිඳුට කැප කරනු ලබයි. දෙවි මහෝත්තමයාණන්ට වඩාත් ප්‍රසන්නව ජීවත්වීමේ වරම එතැන් සිට කිතුනු අපට හිමිවේ. ශුද්ධාත්ම වරමින් ඔහුගේ හෝ ඇයගේ පැවැත්ම දෙවි පියාණන්ගේ කැමැත්තට වඩාත් අනුකූලවූ විට හේ වඩාත් පාරිශුද්ධ වී ආනන්දය, ශාන්තිය ඵල ලබන්නේය. ශුද්ධාත්ම ඵල ලබාගන්නේය.

පෙර භවය සහ සසර ගැන කිතුනු අප තුළ විශ්වාසයක් නොමැත. හෙනහුරු අපල, බහිරව දෝෂ, ග්‍රහ අපල අපට උරුම නැත. උරුම නැති දෙයක් ගැන කථා කිරිම හෝ වචන නාස්ති කිරිම නිෂ්ඵල ක්‍රියාවකි.

පාරිස් මහතා ලිපියේ තැන් කිහිපයක කිතුනු සිද්ධි කිහිපයක් දක්වා තිබේ. එම සිදුවීම් පිළිබඳ අපසිහිබුද්ධියෙන් බැලුවොත් හරිම වේදනාත්මක, කණගාටුදායක තත්ත්වයක් සිතට නැගේ. දේව කැමැත්ත වෙනුවට නක්ෂත්‍රකරුවකුගේ පිහිට සොයන්නට යෑම 'රෑ වැටුණු වලේ දවල් වැටුණු මිනිසකුට සමානය.

කිතුනු බව නමට පමණක් තබා ගන්නා බොහෝ පිරිස් මිථ්‍යා විශ්වාස කෙරෙහි දක්වන ඇල්ම, සැලකිල්ල අප සමාජය වට පිටාවෙන් මොනවට පැහැදිලිවේ. යටි හිත්වල එකක් තබාගෙන ඉරුදින දිව්‍ය පූජාවට පවා සහභාගිවෙන සමහර කිතුනු ලබ්ධිකයන් නොසිටිනවා නොවේ.

**වින්සන් ලියනගේ**
ඈතගම

# කාරුණික ඉල්ලීමක්!


**කතුතුමනි,**

කතෝලික සභාව තුළ දේව මාතාවන් වෙත ඇත්තේ ඉතා උතුම් වූත් ගෞරවාන්විත වූත් භක්ත්‍යාදරයකි. සමස්ත ශු. සභාවෙම මාතාව වන දේවමාතා වහන්සේට ඇති ගෞරවාදරය නිසාම මුළු ලොව පුරා විසිරී ස්ථාපිතව ඇති දේවස්ථාන සහ සිද්ධස්ථාන අතරින් මරිය මව් ශුද්ධවූ ාමයට කැපකර ඇති ප්‍රමාණය අති විශාලය. ශ්‍රී ලංකාව තුළද එතුමිය නමට කැපකර ඇති සිද්ධස්ථාන හා දේවස්ථාන අතර කඳාන හපුගොඩ සා. මරියා දේවස්ථාන ද කතෝලික ජනතාව එක්රැස් කර ගරු බුහුමන් දක්වන ශු. භූමියකි.

පසුගිය මාස කිහිපය තුළ හපුගොඩ ශා. මරියා දේවස්ථානය අසලින් ගමන් ගන්නා විට දුටු දසුනෙන් සිතෙහි ඇති වූ තත්ත්වය නිසාම මෙම ලිපිය ඉදිරිපත් කිරීමට පෙළඹුණි. ඒ මන්දයත් හපුගොඩ සා. මරියා දේවස්ථානය අසලම පිහිටි සත්ත්ව මාංශ අලෙවි සැල හේතුවෙනි. දේවස්ථාන භූමියක් අසල මෙවැනි ස්ථානයක් පවත්වාගෙන යෑම දේවස්ථානයක ගෞරවයට හා ශුද්ධවත් බවට හානියකි. තවද අන්‍යාගමික ජනයා තුළ ද මෙවැනි දසුනක් දැකීමෙන් අප කතෝලික ආගම සහ භක්තිය කෙරෙහි අප්‍රසාදාත්මක ආකල්පයක් ජනිත වීමටද ඉඩකඩ ඇත.

මිනිසුන් වශයෙන් ජීවිතයට මුහුණ දීමට හා තම ආර්ථික තත්ත්වය ගොඩනගා ගැනීමට කිසියම් වෘත්තියක නියැලීමට සිදුවීම සත්‍යතාවයකි. ඉහත සඳහන් කළ අයුරු සත්ත්ව මාංශ අලෙවි සැලක් පවත්වා ගෙන යෑමද ජීවිත සටනට මුහුණ දීමට සිදුකරන්නාවූ ජීවනෝපායකි. දේවස්ථානයක් අසල එවැනි ස්ථානයක් පවත්වාගෙන යෑම යෝග්‍ය නොවේ යැයි සිතමි. එබැවින් මේ කරුණු සලකා බලා දේව මාතා වහන්සේට කරන ගෞරවයක් ලෙස මේ පිළිබඳව සිතා බලන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර මෙම අදහස් දැක්වූයේ කිසියම් පුද්ගලයෙකුගේ ජීවිකාව හෝ කිසියම් පුද්ගලයකු අපහසුතාවයට පත්නොකිරීමට බව කාරුණිකව සහ ගෞරවයෙන් යුතුව සටහන් කරමි.

**නලින් ප්‍රසන්න**
කඳාන




# අසීමිත තණ්හාවට සැනසුමක් නැත

**කතුතුමනි,**

අසීමිත තණ්හාව හේතුවෙන් මිනිසුන් දුකට දොම්නසට පරිහානියට පත් වෙයි. මේ වග ආගමික ශාස්තෘන් වහන්සේ දේශනා කර දායාද කළ සනාතන දහම තුළින් මනාවට පෙන්වා දී ඇත.

නමුදු මෙම නූතන සංකීර්ණ සමාජය තුළ ජීවත්වන බහුතර පිරිසක් පිටතින් පෙනෙන බැබලෙන පරිහරණයන්ට මුලාවී තමන් සන්තක දේ පවා අහිමි කර ගන්නා අමිහිරි සිදුවීම් එමටය.

මේ පිළිබඳව විවිධ සන්නිවේදනයන් මගින් ප්‍රජාව දැනුම්වත් කළද තණ්හාවේ උත්සන්න කම නිසා වංචාකාර ජාවාරම් කාරයන්ගේ දිළිසෙන වහසි බස්වලට රැවටී මුලාවී කටයුතු කරන සෙයක් පෙනේ. එම නිසා මෙම සංකීර්ණ සමාජය තුළ ජීවත්වන අප වචනයට, පිටතින් පෙනෙන පෙනුමට අනුගතව අඥානයෙකු නොවී ඇතැම් විට අනවශ්‍ය දේ සතුකර ගැනීමට තමන් සතු දේ අහිමි කර නොගෙන අසම මෝහයෙන් තණ්හාව මුලාව දුරු කර පැවතීමට වගබලා ගැනීම යෙහෙකි.

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

# මනු ලොවින් චුත වී
## සොහොන් පොලක සිට ලියමි !



මා මනුලොවින් සමුගත්තේ රෝහලේ දීය. මා රෝහලට ගෙන ගියේ මගේ පරම සතුරා යයි මා සිතා සිටි අල්ලපු ගෙදර ෆොන්සේකා මහතාය. ෆොන්සේකා මහතා අප නිවස අසලට පැමිණි දා සිට ඔහුට මා කොතරම් වෙනස්කම් කළේ ද? ඔහුගේ ඉඩමෙන් පැල ඉනි වැට වෙනස් කර අඩි කිහිපයක්ම මාගේ ඉඩමට යා කර ගැනීමට කටයුතු කළ සැටි එකවරම මට සිහිවිය. ඔහු මා දුටු විට කට පුරා සිනා සී සුහදශීලී බවක් පෑවත්, අහක බලාගෙන හැමවිටම මා එය ප්‍රතික්ෂේප කළෙමි. නමුත් මා හදිස්සියේ රෝගාතුර වූ විට මගේ බිරිඳගේ විලාපයෙන් වහා පැමිණි ඔහු, ඔහුගේ මෝටර් රථයෙන් මා රෝහල වෙත ගෙන ගියත් මට නැවත ජීවත් වීමට වරම් ලැබුණේ නැත. ඔහු කොතරම් ගුණගරුක අසල්වැසියෙක් ද?

මගේ දේහය වට කරගත් මගේ බිරිඳත්, දරුවනුත් නගන විලාපය දැක මට ඇති වූයේ ඉසිලිය නොහැකි තරම් වූ ලැජ්ජාවකි. ඔවුන්ගේ විලාපයත් සමග මාගේ ගුණ හඬ නගා කියන්නට විය. මා ගුණ දම් ඉටුකළ ස්වාමි පුරුෂයෙක් ද, යුතුකම් ඉටුකළ පියෙක් ද, මා කළ ද්‍රෝහිකම් සියල්ල අමතක වී ගොසිනි. බීමත්ව ගෙදරට ගොඩවදින මම කොතරම් නම් ඔවුන්ට හිරිහැර කර ඇත්ද? නින්දා අපහාස කර ඇත්ද? සමාජය ඉදිරියේ මා පෑවේ වෙනස් වෙනස් මුහුණකි.

ජීවිතය කුමක්දැයි කිසිවකු දැන සිටියේ නැත. දේවස්ථානයේ දී පියතුමා පුංචි දේශනාවක් කරමින් මා ගැන කළේ කදිම ගුණ වර්ණනාවකි. මාගේ සැබෑ තත්ත්වය පියතුමා දැන සිටියේ නැත. සුසාන භූමියේ දී මා ගැන කිහිප දෙනෙක්ම කදිම ගුණ කථනයන් කළහ. මාගේ ආත්මය ලැජ්ජාවෙන් මිරිකෙමින්, ගසින් ගස කොළ අතුවල රැඳෙමින් බලා සිටියේය.

සියල්ල අවසන් විය. පැමිණි සියළුම නෑදෑ හිතවතුන් කනත්තෙන් බැහැර ගොස්ය. ගොම්මන් අඳුර ලොව වසා ගැනීමට උත්සහ දරන මොහොත මෙය විය. මම කනත්ත පුරා සැරිසැරුවෙමි. මා අඳුරන සුහදයන් කවුරුවත් ඇද්දැයි සොයා බැලුවෙමි. උන් බොහෝ දෙනා දෙවිඳුන් විසින් කැඳවා ඇත. මා අපාගත වන මොහොත තවම පැමිණ නැත. නිහඬව වාඩි වී කල්පනාවේ යෙදුණෙමි. ජේසු සමිඳුන්ගේ වචනය මා තුට්ටු දෙකකට ගණන් ගත්තේ නැත. මැරෙන වගක් කිසි විටක සිතුවේ නැත. කොතරම් පල්ලි ගියත්, කොතරම් දිව්‍ය පූජාවලට සහභාගි වූවත් පියතුමා විසින් කරන ලද දේශනා ගැන කිසිම තැකීමක් මා කළේ නැත.

මගේ යහළුවන්ටත්, දරුවන්ටත්, බිරිඳටත් මා තබන්නට යන දුක්ඛ සාගරය ගැන කියා දෙන්නට මගක් නැති ද? ජේසු සමිඳුන්ගේ ගමන් මගේ ගමන් කොට දැහැමි ජීවිතයක් ගත කරන්නට ඔවුන්ට කියා දීමට මට මගක් නැත්ද? මා ඔවුන් හට මේ පණිවිඩ නොදුන්නොත් ඒ හැම දෙනාම මා මෙන්ම අපාගත වනවාට කිසිදු සැකයක් නැතත පියතුමා දිනක් කළදේශනාව මට සිහිපත් විය. අපා ගත වූ ධනපතියා හා ආබ්‍රහම් අතර ඇති වූ කථාව මා කොතරම් අසා ඇත් ද? මා ඊට කන් දුන්නේ නම් මෙසේ අපාගත වීමට සිදුවන්නේ නැත. ආබ්‍රහම් හා ධනපතියා අතර වූ කතාව මගේ මනසට නැගේ.

ඔහු ආත්ම භවනෙහි වධ විඳිමින්, ඇස් ඔසවා ආබ්‍රහම් ද ඔහුගේ තුරුල්ලේ උන් ලාසරස් ද දුරින් දැක, මොරගසා ''ආබ්‍රහම් පියතුමෙනි, තම ඇඟිලි තුඩ දියේ ගිල්වා, මාගේ දිව තෙමාලන පිණිස, ලාසරස් එවනු මැනව, මන්ද මම මේ ගිනි ජාලාවේ දහ දුක් විඳිමි කීය. එහෙත් ආබ්‍රහම් පිළිතුරු දෙමින්, පුත්‍රයා, ඔබ ජීවත්ව සිටිය දී හැම සැපත ම ඔබට තිබුණු බවද, එලෙසම හැම විපත ම ලාසරස්ට තිබුණු බවද, සිහි කරන්න. එහෙත් දැන් ඔහු මෙහි සැනසිලි බවයි. ඔබ දහ දුක් විඳින්නෙහිය. එපමණකුත් නොවේ, මොබින් ඔබ වෙත යාමට වත් ඔබින් අප වෙත ඒමට වත් කැමැති වූවන්ට එය කළ නොහැකි වන සේ ඔබ හා අප අතර පරතරයක් පිහිටුවා ඇතැ'යි කීය. එවිට ධනවතා එසේ නම් පියතුමෙනි, ''මාගේ සහෝදරයෝ පස් දෙනෙක් සිටිති; ඔවුන් ද මේ වධ වේදනා ඇති ස්ථානයට නොපැමිණෙන පිණිස, ඔවුන්ට අවවාද දෙන්නට ලාසරස් මාගේ පියාගේ ගෙදරට යවන මෙන් ඉල්ලමි' යි කීය. එහෙත් ආබ්‍රහම් කතා කොට මෝසස් හා දිවැසිවරයෝ ඔවුන්ට සිටිති. ඔව්හු ඔවුනට සවන් දෙත්වා යි කීය. (ලූක් 16:23-29)

අද අපිට කොතරම් සැනසිලි දායක දිනයක් ද? මළවුන්ගේ දිනය උදා වී ඇත. මිනි කනත්ත ලබා ඇත්තේ අමුතු කළ එළියකි. පූජාව පැවැත්වෙන්නේ ද කනත්ත තුළය. කනත්තේ පූජාවට එන ඔබලාගේ මැලවුණු මුහුණු ලත වෙන්නේ අප වෙනුවෙනි.

ඔබලාගේ යැදීම් තුළින් අප ලබන සුවය කියා නිම කළ නොහැක. අද දින කනත්තට පැමිණෙන විට ඔබලාගේ මුහුණු මෙසේ ලත විය යුතු නොවේ. මොනතරම් සුන්දර මාලිගා තිබුණත් අන්තිමට සුවය දෙන එකම තැන මේ සුන්දර සුසාන භූමිය බව මා ඔබට කියා දෙන්නේ කෙසේ ද? අප එකිනෙකා බහාලු මිනි පෙට්ටි ගැනත් ඒවායේ ඇති වටිනාකම් ගැනත් ඔබලා උදම් ඇනුවත් මේ පෙට්ටි කෝකත් එකය. ලක්ෂයකට දෙන්නෙත් දහදාහකට දෙන්නෙත් එකම මිනි පෙට්ටියයි. වෙනසකට ඇත්තේ වැඩිපුර තහඩු කිහිපයක් ගසා පොලිෂ් පාරවල් දෙක තුනකින් ආලෝකමත් කිරීම පමණය. මරණයක් වෙනුවෙන් අපි වියදම් කරන මේ මුදල් සම්භාරය ගැන මට ඇති වන්නේ දැඩි කණගාටුවකි. බොහෝ සරල චාම් බවකින් මේ කටයුතු සිදු කර ඉතිරි වන මුදලින් ගමේ සිටින අහිංසක මිනිසකුගේ පැල්පතක් ගොඩනගා දීමට දරුවනි ඔබට සිතෙන්නේ නැත්ද?

මරණයක දි පවා ජීවත් ව සිටින ඔබ සොයන ලෞකීක මහන්තත්ත්වය කොතරම් නම් දුක්ඛදායක ද? බැන්ඩ් ගසන්නට එපා, බොරුවට කොඩි වැල් අදින්න එපා, දවස් ගණන් මිනිය තියාගෙන ඉන්න එපා, චාමෙට සියල්ල අවසන් කරන්න. එය ඔබට නිම් හිම් නැති තවත් තෘප්තියක් කරා ගෙනයනවාට සැක නැත. ඒ තෘප්තිය සමිඳුන්ගෙන් ලැබෙන තෘප්තියයි.

මම මේ සියල්ල ඔබට කියා ඔබෙන් සමුගන්නට පෙර මාගේ බිරිඳ සමග යමක් කථා කළ යුතුය. ජීවත්ව සිටියදී මා ඇයට බොහෝ වෙනස්කම් කළෙමි. පුරා 43 වසරක් ඇය පීඩාවට පත්වෙන්නට ඇත්ද? මුළු ජීවිත කාලයම අපායක් කොටගත් ඇගෙත් යුග දිවිය මට එතරම් අවුලක් නොවුවත් එයින් ඇය ලැබුවේ දැඩි අතෘප්ති කරවු ජීවිතයකි. එදා විවාහ ගිවිස ගත් දා සමිඳු අභියස මා කළ පොරොන්දු මගේ සිහියට නැගේ. ''වාසනාවත් කල්හිත්, අවාසනාවත් කල්හිත්.... වාසනාවත් කල්හිත් මා ගිරවෙකු සේ කියාගෙන ගිය සැටි මට මතකය. එදා දවසේ මා ඒ කී වචන මා සවන් ගත වුයේ ද කියා කියන්නට මා නොදනිමි. ඇත්තෙන්ම අර්ථ ශූන්‍ය විවාහ මංගල පූජාවක මා රැඳුණු බව පමණක් මට කිව හැකිය.

ඈ සමග නැවතත් යුග දිවියක් අරඹන්නට ඇත්නම්... මම කොතරම් කවි ලියන්නට ඇත් ද? ඈ වෙනුවෙන් කවි ලියන්නට කියා ඈ බොහෝ වාර ගණනක් ඇවිටිලි කරන්නට ඇත්ද? වෙන අයට කවි ලිව්වෙමි. වෙන වෙන දේවල්වලට කවි ලිව්වෙමි. ඇය වෙනුවෙන් කිසි විටක කවියක් ලියන්නට ඇත්තෙන්ම මට හිත නොදුන්නේ ඇයි? ප්‍රිය සොඳුර දුක් නොවනු මැනවි.

**එඬේරමුල්ල යූ. හර්බට් පෙරේරා ලියයි**

# සියලු සාන
# විදුහල් ම
# නොදැවී



සියලු සාන්තුවරයින්ගේ බාලිකා මහා විදුහල් මාතාව 2014 නොවැ. 01 දිනයේ දී සිය 110 වන සංවත්සරය සමරනු ලබයි. පුරා වසර ගණනාවක් ඇය ආ ගමනේ බාධක රාශියක් විය. එම බාධක මැඩ ඉදිරියට ආ ඇය අද තම යසස පතුරවමින් උදාර ලෙස හිස ඔසවා සිටින්නීය. ඇගේ ගමනේ එදා ඇය ගත් වෙහෙස විඳි දුක් ඇයට ජයග්‍රාහී මාවතකට පිවිසීමට ඉඩකඩ ලබා දී ඇත.

ඈත අතීතයේ එනම් බ්‍රිතාන්‍ය පාලන සමයේ පාලුවට තිබූ පුංචි බොරැල්ල ආශ්‍රිත කැම්බල් ප්‍රදේශය, වැලිකඩ බන්ධනාගාරයේ හා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය රියදුරු මහතුන්ගේ ගාඩ් මහතුන්ගේ ඇතුලු නිලධාරි මහතුන්ගේ නිවාස ඉදිකිරීමට යොදා ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ප්‍රදේශය ජනාකීර්ණ වූ අතර ප්‍රදේශය තුළ රැකියා අවස්ථා ද රාශියක් බිහි විය.

මේ ප්‍රදේශයේ පදිංචිව සිටි කතෝලික ජනයාගේ වන්දනාමාන කටයුතු සඳහා වූ ප්‍රශ්නයට පිළියමක් ලෙස කැම්බල් උද්‍යානය අසළ සියලු සාන්තුවරයින්ගේ දේවස්ථානය ඉදිකරන ලදි. සැබවින්ම සියලු සාන්තුවරයින්ගේ බාලිකා මහා විදුහලේ ආරම්භයට මූලික පදනම වූයේ එයයි. දේවස්ථානයට අනුබද්ධිත පාසල් ඇරඹීම එකල සම්ප්‍රදාය විය. ඒ අනුව වර්ෂ 1904 දී සියලු සාන්තුවරයින්ගේ විදු පියස බිහි වූ අතර කොළඹ අගරදගුරුතුමන් යටතේ එය පාලනය විය. මෙම කටයුත්තේ දී වෙහෙස වී කටයුතු කළේ යහපත් එඬේරාගේ නිකායේ සොයුරියන් ය.

මෙලෙස කළ එළි දුටු සියලු සාන්තුවරයින්ගේ විදුහල 1904 - 1942 දක්වා වසර 38 ක කාලයක් යහපත් එඬේරාගේ නිකායේ සොයුරියන් අතින් පාලනය විය. ගරු ජෙරල්ඩ් පැවිදි සොයුරිය 1904 සිට 1913 දක්වා කාලය තුළ ප්‍රථම විදුහල්පතිතුමිය වූ අතර එම නිකායේ ම සොයුරියන් කීප දෙනෙකුම ඉන්පසුව විදුහල්පති ධුරය හෙබවූහ. ඔවුන් පාසලේ අභිවෘද්ධියට හේතුවන පියවර රාශියක් ගන්නා ලදි.

වර්ෂ 1907 දී මෙම විදුහල ආධාර ලබන පාසලක් වශයෙන් ලියාපදිංචි කළ අතර වර්ෂ 1914 දී ප්‍රාථමික පාසලක් ලෙස ද, 1928 දී කනිෂ්ඨ ද්විතිය පාසලක් ලෙසද 1941 දී ජ්‍යෙෂ්ඨ ද්වීතීය පාසලක් ලෙසද ක්‍රමයෙන් පියවර තැබීය. එමෙන්ම සියලු සාන්තුවරයින්ගේ ජ්‍යෙෂ්ඨ ද්විතික ගැහැනු පාසල නමින් හැඳින් වූ මෙම විදුහල 1941 ඔක්තෝබර් මස 21 දින සියලු සාන්තුවරයින්ගේ බාලිකා විදුහල නමින් නම් කිරීම ද සිදුවිය.

දියුණුව කරා කෙමෙන් කෙමෙන් පිය නැගූ මෙම පාසලේ වර්ෂ 1942 සිට 1945 දක්වා කාලය තුළ විදුහල්පතිනිය වූයේ එල්. ග්ලැඩිස් පෙරේරා මහත්මියයි. 2 වන ලෝක සංග්‍රාමය දරුණුව පැවති මේ සමයේ දී පාසලට බොහෝ අලාභහානි සිදුවිය. මේ නිසා පරිහානියට පත් මෙම විදුහල නැවත නඟා සිටුවීමේ වගකීම වෙනත් මිෂනාරි කණ්ඩායමකට පැවරුණි. ඒ අනුව බොරැල්ල සා. අන්තෝනි කන්‍යාරාමයේ පැවිදි සොයුරියන් ප්‍රමුඛ ප්‍රැන්සිස්කන් නිකායේ පැවිදි සොයුරියන්ට 1945 ජුනි මස 1 දා සිට මෙම විදුහලේ පාලනය භාර විය.

මෙතැන් සිට මෙම විදුහල සියලු සාන්තුවරයින්ගේ කොලීජිය හෙවත් "ඕල්සෙන්ට්ස් කොලේජ්" යනුවෙන් හැඳින්විය. 1945 සිට 1951 දක්වා ගරු මේරි වූල්ස්ටන් මවුතුමිය විදුහල්පති ධුරය හෙබවූවාය. දිනෙන් දින වැඩි වූ ශිෂ්‍ය සංඛ්‍යාව, ඉඩ පහසුකම් මද බව තවත් ගුරුවරුන්ගේ සේවා අවශ්‍යතාවය ආදිය මධ්‍යයේ බාධක ජය ගනිමින් නොපිරිහෙලා සේවය ඉටු කරමින් ඇය මෙම විදුබිම දිනෙන් දින දියුණුව වෙත ගෙන ආහ.

මෙවකට කතෝලික පාසල් භාර අධ්‍යක්ෂ ගරු ඩී. ජේ. ඇන්තනි (නි. ම. නි.) පියතුමන් විසින් 1951 සැප්තැම්බර් මාසයේ අපෝස්තලික කාර්මෙල් නිකායේ කනයා සොයුරියන්ට පාසලේ භාරකාරිත්වය සඳහා ආරාධනා කරන ලදි. ඒ අනුව වර්ෂ 1951 දෙසැම්බර් මස 11 දින අපෝස්තලික කාර්මෙල් නිකායේ ගරු ඇනට් පැවිදි සොයුරිය හා ගරු ඩොමිටිල්ලා පැවිදි සොයුරිය මේ වගකීම භාර ගත්හ. එම නිසා අප පාසල මෙවැනි සාර්ථක තත්ත්වයකට ගෙන ආ අපෝස්තලික කාර්මෙල් නිකායික පැවිදි සොයුරියන්ට කෘත ගුණ සැලකීම අපගේ යුතුකමකි.

කාර්මෙල් නිකායික ප්‍රථම විදුහල්පතිනිය ලෙස සේවය කළේ වර්ෂ 1951 - 1955 දක්වා ගරු මේරි ඇනට් පැවිදි සොයුරියයි. ඉන්පසුව වර්ෂ 1955-1960 දක්වා ගරු මේරි ජෝසප් පැවිදි සොයුරියත්, වර්ෂ 1960 - 1964 දක්වා ගරු ලිඩ්විනා පැවිදි සොයුරියත් විදුහලේ විදුහල්පති ධුරය දැරූ අතර නැවතත් වර්ෂ 1964 - 1971 දක්වා ගරු මේරි ඇනට් පැවිදි සොයුරිය විදුහල්පතිධුරයට පත් විය.

එතුමියගේ විශ්‍රාම ගැනීම හේතුවෙන් වර්ෂ 1971 - 1977 දක්වා ගරු ග්ලෝරියා පැවිදි සොයුරිය ද, වර්ෂ 1977 - 1979 දක්වා ගරු මේරි කොන්ස්ටන්සියා පැවිදි සොයුරිය ද 1979 සිට පුරා දස වසරක් ගරු මේරි ලෙනිටා පැවිදි සොයුරිය ද, වර්ෂ 1989 සිට 1993 දක්වා ගරු ස්ටෙලා මරියා පැවිදි සොයුරිය ද විදු පියසේ මූලිකයා ලෙස කටයුතු කළහ. ඉන් අනතුරුව විදුහල්පති ධුරයට පත් ගරු ප්‍රීති ප්‍රනාන්දු පැවිදි සොයුරිය වර්ෂ 1993 සිට 2007 දක්වා ද, ගරු චාලට් පරණවිතාන පැවිදි සොයුරිය වර්ෂ 2007 - 2010 දක්වා ද, 2010 සිට වත්මන් විදුහල්පති තුමිය වන ගරු ඈන් ක්‍රිස්ටින් පැවිදි සොයුරිය ද මෙම ධුරයෙහි කටයුතු කළහ.

පාසලේ අතීතය පිළිබඳ කතා බහ කිරීමේදී තවත් සුවිශේෂී දෙයක් ලෙස පාසල රජයට පවරා ගැනීම සැලකිය හැකිය. එය සිදුවූයේ වර්ෂ 1961 දීය. මෙහිදී දෙමාපියෝ ඊට විරුද්ධත්වය පාන්නට විය. පාසල රජයට නොහොත් තම දරුවන්ට කතෝලික පරිසරයක් තුළ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව නැතිවේ යයි කියා ද, අනිකුත් රජයේ පාසල්වල තත්ත්වයට මෙම විදුහලත් පත්වේ යැයි කියා ද ඔවුහු බිය වූහ. වාසනාවකට මෙන් සියලු සාන්තුවරයින්ගේ පිහිටෙන් එවැන්නක් සිදු නොවීය. එම නිසා රජයත්

# න්තුවර ාතාව 110



කතෝලික සභාවත් අතර එකඟතාවයට පැමිණීමෙන් අනතුරුව පාසල රජයට පවරා ගන්නා ලදි.

එමෙන්ම 1986 ජුලි මස 15 දින මෙම විදුහලේ උසස් පෙළ වාණිජ පංති ආරම්භ කිරීම මෙහි විජයග්‍රාහි පියවරකි. තවද 1987 ජුනි මස 16 දින උසස් පෙළ කලා පංතින් ආරම්භ වීම ද ඉතා සුවිශේෂී දෙයකි. මේ හේතුවෙන් පාසලේ ගොඩනැගිලි අවශ්‍යතාවයන් මතු වූ අතර ඒවා සපුරාලීමට වෙහෙසෙමින් කටයුතු කළ විදුහල්පතිවරියන්ට ද අප ස්තුති කළ යුතුය.

ඉතාමත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන සියලු සාන්තුවරයන්ගේ බාලිකා විදුහල තම 100 වන සංවත්සරය සැමරුවේ 2004 වසරේදි ය. වර්තමානය වන විට මෙහි 1100 කට ආසන්න සිසුන් පිරිසක් ඉගෙනුම ලබන අතර ඔවුන්ට පැහැබර අනාගතයක් තනා දීම සඳහා 54 දෙනකුගෙන් යුත් ඉතා කාර්යශූර ගුරු මණ්ඩලයක් ද විදුහල සතු වෙයි.

ගත වූ වසර කිහිපය තුළ විදුහල විවිධාකාර වූ දස්කම් රාශියක් පෙන්නුම් කර ඇත. අ.පො.ස. සා. පෙළ විභාග අයදුම්කරුවන් අතරින් 80% ක පිරිසක් අ.පො. ස. උ. පෙළ විභාගයට මුහුණ දුන් ශිෂ්‍යාවන් අතරින් 60% දෙනකු විශ්ව විද්‍යාලය සඳහා ප්‍රවේශ ලබා ගැනීම මඟින් ද පෙනී යන්නේ විදුහලේ අධ්‍යාපන අංශය ඉහළ මට්ටමක පවතින බවයි.

එමෙන්ම පසුගිය වසර කිහිපය තුළ සාන්තුවර සිසුන් සැම අංශයකින් මෙන්ම ක්‍රීඩා අංශයෙන් ද තම දක්ෂතාවන් පෙන්නුම් කරයි. පාසලේ වොලි බෝල් කණ්ඩායම පළාත් මට්ටමින් බොහෝ ජයග්‍රහණ ලබා ගෙන ඇත. එමෙන්ම කරාතේ ක්‍රීඩාවෙන් ද, නෙට්බෝල් ක්‍රීඩාවෙන් ද විදුහලේ සිසුන් ජයග්‍රහණ ලබා ගැනීමට උත්සාහ දරයි.

තවද ඉංග්‍රීසි දින භාෂා තරග වලින් ද ප්‍රාථමික අංශයේ තරග වලින් ද පාසලේ ශිෂ්‍යාවන් පළාත් මට්ටමින් විශිෂ්ට ජයග්‍රහණ ලබා ගෙන ඇත. සියලු සාන්තුවරයින්ගේ බාලිකා විදුහලේ ශිෂ්‍යාවන් නැටුමට ගැයුමට වැයුමට මෙන්ම රැ ගුමට ද උපතින්ම හපනුන් ය.

අධ්‍යාපන අංශයෙන් පමණක් නොව ආධ්‍යාත්මික දෑ සඳහා ද විදුහලේ සිසුන් එක ලෙසට දක්ෂය. අගරදගුරු පදවිය මඟින් සංවිධානය කළ බයිබල් දැනුම මිනුම තරගයෙන් 2012 වර්ෂයේ දී පාසලේ අන්තර්මධ්‍ය කණ්ඩායම එහි 2 වන ස්ථානය දිනා ගත් අතර 2013 වසරේදී අන්තර් මධ්‍යම ඉංග්‍රීසි මාධ්‍යය කණ්ඩායම සහභාගි වී රන් පදක්කමක් ද දිනා ගත්තා ය.

2014 වසරේදී ජයග්‍රහණයේ හිනිපෙත්තටම පැමිණි "සාන්තුවර" සිසුන් අන්තර් මධ්‍ය ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රථම ස්ථානය ද ඉංග්‍රීසි මාධ්‍ය ජෙෂ්ඨ අංශය දෙවන ස්ථානය ද සිංහල මාධ්‍යය අන්තර්මධ්‍යම කණ්ඩායම දෙවන ස්ථානය ද, සිංහල මාධ්‍යය අන්තර්මධ්‍යම කණ්ඩායම දෙවන ස්ථානය ද දිනා ගන්නා ලදි.

වර්තමානය වන විට සියලු සාන්තුවරයින්ගේ විදුහලේ ශිෂ්‍යාවන්ව සමිති සමාගම් සඳහා මෙහෙයවීම් කරනු ලැබේ.

ඥානවන්තයින්ගේ ප්‍රධානම අරමුණ හා වගකීම වනුයේ ශිෂ්‍යාවන් තුළ ඇති වගකීම් පෙන්වා දීමය. එම නිසා සියලු සාන්තුවරයින්ගේ විදු පියසේ සිසුන්ට තම විෂය දැනුම, කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික සුවය මෙන්ම කුසලතා ද වර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව, සලසා දී ඇත. එමඟින් ඔවුන් ජීවත් කිරීමට උත්සාහ කරනුයේ "පූර්ණ පෞරුෂත්වයෙන් හෙබි පුද්ගලයෙකු" යන පාසල් ආදර්ශ පාඨයයි.

නිහඬව ගෙවුනු වසර 110 ක අභිමානවත් ගමන් මග තුළ දී විදුහලේ දරුවන්ට අභිමානවත් අනාගතයක් ගොඩනැගීමට මඟ පෙන් වූ, වෙහෙස මහන්සි වූ සියලුම විදුහල්පතිවරියන්ටත්, ගරු ගුරු මැණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත් අපගේ හද බැඳි ගෞරව හා තුති මල් පුද කර සිටිමු.

**ගරු ඈන් රියානා පැවිදි සොයුරිය (අ.කා.)**

# ගුරුතුමන් ඇසුරේ ලද අත්දැකීම් බිඳක්

සුනිල් සාන්තයන් හා මගේ හමුව සිදුවූයේ 1952. 06. 13 වන දින දී යැ. ඒ එවුන්ගේ ම ඇරියුමක් මත යැ. එවකට ලංකා ගුවන් විදුලි සේවයේ වෙළෙඳ අංශයෙන් ඉදිරිපත් කැරුණු "ආධුනික පැය" නම් වැඩසටහනට මා විසින් ගායනය කැරුණේ සුනිල් සාන්තයන්ගේ "වරෙන් හීන් සැරේ රිදී වලාවේ" යන ගීතය යි. එදා ඒ වැඩසටහනට සවන් දී සිටි ඔවුන් එකවරම එය වෙනත් කෙනෙකු විසින් ගයනු ලබන ඔවුන්ගේ යැයි වටහා ගන්නට නොහැකිව පසු ව ගීතය අතරතුර කැරුණු කිසියම් වරදක් නිසා එය ගයන්නේ වෙනත් කෙනෙකු විසින්ය යන බව වටහා ගෙන එය ගැයූ තැනැත්තා දැනගනු රිසියෙන් ඔවුන් මා කැඳවූ බව එදා ඔවුන් මට පවසා සිටියා.

මේ හමුවෙන් පසු සුනිල් සාන්තයන් ගේ සංගීත පන්ති මඟින් සංගීතය හැදෑරීමේ කටයුත්තෙහි නිරත වන්නට මට අවස්ථාව සැලැසිණි. එතැන් පටන් සුනිල් සාන්තයන් විසින් ඉදිරිපත් කැරුණු සැම සංගීත වැඩසටහනකටම මට සහභාගි වීමේ වරම ලැබිණ. "රන්වලාව", "මධුර මධු", "පංච මධුර", "සීගිරි ගී" ආදි වැඩසටහන් ඉන් කීපයකි. මුල් කාල වල දී ඔවුන් විසින් ඉදිරිපත් වුණු වැඩසටහන් වලට වඩා වෙනස් මඟක් මේ වැඩසටහන්වල දී ගැයුණු ගීතවල දක්නට ලැබිණි. බොහෝ ගීත ස්වර සංකලනය සීමිත ස්වර ගණනක් අනුව පිහිටුවිණි. නිර්මාණ කාරියෙහි දී බොහෝ විට අලුත් අත්හදා බැලීම්වල යොමු වන්නට ඔවුන් ගේ සිත නැමී ගියේ ය. ඔවුන් ගේ ගී පොතක දක්වා ඇති මුනිදාස කුමාරතුංගයන්ගේ "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොවැ නොනගී - හිඟාකෑම බැරි වූ තැනැ ලගී ගයා මරගී" යන පැදි අඩ ඔහුගේ සිතේ දෝංකාර දීමේ පල විසින් එවන් දෑ කිරීමෙහි නිරත වන්නට ඔවුන් පෙළඹුණා යි මට හැඟේ. ඉන්දියානු රාගධාරී සංගීත මග ඔස්සේ ගමන් අරඹන්නට හිතා සිටි ඔවුන් දේශීය සංගීතය ගොඩනැංවීමේ කාර්යය සඳහා පිය නඟන්නට මුල පිරුයේ ද කුමාරතුඟු මුනිදසුන්ගේ කවි පෙළක් නිසා බව ඔවුන් ම පවසා ඇත.

"රටට දැයට හිත දපා
මඳකට දිවි ලොව ලොපා
කළ මෙහෙයක් නැති දෙපා
හෙළයකු දැකුමත් එපා"

යනු ඔවුන්ගේ හිත තදින් වෙළා ගත් ඒ පැදියයි. සීගිරි කුරුටු ගී වලට සංගීතය නිර්මාණය කිරීමේ දී ඔවුන් ඒ සඳහා යොදාගත් කෙටි ස්වර කැටි හැසිරවීමෙන් ඉන් නැගුණු නාද රටාව කන වැකුණ කවරකු වුව ද සීගිරි යුගය කරා දිවැ යන්නට සමත් වන අයුරු දිස්වෙයි. සීගිරි කරුටු ගී වල ඇත්තේ ඉතා කෙටි වූ ගී පද කිහිපයෙකි. බොහෝ විට ඒ හැම පෙළක් ම නියමිත මත් කැටියකට නො වැටේ. එහෙත් එය නාද රටාවක් හා මුසුකොට ඉදිරිපත් කිරීමෙන් හිතවත් බවක්, ඇතිවන සැටිත් අරුත නොබිඳෙන සේ උච්චාරණයත් මෙහෙයවා ඇති සැටිත් වෙසෙසි දස්කමක් සේ දැක්විය හැකියි. එහි එන ඇතැම් වදන් ඒ අතැ මේ අතැ පෙරළා පුන පුනා ගයන්නට සැලැස්වීමෙන් මතුවන හඬ කන වැකෙන කවරකුට හෝ තමා සීගිරි පව්වේ ම සිට එය ගයන බව ද සවන දෙන බව ද මොනවට වැටහේ.

ගුවන් විදුලි වැඩසටහනක දී සීගිරි ගී පිළිබඳව බොහෝ සංගීතවේදීන් මතුකළ අදහස වූයේ සීගිරි ගී ගීතවත් කිරීම (ප්‍රස්තාර යෙදීම) අපහසු බවයි. ඒ මතය බිඳැලන්නට සුනිල් සාන්තයන් තනු යොදා ඉදිරිපත් කළ ගී සමත් විය. තවත් වරක ඔවුන් කියා සිටියේ සීගිරි ගී වල පද පෙළින්ම ස්වර රටාවක් මතුකැරැ ගන්නට හැකි බව යි. යම් රටාවක් ඒ තුළ ගැබ් වී තිබෙන්නට හැකි බව යි. එයට සාධකයක් සේ ඔවුන් මේ වැනි පබඳක් ගෙන හැර දැක්වී ය.

**සීගිරි ගී - රූ සිරි ගී**
**ගී රිසි රූ - ගිර සැරසි**

**සර සරු ගී - සරු සැරි ගී**
**ගිගිරි සරින් - ගිරි සැරසී**

**සේ රූ ගී - සී රූ ගී**
**ගිගුම් සරෙන් - ගිර සැරසී**

**ගුම් ගුම් ගී - රුං රුං ගී**
**සන්සුන් සී - ගිරි සැරසී**

**සීගිරි රූ - රඟ රිසි රූ**
**රැස් සී ගල් - ගිර සැරසී**

**සන්සුන් රූ(ම්) - රන් සී රූ**
**සැංගි සෝ - ගිර සැරසී**

**සන් සුන් රෑ - රිසි සේ රැව්**
**රැසින් ගී - ගිර සැරැසි**

**ගල් ගේ රූ - රාසේ ගෑ**
**ගී රැස සේ (ඒ) - ගිර සැරසී**

ස-සැ-සි අකුරු යෙදෙන තැනට
'ස' ස්වරයත්
ර-රැ-රී අකුරු යෙදෙන තැනට
'රි' ස්වරයත්
ග-ගි-ගුම් අකුරු යෙදෙන තැනට
'ග' ස්වරයත්

යොදා ගත් කල, සුනිල් සාන්තයන් දක්වන ගී තනුව මතුකැර ගත හැකි වෙයි. සුනිල් සාන්තයන් කෙරෙහි පැවති සුවිශේෂ නිර්මාණ හැකියාව කවරාකාර දැයි මෙවන් දැයින් එළිදරවු වෙයි.

ඔවුන්ගේ තවත් අති විශේෂ නිර්මාණයක් සේ දැක්විය හැක්කෙකි. "බඹර ගීතය" මේ ගීතය පුරා මැ දිවැ යන්නේ එක් ස්වරයක් පමණෙකි. එක් ස්වරයකින් ගී තනුවක් ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙනෙකු අසන්නට පිළිවන. එහෙත් ඒ කාර්යයෙහි ඔවුන් සිත යොමු කළේ කවර ලෙසකින් ද යන්න ගීතයේ පද වැල දෙස විමසිල්ලෙන් බලන්නකුට වැටහෙනු ඇත. තනි ස්වරයකින් නැගෙන ඒකාකාරී ගතිය බිඳලන්නට පද රටාව උපයෝගී කොට ඇති අයුරු සැබැවින් ම අසිරිමත් යැ. මා සිතන හැටියට ජගත් සංගීත ලොවේ කවර හෝ සංගීතවේදියකු විසින් හෝ මෙවැන්නක් එළිදක්වා ඇති දැයි සැක සහිත ය. මේ ඒ ගීතයේ කොටස් කීපයෙකි.

**ගුම් ගුම් ගුම්**
**මලකට ගුම් ගුම් - වැලකට ගුම් ගුම්**
**මලකට රොනකට ගුම් ගුම් ගුම්**
**ගහකට වැලකට ගුම් ගුම් ගුම්**
**උදයට හවසට ගුම් ගුම් ගුම්**
**හෙමිහිට හණිකට ගුම් ගුම් ගුම්**

මල් මාලා ගුම් ගුම්
වැල් ආලා ගුම් ගුම්
රොන් නා ලා ගුම් ගුම්
රුං ගා ලා ගුම් ගුම්

මලින් මලට ගුම් ගුම් ගුම්
වැලින් වැලට ගුම් ගුම් ගුම්
ගහෙන් ගහට ගුම් ගුම් ගුම්
රොනින් රොනට ගුම් ගුම් ගුම්

මලින් මලට ගුම් ගුම්
වැලින් වැලට ගුම් ගුම්
ගහෙන් ගහට ගුම් ගුම්
රොනින් රොනට ගුම් ගුම්
මලින් මලට මලකට
වැලින් වැලට වැලකට
ගහෙන් ගහට ගහකට
රොනින් රොනට රොනකට

මලකින් මලකින් ගුම් ගුම් ගුම්
වැලකින් වැලකින් ගුම් ගුම් ගුම්
ගහකින් ගහකින් ගුම් ගුම් ගුම්
රොනකින් රොනකින් ගුම් ගුම් ගුම්

අහරක් අහරක් ගුම් ගුම් ගුම්
කවරක් කවරක් ගුම් ගුම් ගුම්
බැහැරක් බැහැරක් ගුම් ගුම් ගුම්
දෙවරක් තෙවරක් ගුම් ගුම් ගුම්

ගුම් ගුම් ගුම් ගුම් ගුම් ගුම්
ගුවන් ගැබේ ගුම් ගුම් ගුම්
අහස් කුසේ ගුම් ගුම් ගුම්
පවන් රැලේ ගුම් ගුම් ගුම්

පාන්දරින් ගුම් ගුම් ගුම්
එහා මෙහා ගුම් ගුම් ගුම්
රැන් ගැහී ගුම් ගුම් ගුම්
රුං කියා ගුම් ගුම් ගුම්
පියා විදා ගුම් ගුම් ගුම්

**පියා සලා ගුම් ගුම් ගුම්**
**නිසංසලේ ගුම් ගුම් ගුම්**
**හීන් සැරේ ගුම් ගුම් ගුම්**
**පියා හඹයි ගුම් ගුම් ගුම්**

සුනිල් සාන්තයන්ගේ තනුවලැ ඇති තවත් සැලකිය යුත්තක් නම් බොහෝ දුරට ශුද්ධ ස්වර ආශ්‍රිත ව තනු යෙදීම යි. ඔවුන් ගේ ගී අතර වැඩි ගණනක් වැටෙන්නේ මේ ගණයට ය. බොහෝ සංගීතවේදීන් විරහ ගීතවල දී වැඩි වශයෙන් ම යොදා ගන්නේ කෝමල ස්වරයි. එවැනි ගීත සඳහා ද සුනිල් සැකසූ තනු බොහෝමයක් පදනම් වී ඇත්තේ ශුද්ධ ස්වර මත යි. "අත්තනගලු වැලපිල්ල" හා "වංකගිරි වැලපිල්ල" මේ පිළිබඳ දියහැකි කදිම නිදසුන් යැ.

ඒ හැරුණු කොට ඉන්දියානු රාගධාරී සංගීතය, බෙංගාලි සංගීතය හා බටහිර සංගීතය ආශ්‍රිතව නිර්මාණය කළ ගීත ද වෙයි. කවර කලක් ගත වුවද කවර හෝ සංගීතවේදීන් ගේ කවර නිර්මාණයක් අතර වුව ද හෙටත් මතුදාත් "ඕලු පිපීලා", "හඳපානේ", "කෝකිලයන් ගේ කෝකිල නාදේ", "ලංකා ලංකා" වැනි ගීත නොනැසී සදා මැ ජන හදවත්වලැ රැඳී පවතින බවට කිසිදු සැකයෙන් නැත්තේ යැ.

("සුනිල් සමර" පොතෙන් උපුටා ගැනිණි.)

**අයිවෝ ඩෙනිස්**





# පැදි නදිය



## මරණය

අසල්වැසියන්......
හා නෑ පරපුර....
එන අය පිළිගනී.......
දූ පුතුන් එක්විලා........
මුල් කරගෙන
මරණය

බොහෝ අය මේ රැයේ
කාලය ගෙවයි
මතට තිත නොතබා
සුදුවට මුලපුරා
නොසිතා......
මරණය

මළ හිරු බසින සැඳෑවයි
පල්ලියෙ මළ සීනුව ඇසෙයි
උරුමවූ ගමන යන්නට
කාගෙත් කර පිටින්
මරණය

**ආර්. ජෝශප් ප්‍රිය**
කොඩිකාවත්ත

## සමාන

ඉල්මහ ලබන විට මළවුන් සිහිවෙනවා
සොහොන් කොත් කිරි පැහැයෙන් බැබලෙනවා
තමා අතින් උන අතපසු කම් සිහිවෙනවා
මනස්ථාපයේ සැමතින් සමාව අයදිනවා

ඉක්මන් කෝපයෙන් මව්නි පියෙනි මා බැන්නාට
සන්තාපෙන් මුලාවී ඔබලට නොසැලකුවාට
මියැදුනදා පෙන්න බොරු සෝබන කෙරුවාට
කළ වැරදිවලට සැනසිල්ලක් නැත හදවතට

ජේසු සොයන්නේ පව් කරුවන් පමණි
සිත් හැරී එන්න සමා දෙන්නේ මා පමණි
මිහිදන්වී සිටින මා ආදර මව් පියෙනි
දිනෙක සගලොවේ අපි හමුවෙමු තුටිනි

**සුනිතා මාලනි විජේසිංහ**
මතුගම

## ආ ගමන ලස්සනද?

ජීවිතය ජීවයෙන් සමු අරන්
පැමිණියා සියළු දේ හිස් කරන්
හොඳ නොහොඳ පමණක්ම හද දරන්
ආ - ගමන ලස්සනද මොන තරන්

පොළව යට තුරුළු කළ ගත අපේ
නිසරු බව පසක් කැර විය හපේ
ජීවිතය රවටමින් පුහු ඔපේ
පා - කුමට සුසානය ළඟ හැපේ

මළවුන්ට මල් තබා සමරන්න
දිනක් ආ බව දනි යළි ඔන්න
සුසානය වෙත ගියා අප දන්න
එදින බෑ ආ කඳුළු සඟවන්න

සිහිවටන කුරුස අබියස ඉටි
පහන් දල්වා තිබේ මිටි
කමක් නෑ ඒ තමා අපෙ හැටී
අද නොවේ හෙටත් වේනම් වටී

**පිටිපන මා. ජයවීර**

## තුතිමල් මිටක් !

යන මාවතින් හරවා නිවැරදි..... මඟට
නැණ ගුණ දහම බෙදමින් අප සිත් තුළට
සිදුකළ මෙහෙය මෙතෙකැයි කිව නොහැක මට
සමිඳුන් කථා කළ බව නම් හැගුණ හදට

සමිඳුගේ ආදරින් අප සුරැකූ පියාණනි
සමිඳුගේ සවියෙන් අපට සවිය දුන් පියාණනි
සමිඳුගේ සෙනෙහෙන් අප සුවපත් කළ පියාණනි
සමිඳුගේ රැකවරණය ඔබහට පතනෙමි පියාණනි

කරුණාබර පියවරුනි තෙද බල මහිමයෙන් පිරි
ඔබ හද කිතුනුනේ සමිඳුගේ සෙනෙහසින් පිරි
ඔවදන් දුන්නේ මා හදවතට තුළට පිරි
තුතිමල් මිටක් පුදනෙමි මම හද තුටින් පිරි

**ශිරෝමි නිර්මලා**
දළුගම

## මරුදමඩු මෑණියේ

අඳුරු වන පෙත මත නැගි
රුවන් පායක් සේ දිලී
දම් මිහිර පතුරුවා බැබළෙන
වන්නි මඩු පුද භූමියේ
නැගි දිදුලන තේජ ශ්‍රී බර
මරුද මඩු මරි මෑණියේ

සකල සත වෙත එකසේ මෙතපා
දෙවිඳු පුත් වෙත පිදු සෙනේ මෙන්
අපද සුරකිනු අපම මව්වූ
මරුඳ මඩු මරි මෑණියේ
පවින් අසරණ ලොවේ තනිවූ
අපට සරණය වනු මැනේ

**වෙන්නප්පුවේ ලලිත් කිත්සිරි**

## මරිය වසරෙ මරියාවන්

සාමයෙ මාවතෙ දොරගුළු විවර කරවලා
අදමිටු බණ දෙසන අයගෙ හඬ පරදවලා
නිවැරදි මාවතකට අප සැම යොමු කරලා
ඔබගෙ වසරෙ ලොව සැමටම කරුණා පාලා

මරිය වසරෙ මරියාවන් වෙතට බැඳෙන්න
මරියාවන් අපගේ මව් ලෙසම සිතෙන්න
මවකගෙ පෙම තුළ පමණක් ජීවත් වන්න
ඔබගෙ වසරෙ අප හට නව ජීවය දෙන්න

**කේ. සිරිමල් ප්‍රනාන්දු**
මග්ගොන



## කේටරින්?

මඟුලට
අවමඟුලට
නැතුවම බැරි
කේටරින්.......

**අනුර ශාන්ත පීරිස්**
හලාවත



## ජපමාලය යදිමු

දෙව් අභිමතයට හිස නමලා
තම කැමැත්ත පවරා දීලා
සියකුස තෝතැන්නක් කරලා
ලෝ ගැලවුම්කරුගේ මව වීලා

අප මැදහත් කාරිය විලා
දෙවිඳුන් වෙත අප ගැන යැදලා
පව්බර අප හට සෙනෙහස පාලා
පව්බර අප හැමගේ මව වීලා

සැම නපුරෙන් අප හැම ගලවාලා
දෙව් සරණය හැම වෙත ලැබදීලා
සහනය විගසින් අපහට දීලා
සගයට යන මඟ පෙන්වා දීලා

පවුලක් ලෙස අප එකමුතු වීලා
හැම දින අප ජපමාලය කියලා
දෙව්මව් යහගුණ සිහිකරලා
එකමුතු වෙමු රන්දාමෙන් බැඳිලා

**ජිනවලි ස්වර්ණලතා පීරිස්**
මොරටුව

## කල - අකල

වියැකේ අකාලයේ
විසම දේ එක් කැර
අස්වභාවික කෘතිම
හැදෙන දෙය
ඉක්මනින් එයදී
පැවතුමට දෙය තබා
ස්වභාවික හැදෙන දෙය
වියැකී යයි ක්‍රමිකව
කාලයට එලයදී

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

## සොම්නස ඔබය!

ගුවන් කුසේ සිට එක නෙත් සරයෙන්
ලොවම දකින මව් කුමරිය ඔබවේ
සැමගේ මව වී විශ්වයම රජන වී
සැදැහැතියන් වෙත පිහිට වුනා ඔබ

ඔබ රැඳෙනා තැන සතුට ගලා යනවා
ඔබ හිනැහෙන විට දුක්'ඳුරු පැන යනවා
සොම්නස් අරගෙන සගයේ සිට එන
දෙව්මවගේ මුදු
දොම්නස දුරු වෙනවා

**රන්ජිත් ලොකුපෝතාගම**
කුස්වල

## ජපමාලය දෝතට ගොනුකර

අපමණ දුක් කරදර හැමදා තුරුළුව
කඳුගැට දුරු කතර ගෙවා
ජීවිත මඟ හැම සුසුමන් සුසුම ගෙවා
සතහට අක්කර ගැලවුමෙ අමා

රුදු සපු යකු බල සුන්කර
ජපමාලය රන්දම තිරකර
නිරතුරු අමතන්නට ඔබ හැමවර
මෑණියේ ඔබවේ සුරලොව දම්සර

ගිලිහෙන ලෝකයෙ බොල්බව නැතිකර
මිනිසුන් මිනිස් බවින් සරුකර
රැකගනු මෑණියේ ලෝසත හැමවර
අයදිමි ජපමාලය දෝතට ගොනුකර

**ඇග්නස් සියඹලාපිටිය**
කටුවපිටිය

## පළමු දින

මල් විකසිත වී
සඳු තරු මැලවී
හිරු හෙට පායයිද?

මගේ තුරුලට වී
සුරතල් බස් දුන්
පුතු මා හැර යයිද?

පාසල් ගමනෙහි
මුල් දින ලෙස නුඹ
මව් හැර දා යයිද?

දහසක් දරුවන්
අතරට ගිය විට
මා බොඳ වී යාද?

**ඇන් තියෝපිලස්**
ගම්පහ

## කිසිවක් සතිර නොවේ


හිමිදිරි උදෑසන මැනවින් පිපුණු මල
මිළිනව ලබනු පෙර දවසේ සැඳෑ කල
පවසයි ගැඹුරු දහමක් හද සසල කළ
කිසිවක් සතිර නොම වනු ඇත මෙලොව තුළ

වට වැහි නිසා පාමින් සිය ගති පබල
වේගෙන් ගලා ගෙන යන මුත් ගඟ තුමුල
නියගට හසුව වියලී එය වී දුබල
'සැමදේ නොතිර වේ' යන දම විය පහළ

පෑයු ඉඳුසැව්ව වැහිබර අහස මැද
දසුනක් වූවක් නෙත් සිත් පුබුදුවන ලද
'ලොව සැම දේම තිර නැති' බව කියන ලෙද
සුළු මොහොතකින් නැතිවෙයි රිවි කිරණ වැද

තෙල් පිරි පහන දැල්වෙන මුත් එළිය දදී
පැමිණෙයි අඳුර එහි තෙල් ගිය පසුව සිඳී
බැලුවොත් එදෙස මෙම අදහස සිතට වදී
ලොව සැම දෙයෙහි ඇති තිර නැති ගතිය රැඳී

**දළුපත පිලිෂියන්**
මීගමුව



## පූජක උපහාර

නිමා නැතිව සය වසරක් පුරා වට
කැප කළ දිවිය වැලිගම්පිටි මීසමට
ශ්‍රී ලාල් පියතුමෙනි අප සැම එකට
බැතිමල් පුදමු පතමින් ජයශ්‍රී ඔබට

සුදතුම් නැණින් ඔබ සැමදා සපිරේ වා
ඔබ සැම වදන් සත හට දිව ඔසු වේවා
කිතු හිමි සවිය සැමදා ඔබ සතු වේ වා
සුරපිය සරණ නිති ඔබ සමගම වේ වා

**වෝල්ටර් රත්නායක**
වැලිගම්පිටිය

## හිච්චි පුතා

අපේ ගෙදර හිච්චි එකා
මටත් හිටිය එකම එකා
කියනාදේ නොහාන එකා
ඉගෙනීමට දක්ෂ එකා

ශිෂ්‍යත්වයෙන් පැන ගත්තේ
පලමුවෙලා අපේ පැත්තේ
ලොකු ඉස්කෝලෙට පැන ගත්තේ
දක්ෂ නිසා නගරේ පැත්තේ

සාමාන්‍ය පෙළ උසස් ලෙසින්
එගොඩ උනා 'ඒ' සමගින්
තවත් ඉහළ ගියා ඉතින්
අග නුවරට උසස් පෙලින්

ප්‍රතිඵල දැක පුදුම වෙච්චි
අපට ඉතින් කිරි එරෙච්චි
සන්තෝසෙන් ඉපිලෙච්චි
'දොස්තර' උනා අපේ හිච්චි

**ක්‍රිස්ටෝපර් ජාන්ස**
රාජකඳළුව



## මව්ගුණ සැමරුම්

පෙර මඟ දල්වන ලද මැණික් පහනක් ලෙසින්
අප දිවි සවිමත් කළා පැව දරු සෙනෙහසින්
දැනේ මව්නි ඔබ නැති අගය ඇඩිව යහමින්
ඔබ ගුණකඳ නම් නොමැකේ කිසිදා මතකයෙන්

අප දුන් දේට වඩා ඔබ දුන් දේ ඇත බොහෝම
දවසින් දවස ඔබ නම වේ දිව මතුරක්ම
අපෙන් සමුගෙන ගියා මෙලොවින් සදහටම
මොක්සුව යදිනෙමු දෙවිඳු වෙතින් අප සැවොම

**ආතර් හිලරි ප්‍රනාන්දු**
මාරවිල



# සසුන් පියා පවුල් ගොවිතැන මහත් සේ අගයයි

අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා, ලෝක ආහාර දිනය වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කරමින් ලොව නන්දෙස සිදුවන ආහාර නාස්තිය සාපරාධී ක්‍රියාවක් වන අතර 'පවුල් ගොවි තැන' පවුල් වර්ධනයෙහි ලා සුවිසල් සේවාවක් කරනා බැව් ප්‍රකාශ කරයි.

'ගොවි පවුල' සමාජ ජීවිත පැවැත්මේ පරමාදර්ශයක් යැයි එතුමා ප්‍රකාශ කරයි. තවද උන් වහන්සේ මෙලෙසින් වදාළහ. 'ගොවි පවුලක් වශයෙන් ඔවුන්ගේ ජීවිත අත්දැකීම් ද. එකාමෙන්ව වැඩෙහි නිරතවීම් ද, සැම දෙයටත් වඩා ආදරය. සංහිඳියාව හා ඉවසා දරා ගැනීම යන ගති ලක්ෂණ තුළින් අපට බොහෝ පාඩම් උගෙන ගත හැකි වනු ඇත. මේ අනුව ස්වභාව ධර්මයේ වස්තූන් උපරිම ඵළ ප්‍රයෝජනයන් ලබමින්, ඒවායේ අනාගත පැවැත්ම, පරම්පරාවෙන් පරම්පරාවට බෙදා හරිනු ඇත.'

පවුල් ගොවි තැන සුරැකීම සඳහා දේශපාලන හවතුන්ගේ සහාය අවැසි බැව් ද ඔවුන්ගේ මෙහෙයවීම තුළින් ස්වභාවික ව්‍යසනයන් වළදී. ගොවියා හා ගොවිතැන යළි පණ ගැන්විය යුතු බැව් ද සසුන් පියාණන් විසින් සනිටුහන් කරනු ලැබීය.

# ඉස්ලාම් රාජ්‍යයට එරෙහිව ජාත්‍යන්තර ජනතාව ක්‍රියා කළ යුතුයි

ඔක්තෝබර් මස 04 වෙනිදා, මැදපෙර දිග රටවලැ ශුද්ධාසන නියෝජිතවරු සහ ජ්‍යෙෂ්ඨ නිළධාරිවරු තුන් දින සාකච්ඡාවක් සඳහා රෝමයට පැමිණියෝය මෙම සාකච්ඡාවේ ප්‍රධාන මාතෘකාව වූයේ, ඉරාකයේ හා සිරියාවේ පවත්නා අති දරුණු සුළුතර ආගමිකයන් භාජනය කරනු ලබන, මහා විනාශකාරි තත්ත්වයයි. එම තුන් දින සාකච්ඡාවෙන් පසුව, හමුව මෙහෙය වූ වතිකාන රාජ්‍ය ලේකම් අතිඋතුම් පියට්රෝ පරෝලින් කාදිනල් හිමියන්ගේ මෙහෙයවීමෙන් ප්‍රකාශයක් නිකුත් කරන ලදි.

එම ප්‍රකාශනයේ මෙලෙසින් ද දක්වා ඇත. 'ඉස්ලාම් රාජ්‍ය හේතුකොටගෙන විශේෂයෙන්, ඉරාකයේ හා සිරියාවේ සිදුවෙන ජීවිත විනාශයන් කෙරෙහි ඇස් යොමා බලා සිටීම පමණක් ජාත්‍යන්තර ප්‍රජාවට කළ නොහැක. තවද කිතුනුවන් ඇතුලු සුලුතර ආගමිකයන් ඒකරාශි කොට ප්‍රසිද්ධියේ මරා දැමීමත්, ඇතැම් අයවලුන් කුරුස ගත කිරීමත් කෙසේ නම් බලා සිටිය හැකිද? එපමණක් ද නොවේ. විශේෂයෙන් කිතුනු ජනතාවන් තම උන්හිටි තැන් හැරපියා පලා යන අයුරු හමුවේ ලෝක ජනතාව කිසිවක් නොකොට නිදි කිරා වැටෙමින් බලා සිටිය හැකි ද?' ප්‍රකාශනයේ තවදුරටත් අවධාරණය කර තිබුණේ, 'ඉස්ලාම් රාජ්‍ය' යුධ බලයෙන් විනාශ කිරීමට යත්න දැරීමෙන්, එයට නිත්‍ය පිළිතුරක් ගෙන දිය නොහැකි හෙයින් විශේෂයෙන්, මුස්ලිම් හා කිතුනු නායකයන්ගේ එකමුතුවෙන් සැබෑ විසඳුමක් අත්කර ගත හැකි බවය.

# පකිස්තානයේ මහාධිකරණය ආසියා බිබීගේ මරණීය දඬුවම තහවුරු කරයි



ඉස්ලාම් දහමට නිගරු කරනු ලැබුවේය යන චෝදනාව මත පකිස්තානයේ පහළ උසාවිය විසින් ආසියා බිබී නම් කිතුනු කාන්තාව මරණ දඬුවම ලැබුමට තීරණය කරනු ලැබුවේ, 2010 වර්ෂයේය. පහළ උසාවියේ තීන්දුවට එරෙහිව කිතුනු නීතිඥයන් විසින් ඉහළ උසාවිය වෙත ඉදිරිපත් කරන ලද ඇපෑල පසුගිය සතියේ විභාගයට ගෙන පහළ උසාවියේ තීන්දුව සනාථ කරනු ලැබු ඇත.

ආසියා බිබී නමැති මෙම කිතුනු කාන්තාව මරණයට පත් කිරීමේ තීන්දුව ආසියාවේ පමණක් නොව ලොව පුරා බොහෝ රටවලැ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකරුවන්ගේ විමසිල්ලට පාත්‍ර වී ඇත. ඉස්ලාම් දහමට නිගරු කරනු ලැබ ඇතැයි යන චෝදනාව කිසිදු ආකාරයකින් ඔප්පු වී නැතත්, අන්තවාදීන්ගේ අනිස බලපෑම් නිසා උසාවිය විසින් ද අගතිගාමී තීන්දුවක් ගෙන ඇතැයි යන්න ප්‍රකට සිද්ධියක් බවට පත්ව ඇත. එම නිසාවෙන් පස් දරු මවක හට දී ඇති එම මරණ තීන්දුව කෙරෙහි ඇතැම් මුස්ලිම් නායකයන් පවා නිර්නාමික වශයෙන් සිය අප්‍රසාදය පළ කොට ඇත.ආසියා බිබීගේ මරණ තීන්දුව අළලා සිය අදහස් පළ කරන ලද මුස්ලිම් ආණ්ඩුකාර වරයෙකු වූ සල්මාන් ටසීර් ද, කතෝලික කැබිනට් ඇමැතිවරයෙකුව සිටි ෂබාස් බාති ද ප්‍රසිද්ධියේ මරා දමන ලදි. අන්තවාදීන්ගේ එවන් සාපරාධී ක්‍රියාකාරකම් නීතිය ක්‍රියාත්මක කිරීමේදී ද අයුතු ලෙසින් බලපා ඇති බැව් නොරහසකි.

ආසියා බිබී, සිරගත කොට ඇත්තේ, තනිවමය. එලෙස සිදු කොට ඇත්තේ, කීප වතාවක්ම ඈ මරා දැමීමට උත්සහායක් ද පැවැති නිසාය. ඉහළ උසාවියෙන් ලද තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කැරුමට කිතුනු නීතිඥයන් සූදානම් වන බැව් ද වාර්තා වේ. ඔවුන් ද එලෙස කරනුයේ මරණ තර්ජන හමුවේය. දේශයේ කිතුනු ජනතාව අතිශය සංතාපයට පත්ව ඇති අතර, ඉස්ලාම්බාද් හී අතිඋතුම් රුෆින් අන්තෝනි රදගුරු තුමන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, ආසියා බිබී ගේ තීන්දුව හදවත් ඉරා දමා ඇති බැවින්, ඈ හා ඇගේ දරුවන් ද ස්වාමි පුරුෂයා ද වෙනුවෙන් නිරන්තරයෙන් යාච්ඤා කළ යුතු බවයි.

# පලස්තීන ඊශ්‍රායල ගැටුමට පිළිතුරු ද්වි රාජ්‍ය යයි වතිකානය දක්වයි

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මංඩලය විසින් මැදපෙරදිග ආරක්ෂක තත්ත්වය සාකච්ඡා කිරිමේදී. ශුද්ධාසන නියෝජිත අතිඋතුම් බර්නාඩිතෝ අවුෂා අගරදගුරු හිමිපාණන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, මෙම රාජ්‍යයන් අතර පවත්නා ගැටුම් වළකාලීමට ඇත්තාවු එකම පිළිතුර, පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීමත්, ඊශ්‍රායලය ද එලෙස ස්වාධීන රටක් ලෙස පැවැතීමත් බවයි.

අතිඋතුම් ආවුෂා අගරදගුරු හිමිපාණෝ, සිරියාවේ සිදුවන සාපරාධයන් නවතාලමින් සාමය උදා කරවීමට ජාත්‍යන්තර මැදිහත් භාවය අවැසි බැව් ද ප්‍රකාශ කළෝය. ශුද්ධාසනයේ රාජ්‍ය ලේකම්, පියට්රෝ කාදිනල් පරොලින් හිමි ද ජාත්‍යන්තර මැදිහත්වීම කල් යල් නොයා ක්‍රියාත්මක කරන්නැයි ඉල්ලා සිටිනා බැව් ප්‍රකාශ කළේය. ඊනියා ඉස්ලාමීය රාජ්‍යයක් වශයෙන් තමන් විසින්ම හුවා දක්වනු ලබන ඉරාකය හා සිරියාවේ කැරෙනා මිනිස් ඝාතනයන් හා පලවා හැරීම් තවදුරටත් සිදු නොවනා බැව් තහවුරු කැරුමට එක්සත් ජාතීන්ගේ සංගමය ද වහා ක්‍රියාකාරි විය යුතු යයි ද වතිකාන නිත්‍ය නියෝජිතයා යළි යළිත් ඉල්ලා සිටි බැව් ද වාර්තා වේ.

# දහස් සංඛ්‍යාත ඉරාක කිතුනුවෝ ජෝර්දානයේ රැකවරණයට

තුන් දහසකට අධික ඉරාක කිතුනුවෝ, ඉස්ලාම් රාජ්‍යයට යටත් නොවී, ජෝර්දානයට ගොස්, එහි වෙසෙනා කිතුනුවන්ගේ සත්කාරය ලබති. මෙලෙස කතෝලික පුවත් වලට කරුණු හෙලි කරනු ලැබුවේ, ජෙරුසලම් හී සහායක රදගුරු වශයෙන් සේවය කරනා මමැරුන් ලාහම් හිමිපාණන්ය. තවත් දින දෙක තුනක් ඇතුළතදී, දහසකට වැඩි ඉරාක කිතුනුවන් ජෝර්දානයට පැමිණෙන බැව් නියත හෙයින්, ඔවුන් හට පහසුකම් සැළැසීමට ජෝර්දාන කිතුනුවන් සූදානම් වෙමින් සිටිනා බැව් ද වාර්තා වේ.

තවද අතිඋතුම් මැරුන් ලාහම් සහයක රදගුරු හිමි මෙලෙසින්ද දක්වා ඇත. 'ජෝර්දානයට පැමිණ ඇති කිසිදු කිතුනුවෙකු ආපසු ජෝර්දානයෙන් යාමට කැමැත්තක් නොමැති අතර, ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ, ඔස්ට්‍රේලියාවට හෝ ඇමෙරිකාවට යාමට වීසා බලපත්‍රයන් ලබා ගැනීමයි.' සහයක රදගුරු තුමන් විසින් තවදුරටත් දක්වනු ලැබුවේ, යුරෝපීය රටවල තානාපති කාර්යාල විසින් ඉරාකය වැනි දේශයන් හී කිතුනුවන්ට වීසා බලපත්‍ර ලබා දුනහොත්, මුළු අරාබි කරය කිතුනුවන් නොමැති දේශයක් බවට පත්වනු ලබන බවයි.

# සසුන් පියා වියට්නාම් කොමියුනිස්ට් අගමැති හමුවේ



අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා, පසුගිය ඔක්තෝබර් මස 18 වෙනිදා, වියට්නාම් කොමියුනිස්ට් රාජ්‍යයේ අගමැති ගුළුන් ටාං ඩං මහතා වතිකානයේදී හමුවිය. අගමැති ගුළුන් ඩිං, වර්ෂ 2005 සිට එරටේ පාලක ලෙස කටයුතු කරයි.

වියට්නාම් අගමැති ඩුං, වතිකානයට පැමිණි දෙවෙනි අවස්ථාව මෙය වේ. අතිශය සංවාදශීලිව අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා හමුවීමෙන් පසුව, ශුද්ධාසනය හා වියට්නාමය අතර සම්බන්ධතාවයන් වර්ධනය කරවීමේ මහඟු පියවරක් උදා වී ඇතැයි යන්න වියට්නාම් කතෝලිකයන්ගේ බලාපොරොත්තුව වේ යයි වාර්තා වේ.

මෙතෙක් මෙම දේශ ද්වය අතර රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ තානාපති සම්බන්ධතා ස්ථාපිත කොට නොමැත. එහෙත් අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ සුහද සංහිඳියා ද්වි පාර්ශ්වික අදහස් හුවමාරුව තුළින් වැඩිකල් නොයා තානාපති වරුන් පත් කිරිමක් සිදුවිය හැකි යයි ද ප්‍රකාශිතය. එවන් අරමුණු අරබයා, කතෝලික සභාව විසින් වියට්නාම් දේශයේ අභිවෘද්ධිය සඳහා කිනම් ආකාරයේ දායකත්වය ලබා දිය හැකි ද යන්න පිළිබඳව සසුන් පියා හා වියට්නාම් අගමැති අතර අදහස් හුවමාරුවක් විය.

තවද 2013 නව ව්‍යවස්ථාව ප්‍රකාර කතෝලික සභාවට ලබා දී ඇති ආධාර උපකාරයන් ගැන ද සසුන් පියා සිය ගෞරවාදරය ප්‍රකාශ කළේය. කොමියුනිස්ට් පාලන සමයේදී සභාව කෙරෙහි වූ ඇතැම් බාධක ඉවත් කැරුමට ද අගමැති තුමන් විසින් එකඟත්වය පළ කරනු ලැබීය.

# ලොව දෙමාපිය රැකවරණය නැති දරුවෝ 70% කි

යුක්‍රේනියාවේ කතෝලික සභා නායක අතිඋතුම් සව්ලාටොස්ලේ ෂෙව්ෂු කි රදගුරු හිමිපාණන් විසින්, වතිකාන ගුවන් විදුලිය ඔස්සේ ප්‍රකාශ කරනු ලැබුවේ, ලොව වෙසෙනා සකල දූ දරුවන්ගේ සංඛ්‍යාවෙන් සියයට 70 ක් දිවි ගෙවනුයේ සිය දෙමාපිය රැකවරණය නොමැතිව බවයි. තවද මෙම දූ දරු ප්‍රශ්නය, නව මිනිස් ව්‍යසනයක් යැයි ද එතුමෝ අවධාරණය කළ සේක.

එම නිසාවෙන් මෙම දූ දරුවන් නගා සිටුවීමේ දැවැන්ත කාර්ය ඉටුකිරිම කතෝලික සභාවේ මෙහෙවර විය යුතු බැව් ද එතුමන් විසින් පෙන්වා දෙනු ලැබීය. ඔවුන්ට අහිමි වූ මව්පිය සෙනෙහස තමන්ගේ දූ දරුවන්ට නම් ලබා දිය යුතුය යන්න පිළිබඳ ඔවුන් හැඩ ගැස්සවීමේ භාර දූර කාර්යය ලෝ පුරා කතෝලික සභාව විසින් ඉටුකළ යුතුව තිබෙනවා යන්න පෙන්නා දෙන ලදී. මේ අනුව කතෝලික සභාව විසින් උගන්වනු ලබන විවාහය හා බැඳි ඒකත්වය ලෝ පුරා නව මං ඔස්සේ ක්‍රියාත්මක කරවීම ද වැඩි වේගයකින් ක්‍රියාත්මක කළ යුතු බැව් ද අවධාරණය කරනු ලැබීය.

# ඉරාකයේ දහම් ගුරුවරුන්ට හය වසරක සිර දඬුවමක්

ඉරාකයේ දහම් ගුරුවරුන් තුන් දෙනෙක් විසින් ගෘහස්ත යාච්ඤා මෙහෙයන් සංවිධානය කිරීමේ වරදට මෙම සිරදඬුවම් නියම කරනු ලැබ ඇතැයි කතෝලික පුවත් වාර්තා කරයි; බේනාම් ඉරාකි, මතියස් හේන්ජාඩ්, සජාන් රබ්බාති යන මෙම දහම් ගුරුවරුන් තිදෙනා විසින් තමන්ට එරෙහි නඩු තීන්දුවට විරුද්ධව ඇපෑලක් ඉදිරිපත් කැරුමට කටයුතු සලසා ඇත. කිතුනු නීතිඥයන්ගේ සහාය ඔවුන්ට අනිවාර්යයෙන්ම ලැබෙනු ඇත.


වර්ෂ 2011 දී. ඉරානි නම් දහම් ගුරුවරයා විසින් රාජ්‍ය බළධාරීන්ට එරෙහිව ක්‍රියා කරනු ලැබුවේ යයි යන චෝදනාවට මරණ දඬුවම නියම වී තිබිණි. එහෙත් මහාධිකරණයට කරන ලද ඇපෑලයේදී එම මරණ දඬුවම ලිහිල් කරනු ලැබ ඇත. කිතුනුවන් පීඩාවන්ට පත් කරනු ලැබීම හා දහම් ගුරුවරුන් සිරගත කැරුම ආගමික නිදහස තහවුරු කරනු ලබන ජාත්‍යන්තර එකඟතාවයන්ට එරෙහි බැව්, ලෝක සහෝදරත්වයේ සංවිධානය විසින් තහවුරු කරනු ලබයි.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

# දියමන්ති වසරට ළඟා වන නුවර දෙව්සත්හල





යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**186**

**පසුගිය සතියෙන්...**

ලංකා අප ස්වාමිදූගේ ජාතික දෙව්සත්හල නිල වශයෙන් අරඹන ලද්දේ ක්‍රි.ව. 1955 සැප්තැම්බර් මස 10 වැනි දා ය. එදින පැවැත්වුණු ගාම්භීර උත්සවයට එකල දිවයිනේ පදවි බාර රදගුරු හිමිවරු සියලු දෙනා ම සහභාගි වූහ. සලාපුර අති උතුම් එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන්ට පමණක් සහභාගි විය නොහැකි වූ නමුත් උන්වහන්සේ නියෝජනය කරන්නට එහි අනුනායක මාහිමි මයිකල් පෙරේරා පියතුමන් එවන ලදි.

එදා දෙව්සත්හල් ගොඩනැගිලි අදත් දක්නට ලැබෙන බලකොටුවක ස්වරූපය දරණ රතු ගොඩනැගිලි කොටසට සීමා විය. පැමිණි සිසු කණ්ඩායම් අනුව එය දෙකට බෙදන ලදි. පෙරටුවෙන් පිහිටා ඇති කළුගල් දෙව්මැඳුර හා ඊට ආසන්න කොටස පදවි පූජකවරයට පුහුණුව ලබන සිසුන් සඳහා වෙන් කරන ලද අතර ඇතුළු වන පෝටිකෝවෙන් ඔබ්බට පිහිටි කොටස නිමල මරිය නිකායේ සොහොයුරන් සඳහා වෙන් විය. මේ කණ්ඩායම් පොදු ආගමික කටයුතු (දිව්‍ය පූජාව වැනි) සඳහා මෙන් ම අධ්‍යාපන පංති සඳහා ද එක් වූ නමුත් සෙසු කටයුතු වෙන් වෙන් ව කැර ගත්හ.

නව දෙව්සත්හලට ඇතුලු වූ මුල් සිසු පිරිස අතර ප්‍රධාන කොටස වූයෙ කොළඹ බොරැල්ලේ සා. බර්නාඩ් දෙව්සත්හලේ ඉගෙනීම ලබමින් සිටි ගරු සහෝදර පිරිසයි. දෙවැනි කණ්ඩායම නිමල මරිය නිකායේ කොහුවල දෙව්සත්හලේ සිටි ගරු සහෝදර පිරිසයි.

මේ අතරට පේපල් දෙව්සත්හලෙන් පූනේ දෙව්සත්හලට නොගිය ගරු සහෝදරතුමන් ස්වල්ප දෙනා ද පූජක පුහුණුව ඇරඹීම සඳහා දිවයිනේ රදගුරු වසම් හයෙන් ම පැමිණි නව සිසු පිරිස ද වූහ.

මෙ වැනි විවිධත්වයකින් යුත් පිරිසක් එක්සේසත් කිරීම පහසු කාරියක් නොවනු ඇතැයි සිතුවත් දේව වරප්‍රසාදයෙන් එය ඉටු වූයේ පුදුමාකාර අන්දමට යි.

නව දෙව්සත්හලේ ප්‍රථම අධ්‍යක්‍ෂ පියතුමා වූයේ අති ගරු ෆ්‍රෙඩික් ඩිවයිට් සැකට් නි.ම.නි. පියතුමා ය. මෙ තුමා එක්සත් ජනපදයේ ටෙක්සාස් හි වැසියෙකි. වියත් බහුශ්‍රැත පියතුමකු වූ මෙතුමා විවිධ හැකියාවන්ගෙන් පූර්ණ දුර්ලභ ගණයේ පුද්ගලයෙකි.

නව දෙව්සත්හලේ පරිපාලනය නිමල මරිය නිකායට පවරන ලද හෙයින් එතුමා මෙන් ම ප්‍රථම ආචාර්ය මණ්ඩලය ද එම නිකාය පැතිර සිටි විවිධ රටවලින් මෙහි කැඳවන ලදි. එක්සත් ජනපදය (ඇමරිකාව) ප්‍රංසය, ඉතාලිය, නෙදර්ලන්තය මේ අතර විය. එලෙස ම දිවයිනේ මනා පළපුරුද්දක් ඇති වියත් ගරු පියතුමන් කිහිප දෙනකු ද පත් කරන ලදි. මේ අතර සා. බර්නාඩ් දෙව්සත්හලේ අධිපතිව සිටි ගරු මාටින් ගුණරත්න පියතුමා උප අධ්‍යක්‍ෂ වශයෙන් ද යාපනය රදගුරු වසමේ අනුනායකව සිටි ගරු ගුරු ස්වාමි පියතුමා ද දිගු කලක් යාපනයේ සා. පැට්‍රික් මහා විදුහලේ අධ්‍යක්‍ෂව සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල සේවාවක් ඉටු කළ ගරු චාල්ස් සෝබ්‍රි මැතිව්ස් පියතුමා ද වූහ.

දෙව්සත්හලේ නි.ම.නිකායේ සහෝදරවරුන් බාරව සිටියේ කලක් එහි ප්‍රාදේශාධිපති වූ ගරු බිසියැන් පියතුමා ය. දේව ධර්මය සහ දර්ශන විද්‍යාව හැදෑරීම සඳහා ඉහත සඳහන් නේවාසික පිරිස් මෙන් ම බාහිර සිසු පිරිසක් ද වූහ. මේ පිරිස සිල්වෙස්ත්‍රෝ - බෙනදිකාන නිකායේ පූජක පුහුණුව ලබන සහෝදරතුමන්ය. ළඟපාත "මොන්ටෙෆානෝ" හි පදිංචිව සිට, මෙම සහෝදරතුමන් දිනපතා පාඩම් මාලාවනට සහභාගි වනු වස් දෙව්සත්හලට පැමිණියහ.

දෙව්සත්හල විවෘත කිරීමේ උත්සවය එදින, හෙවත් 1955 සැප්තැම්බර 10 වැනි දා ඉතා උත්කර්ෂවත් ලෙස ආරම්භ වූයේ දෙව්මැඳුර තුළ පවත්වන ලද දිව්‍ය පූජාවෙන් ය. අති උතුම් තෝමස් කුරේ අගරදගුරු (එවකට) හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් එය පවත්වන ලදි. පැමිණ සිටි රදගුරු හිමිවරු සියලු දෙනාම එයට සහභාගි වූහ. එහිදී දේශනය පවත්වන ලද්දේ ත්‍රිකුණාමලේ රදගුරු අති උතුම් ඉග්නේෂස් ග්ලෙනි හිමිපාණන් විසිනි. ඉනික්බිති එවකට ප්‍රධාන රැස්වීම් ශාලාව ලෙස පරිහරණය කෙරුනු "අවුලා මාඤ්ඤ" (මහා ශාලාව) තුළ සියල්ලෝ රැස්වූහ. එදින වැඩකටයුතු ආරම්භ වූයේ දෙව්සත්හලේ ගීතිකා කණ්ඩායම ගැයූ ගීතිකාවෙන් ඉක්බිති ගරු ඩබ්. දොන් සිල්වෙස්ටර් සහෝදර තුමන් (පසුව රදගුරු) විසින් මෙහෙයවන ලද දෙව්සත්හල් වාද්‍ය වෘන්දය පැවැත්වූ සුමිහිරි වැඩසටහනකින් පසුව යි.

මෙහිදී විධිමත් රැස්වීම ආරම්භ කරමින් එවකට නි. ම. නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු ජෙරාඩ් ෆෝටයින් පියතුමා නව දෙව්සත්හල ස්ථාපිත කිරීමේ සන්නස කියවා ප්‍රකාශයට පත් කළේ ය. එසේ ම නව අධ්‍යක්‍ෂ පියතුමන් එම නිලයට පත් කිරීමේ ලිපිය ද කියවා ප්‍රකාශයට පත් කළේ ය.

නව අධිපති පියතුමා සිය දෙසුමේ දී තමා මේ නිලය ඉතා බැගෑපත්ව පිළිගන්නා බවත් එහෙත් වැඩි කල් නොගොස් මෙහි වගකීම් බාරගෙන කටයුතු කරනු වස් මුළු ආචාර්ය මණ්ඩලය ම දේශීය පූජක පුතුන්ගෙන් ම සමන්විත වනු දැකීම තමන් ගේ අපේක්ෂාව බවත් ප්‍රකාශ කළේ ය. මේ අපේක්ෂාව අද ඉටු වී තිබේ.

අතිගරු සැකට් පියතුමන් ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ම පත් වූයේ මරිය නිකායේ දේශීය අතිගරු ඩැල්ස්ටන් ෆෝබ්ස් පියතුමා ය. එතුමාගෙන් පසුව පත් වූ අධ්‍යක්‍ෂ පියවරු සියල්ලෝම දේශීය පියවරු වෙති. අද එහි අධ්‍යක්‍ෂ ධුරය දරන්නේ අතිගරු එල්මෝ ඩයස් පියතුමා ය. මුළු ආචාර්ය මණ්ඩලය ම දේශීය ගරු පියවරුන්ගෙන් සමන්විත යි.

විවෘත කිරීමේ මංගලෝත්සවය නිම කරමින් සභාව අමතා කතා කළේ අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන් ය. කතාව නිම කරමින් උන්වහන්සේ ප්‍රතිඥාවක් දුන්හ. තේවත්තේ බැසිලිකා දෙව්මැඳුරේ පූදසුන (අල්තාරය) පිටුපස ඉහළින් තබා ඔටුනු පළඳන ලද දේව මාතා ප්‍රතිමාව ප්‍රථමයෙන් තබන ලද්දේ මට්ටක්කුළියේ කාර්මෙල් කන්‍යාරාම දෙව්මැඳුරේ දීය. එය එතැනින් ගෙනැවිත් ජාතික දෙව්සත්හලේ දෙව්මැඳුරේ පූජාසනය පිටුපස ඉහළින් ඇති ප්‍රධාන බිත්ති කුහරයේ තාවකාලිකව ස්ථාපිත කරනබව ඒ ප්‍රතිඥාව ය. මෙම ප්‍රතිමා වහන්සේ නුවරට ගෙනා අවස්ථාවට සහභාගි වනු වස් අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණෝ ද එහි පැමිණියහ. බැසිලිකා දෙව්මැඳුර කැපකිරීමත් සමඟ දේවමාතා වහන්සේගේ ප්‍රතිමාවට ඔටුනු පළඳවන ලදි. ඔටුනු පළඳවන ලද්දේ නුවරින් මෙහි වැඩම කරවන ලද එම ප්‍රතිමාවට යි.

ක්‍රි.ව. 1972 දී ජාතික දෙව්සත්හලේ පරිපාලන කටයුතු නි.ම.නිකායෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල වෙත පූර්ණ ලෙස පැවැරිණි. එතැන් සිට එක් අධ්‍යක්‍ෂ පියතුමකු හැර අන් අධ්‍යක්‍ෂ පියවරුන් සියලු දෙනා ම පදවි පූජකවරුන්ය මෙම අධ්‍යක්‍ෂ පියවරුන් තිදෙනකු ඇතුළුව එම ආචාර්ය මණ්ඩලයේ නිල දැරූ ගරු පියවරුන් සත් දෙනකු මේ වන විට රදගුරු පත්වීම් ලබා තිබේ.

ජාතික දෙව්සත්හල ද අන්තර්ජාතික වශයෙන් පිළිගත් සරසවියකි. රෝමයේ උර්බානෝ සරසවියට අනුබද්ධව දර්ශන ශාස්ත්‍රය සහ දේව ධර්මය පිළිබඳ ප්‍රථම උපාධි පිරිනැමීම සඳහා එය අනුමැතිය ලබා ඇත. මෙම අනුබද්ධ කිරීම් පිළිවෙලින් සිදුවූයේ 1976 සහ 1968 දී ය.

සිසුන් සංඛ්‍යාව වැඩිවීමත් සමඟ පුහුණුව වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීමේ අපේක්ෂාවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකොට දර්ශනවාදය හදාරන සිසුන් වෙන් කරන ලදි. මෙහි ප්‍රථම අධ්‍යක්‍ෂ පියතුමා වූයේ අද කුරුනෑගල රදගුරු තැන්පත් අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් ය. ඉකුත් වසර 59 තුළ ජාතික දෙව්සත්හලෙන් ගරු පූජාප්‍රසාදින් වහන්සේලා 1250 ට අධික පිරිසක් දිවයිනට දායාද කර ඇත. මේ අතර 18 දෙනෙක් රදගුරු වරම් දරත්. අද දිවයිනේ සේවාවෙහි යෙදී සිටින පැවිදි නිකායන් දහයකට වැඩි ප්‍රමාණයක පූජක සිසුවෝ ද මෙහි ඉගෙනීම ලබති.

ඉතා අලංකාර පරිසරයක පිහිටා ඇති මෙමම දෙව්සත්හල මෙ රට කතෝලික පිරිස දෙවිඳුන්ගෙන් ලද මහගු දායාදයක් බව කිසිදු සැකයක් නැත.





# සිංහල ජන කවියේ කිතුනු අනුලකුණ

## ආචාර්ය දොන් පීටර් පියතුමා

වියත් පඬිරුවනක් සහ කෘතහස්ත ලේඛකයකු වූ මෙතුමන් රචනා කළ කිතුනු සුභාෂිතය 1997 දී එළි දක්වන ලද අනර්ඝ වූ කාව්‍යමය ධර්මෝපදේශයකි. අලගියවන්න මුකවෙටි කාව්‍ය ආචාරින්ගේ සුභාෂිතය ඇසුරෙන් නිර්මාණය කෙරුණු එය අධ්‍යයනයට හෝ ඇගයීමට ලක් වී නොතිබීම කණගාටුවට කරුණකි. ඉන් කවියක් උපුටා දක්වමි.

තුන් තෙම වුවද එක දෙවිඳුන් වන ඔබ
දුන් මේ ලොවට දෙවන තෙම අස්නක්ය සුබ
පුන් දෙව් බල තිබෙද්දී මනු කය ද ලැබ
වන් මෙලොවට ජේසු නමදිමි, පුතුන් ඔබ

## ජේම්ස් ද අල්විස් කවියා

1823 උපන් බෙන්තොට, තංගල්ල ප්‍රදේශයේ විසූ නීතිඥයකු ගත් කතුවරයකු සහ කවියකු වූ මෙතුමා භක්තිවන්ත කතෝලිකයකු විය. 1996 දී ඔහුගේ කෘතින් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කෙරුණි. ශුද්ධ බයිබලය මත පදනම් වූ කවි ලියන්නට ඔහු දැක්වූ රුචිකත්වය අගැයීමකට ලක්ව නැත. කවියෙන් ඔහු කළ සංවාද බොහෝ ය. ඒ පිළිබඳව මහාචාර්ය සෙනරත් පරණවිතානයන් ද අදහස් දක්වා ඇත.

විලියම් කූපර්ගේ A Reflection on Death, ඇලෙක්සැන්ඩර් පෝප්ගේ On Criticism , ඔලිවර් ගෝල්ඩ්ස්මිත්ගේ On Woman යන කවි පන්තිවල සිංහල අනුවාද සැකසුණේ මෙතුමන් අතිනි. කොළඹ සිට මාතර දක්වා වන රමණීය ගමන් මඟ පිළිබඳ එතුමන්ගේ රචනය ඔලිවර් ගෝල්ඩ්ස්මිත්ගේ ද ට්‍රැවලර් නම් කෘතියේ ආභාෂය ලැබූවකි. උම්මග්ග ජාතකයේ එන කතාවක් එතුමන් කවියට පෙරලුවේ කිතුනු දහමේ සහ බෞද්ධ දහමේ ඇතැම් ධර්ම සාරයන් සංසන්දනාත්මකව බලමිනි.

## අමතර නිර්මාණ

සිංහල කවි සාහිත්‍යයේ හටන් කවි සාහිත්‍ය සමයේ ලියැවුනු බව සැලකෙන "සිල්වෙස්ත්‍රි මුනිඳුන්ගේ ජීවිත කතාව", "කොන්තමාලය" වැනි කාව්‍ය නිර්මාණ ගැන අප අතර ඇත්තේ අල්ප දැනුමකි. මේවා ගැන අද අප කියවන්නේ සහෘද ලබ්ධිකයින්ගේ පොත් වලින් මිස අප විසින් රචිත පොත්වලින් නොවේ. කොළඹ යුගයේ කිතුනු කවි සාහිත්‍යයක් ගොනු කිරීම සහ දියුණු කිරීම අවශ්‍ය බව ද යෝජනා කරමි.

සිරි ගුණසිංහයන්ගෙන් කඩඉම් වන නිසැඳස බොහෝ විට අපේ පුවත්පත්වල භාවිත කරනු දක්නට ඇත. එහෙත් නිසඳෙහි නැති සඳෙස් හා සම්බන්ධ වන කාරණා ගැන දැනගෙන මේවා ලියන්නේ නම් අගනේ ය. සාහිත්‍යමය ඕලීන බවක් අප වෙලාගෙන ඇති බවක් පෙනේ. මෙය නිවැරදි විය යුතුය.

## සිංහල ජන ගී සංරක්ෂණයෙහි ලා කිතුනු දායකත්වය

සිංහල ජනකතා සහ ජන කවි විශ්ව සාහිත්‍යයේ කොටසක් කිරීමේ ගෞරවය හිමිවන්නේ දේශයේ ලේඛකයන්ට වඩා විදේශීය ජාතිකයන්ට ය. ඔවුහු කිතුනුවෝ වූහ. එපමණක් ද නොවේ. ඔවුන් අපගේ නිර්මාණ එකතු කළේ නැතිනම් ඇත්තෙන්ම ඇතැම් ජන ගී අද අප අතරින් අතුරුදන්ව තිබෙන්නට ඉඩකඩ තිබුණි. පී. ඇම්. සේනාරත්න මේ පිළිබඳව මෙසේ අදහස් දක්වයි.

සිංහලයන්ගේ ගැමි කතා, කවි ආදිය විශ්ව සාහිත්‍යයට ඇතුළු කිරීමට දැරූ ප්‍රයත්නයෙහි ගෞරවය වැඩිපුර ම හිමිවන්නේ විදේශීය උගතුන්ට ය. සිංහල ජනකතා එකතුවක් එච්. පාකර් මහතා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. වෙස්ලියස් මීසමේ ජෝන් කැලවේ පියතුමා යක් තොවිල්වලට සහ කෝලම්වලට සම්බන්ධ කවි රැසක එකතුවක් ලන්ඩන් නුවර දී ප්‍රකාශයට පත් කළේ ය. ජන කවි සංරක්ෂණයේ මුලින් ම ලාංකිකයන්ගේ ගෞරවයට පාත්‍ර වන්නේ බ්‍රිතාන්‍ය පාලකයකු වන හියු නෙවිල් ය.

මහාචාර්ය තිස්ස කාරියවසම් ඇදුරුතුමන් ලන්ඩනයට ගොස් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ මානව විද්‍යා අංශයෙහි මාස දහයක් පුරා මේ පිළිබඳව හැදෑරුවේ ය. හියු නෙවිල් 1897 දී ලංකාවෙන් ගෙන ගිය පුස්කොළ පොත් ප්‍රමාණය 2227 ක් බව සඳහන් වේ.

ඒවායින් හයසියයකට වැඩි ප්‍රමාණයක් පිටපත් කොට ගෙන පැමිණ අප වෙත එම සම්ප්‍රදාය උරුම කර දුන්නේ මහාචාර්ය තිස්ස කාරියවසම් ය. එතුමන්ගෙන් මා පෞද්ගලිකවම විමසා දැනගත් කරුණු බොහොමයකි. එතුමන් පිටපත් කරගෙන ආ කවි අතර පී. ඇම්. සේනාරත්න ඉහත පොතෙහි සඳහන් කරන කවි සංඛ්‍යාව විශාල ය. - නිමි -

✍ **ගරු සිසිල් ජෝයි පියතුමා**

(කොළඹ හා. ජුසේවාස් දේව ධර්ම නිකේතනයේ දස වැනි උපාධි ප්‍රදානෝත්සවය "විද්වත් සමාස දෙසුම")

# මූලධර්මවාදය සහ ත්‍රස්තවාදය-2



**කිතුනුවෙකුගේ ප්‍රධාන වගකීම වනුයේ ක්‍රිස්තුන් වහන්සේගේ දෘෂ්ටි කෝණයෙන්, උන්වහන්සේගේ ඇස් දෙකෙන් ලෝකය දෙස බැලීමයි. නමුත් කිතුනු මූලධර්මවාදීන් උන්වහන්සේගේ ඇස් දෙකෙන් වර්තමාන ලෝකයේ තත්ත්වය දෙස බැලීමට අසමත් වී ඇත.**

මිහිතලයේ අසරණයන්ගේ දුකට සංවේදීවීමට අසමත් වී ඇත. මේ සඳහා මෑත ලෝක ඉතිහාසයෙන් කදිම උදාහරණයක් දැක්විය හැකිය. 1960 ගණන් වල සිට 1990 ගණන් දක්වා ලතින් ඇමරිකානු රටවල් වල පැවති හමුදා පාලනයන්ට සහ ඒකාධිපතිවරුන්ට සම්පූර්ණ සහයෝගය සහ මූල්‍ය ආධාර සපයන ලද්දේ ඇමරිකානු මූලධර්මවාදී කණ්ඩායම් විසිනි. එපමණක්ද නොව, එම ජනතා විරෝධී, ක්‍රිස්තු විරෝධී පාලකයන්ගේ ප්‍රතිපත්ති සාධාරණීය කරන ලද්දේ මූලධර්මවාදී කණ්ඩායමකිය. බ්‍රසීලය, ආර්ජන්ටිනාව, නිකරගුවා, පේරු, චිලි, හොන්ඩුරාස්, මෙක්සිකෝව, කොලොම්බියා, කියුබාව, වෙනිසියුලාව, මානගුවා, යනාදී ලතින් ඇමරිකානු රටවල දුෂ්ට ඒකාධිපති පාලකයින්ට හැම ආකාරයෙන්ම සහයෝගය පළ කරන ලද්දේ ක්‍රිස්තියානි මූලධර්මවාදී කණ්ඩායමකිය.

ලංකාවේ සිටින ක්‍රිස්තියානි මූලධර්මවාදී ලිං මැඩියන් සහ කක්කුට්ටන් මේ කාරණය ගැන අවදියෙන් සිටින බවක් නොපෙනේ. ඔවුන් තමන් අයිති ක්‍රිස්තියානි කණ්ඩායම් වෙනත් රටවල සිදුකර ඇති ක්‍රියාවන් විවෘත මනසකින් යුතුව අධ්‍යයනය කරන්නේ නම් ඉහත කාරණය ඉතා පහසුවෙන් වටහා ගත හැකිය. ඇමරිකානු සහ බටහිර බහු ජාතික සමාගම් වල ක්‍රියාකාරීත්වය ලතින් ඇමරිකානු රටවල ස්ථාපිත කිරීම සඳහා ජනතාව අතර මතවාදයක් සකස් කිරීමට මෙම මූලධර්මවාදී කණ්ඩායම් විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී.

බහුජාතික සමාගම් සහ ඒකාධිපතිවාදී පාලකයන් නිසා දුක් විඳින ජනතාවගේ විචාරශීලී චින්තනය මොට කර දැමීම එම මූලධර්මවාදී කණ්ඩායම් වල ප්‍රධාන පරමාර්ථය විය. දුප්පත් ජනතාව රාජ්‍ය විරෝධී කටයුතු වලින් ඈත් කර තැබීම සඳහා ඔවුන්ව මූලධර්මවාදී කණ්ඩායම් වලට බඳවා ගන්නා ලදී. ඔවුන්ට වැඩි උගත්කමක් නැති නිසා ඔවුන්ගේ මනස විකෘති කිරීම පහසු කටයුත්තක් විය.

දුප්පත් පොහොසත් පරතරය, සුරාකෑම, මානව හිමිකම් උල්ලංඝනය වීම, කාන්තා පීඩනය, සමාජ අසාධාරණය. පරිසර දූෂණය, බහු ජාතික සමාගම්, හමුදාකරණය, දූෂිත දේශපාලකයන්ගේ ක්‍රියාකාරීත්වයන්, ඇමරිකානුකරණය යනාදී දැවෙන ප්‍රශ්න ගැන අදට පවා කිසිදු මූලධර්මවාදී කණ්ඩායමක් කිසිදු හඬක් නගන්නේ නැත. ඉහත සඳහන් කළ දැවෙන ප්‍රශ්න සම්බන්ධයෙන් යම් හඬක් නගන්නේ කතෝලික සභාව, ලංකා සභාව වැනි ප්‍රධාන පෙළේ සභාවන් පමණි.

මූලධර්මවාදීන්ට සැඟවුණු න්‍යාය පත්‍රයක් ඇති බව එයින් පැහැදිලි වේ. ක්‍රිස්තුන් වහන්සේ ගැන ඔවුන් නාමිකව කතාකළත් ඔවුන් බොහෝ දෙනෙක් සැබවින්ම වන්දනාමාන කරන දෙවියන් නම් ධනය. බලය සහ කීර්තියයි. ජේසුස් වහන්සේ 'මමෝනා' (Mamona) යන අරමයික් වචනයෙන් හඳුන්වන ලද්දේ මෙම ප්‍රවනතාවයයි. ක්‍රිස්තුන් වහන්සේට සැබවින්ම සාක්ෂි දරන්නා දුගී දුප්පත් අසරණයන්ට එරෙහිව සිදුවන සෑම අසාධාරණයකටම, අයුක්තියකටම එරෙහිව හඬක් නගයි. එමෙන්ම දුප්පතුන්ව පීඩාවට පත් වෙන කිසිදු ක්‍රියාවකට සහයෝගය නොදක්වයි.

සෑම ආකාරයකම මූලධර්මවාදී ප්‍රවනතාවයන් මානව සංහතියේ ප්‍රගමනයට අහිතකරය. දැනට ලංකාවේ හිසඔසවමින් පවතින සිංහල බෞද්ධ මූලධර්මවාදය මෙන්ම, ලෝකය පුරා සීඝ්‍රයෙන් පැතිර පවතින ඉස්ලාම් මූලධර්මවාදයත්, දැනට ඉන්දියාවේ පවතින හින්දු මූලධර්මවාදයත්. එමෙන්ම ලෝකයේ සමහර ස්ථානවල ශක්තිමත් වෙමින් පවතින ක්‍රිස්තියානි මූලධර්මවාදයත්, සමහර රටවල පවතින මාක්ස්වාදී මූලධර්මවාදයත්, මානව සංහතියට විශාල විනාශයක් කරමින් සිටියි.

සෑම ආගමික සම්ප්‍රදායක් තුළම පවතින කේන්ද්‍රීය ඉගැන්වීම් (Core Teachings) ගවේෂණය කොට, ඒවාට අනුව තම ජීවිතය සකස් කොට ගෙන, ඒ තුළින් සමස්ත මානව වර්ග යාටම ආශිර්වාදයක් වීම සෑම බැතිමතකුගේම සැබෑ කැඳවීමයි. සෑම කිතුනුවෙක්ම ජීවත්විය යුත්තේ කිතුනු නොවන පුද්ගලයන්ටද ආශිර්වාදයක් ලෙසය. සෑම මුස්ලිම් භක්තිකයෙක්ම ජීවත් විය යුත්තේ මුස්ලිම් නොවන ජනතාවටද ආශිර්වාදයක් ලෙසය. එමෙන්ම සෑම බෞද්ධයෙක්ම තමනගේ ජීවිතය ගත කළ යුත්තේ බෞද්ධ නොවන අයටද ආශිර්වාදයක් ලෙසයි. සෑම හින්දු භක්තිකයෙක්ම තම ජීවිතය සකස් කර ගත යුත්තේ හින්දු නොවන අයටද ආදර්ශයක් ලෙසටයි.

මූලධර්මවාදියෙක් දැනුවත්ව හෝ නොදැනුවත්ව තමන් නියෝජනය කරන දහම ලෝකය ඉදිරියේ සැහැල්ලුවට ලක් කරයි. අවමානයට ලක් කරයි.

කිතුනුවෙකුගේ ප්‍රධාන කැඳවීම සහ වගකීම වනුයේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ඇස් දෙකෙන්, උන් වහන්සේගේ දෘෂ්ටි කෝණයෙන් වර්තමාන ලෝකයේ පවතින තත්ත්වය දෙස බැලීමය. වර්තමාන ලෝකයේ තත්ත්වය අපක්ෂපාතීව, ගැඹුරින් සහ පූර්ව නිගමන වලින් තොරව විග්‍රහකර ගන්නේ නැතිව ක්‍රිස්තුන් වහන්සේට සැබෑ ලෙස සාක්ෂි දැරිය නොහැකිය.

ක්‍රිස්තු අනුගාමිකයෝ මනෝ ලෝකයක, ෆැන්ටසි ලෝකයක, තමන්ටම සුවිශේෂ වූ අතිශයින්ම පෞද්ගලික ලෝකයක සිරවී ජීවත් නොවෙති. වර්තමාන ලෝකයේ පවතින සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ ආගමික යථාර්ථයන් ඉතා පුළුල් ලෙස අර්ථකථනය කරමින්, ඒවා වඩා යහපත් කිරීමට, මානුෂික කිරීමට සහ පරිවර්තනය කිරීමට උත්සාහ දරමින්, දෙවියන් වහන්සේගේ රාජ්‍යය උදා කර ගැනීමට දායක වීම ද ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමේ කාර්යභාරයේ කොටසකි.

ඒ අනුව මිහිතලයේ අසරණයන්ගේ, පීඩිතයන්ගේ, සමාජයෙන් කොන්වූවන්ගේ, දුගී දුප්පතුන්ගේ තත්ත්වය ගැන විශේෂ සංවේදීභාවයකින් ජීවත් වීම කිසිම කිතුනුවෙකුට පැහැර හැරිය නොහැකිය. ජේසුස් වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයෙක් වීමට අපට ආරාධනා කරන්නේ උන්වහන්සේගේ ජනතාව වෙනුවෙන් අපගේ ජීවිත පූජා කිරීමටය, කැප කිරීමටය. මේ ලෝකය වඩා යහපත්, දැහැමි, සාධාරණත්වය රජයන ලෝකයක් බවට පත් කිරීමට සෑම කිතුනුවෙක්ම දායක විය යුතු වේ. එයින් අපට කිසිසේත්ම පළා යා නොහැකිය.

මූලධර්මවාදියෙක් දැනුවත්ව හෝ නොදැනුවත්ව තමන් නියෝජනය කරන දහම ලෝකය ඉදිරියේ සැහැල්ලුවට ලක් කරයි. අවමානයට ලක් කරයි. එමගින් එම දහම නිවැරදිව නියෝජනය කරන්නන්ව පවා අපහසුතාවයට පත් කරයි. මූලධර්මවාදියා අන්‍යයන්ට බරකි, වදයකි. නමුත් මෙම කාරණය පවා ඔවුන්ට තේරුම් ගැනීමට අපහසුය, දුෂ්කරය. හේතුව ඔවුන්ට තමන්ගේ සිතුවිලි, අදහස් උදහස්, මතිමතාන්තර, සිතුම් පැතුම්, ක්‍රියාවන්, හැසිරීම් රටාවන් ආදිය දෙස ඉතා ගැඹුරින්, අවංකව, නිහතමානීව සහ ප්‍රඥාවන්තව බැලීමේ හැකියාවක් නොමැති වීමයි.

බයිබලයෙන් තෝරා ගත් පාඨයක් කිහිපයක් කට පාඩම් කරගෙන ගිරව් මෙන උච්චාරණය කිරීම ඉතා පහසු කටයුත්තකි. නමුත් ගැඹුරු ස්වයං විශ්ලේෂණයකට තමාව භාජනය කිරීම පහසුවෙන් කළ හැකි කටයුත්තක් නොවේ. බයිබලයේ පාඨයන් කිහිපයක් කටපාඩම් කර වැමෑරීමට ශුද්ධාත්ම අනුග්‍රහයක් අවශ්‍ය නැත. ගිරවුන් තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියා කරන්නේ නැත. නමුත් ස්වයං විග්‍රහයකට, ස්වයං අවදිවීමකට. ඉතා ප්‍රබල ශුද්ධාත්ම අනුග්‍රහයක් අවශ්‍යය.

ශාන්ත අගුස්තීනු තුමා, අවිලාහි තෙරේසා තුමිය, ලිසියේ තෙරේසා තුමිය, ගරු තෝමස් මර්ටන් පියතුමා (Fr. Thomas Merton) යනාදීන් තම ජීවිත ගැඹුරින් විශ්ලේෂණය කර තම ජීවිත චාරිකාවන් ලියන ලද්දේ ශුද්ධාත්ම වරප්‍රසාදයේ ප්‍රතිඵලයක් ලෙසය. ඔවුන්ගේ ජීවිත කතාවන් සමස්ත මානව සංහතියටම ආදර්ශයක් වී ඇත්තේ ඒ නිසාය.

සෑම ආකාරයකම මූලධර්මවාදියෙක් තමන් සිරවී සිටින සිර කඳවුරින්, බිම් ගෙයින් කාණුවේ මඩ වලින් මිදීම සඳහා කතෝලික සම්ප්‍රදායේ සශ්‍රීකත්වයෙන් පෝෂණය ලැබිය යුතුයි. කතෝලික දහමට පිටු පා යෑමෙන් මානව සංහතියට යහපත් අනාගතයක් තනා ගත නොහැකිය. මූලධර්මවාදීන් තමන් ගමන් කරන වැරදි මාර්ගය අත්හැරදා නිවැරදි මාර්ගයට පිවිසිය යුතුය. එම නිවැරදි මාර්ගය නම් කතෝලික දහමයි.

යම්කිසි පුද්ගලයෙක් කතෝලික සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් බවට පත් නොවුනත්, ජීවිතය පිළිබඳව විශ්වාන්තර දැක්මක්, විශ්වීය දැක්මක්, ගෝලීය දැක්මක් වගා කර ගැනීම අතිශයින්ම වැදගත්ය. මේ ලෝකයේ සිදුවෙමින් පවතින දේවල් හරියාකාරව තේරුම් ගත හැක්කේ එවිටය. අප ලෝකය දෙස බලන ආකාරය විශ්වය මෙන් දැවැන්ත, පුළුල්, අප්‍රමාණ, අසීමිත, අචින්ත සහ යෝධ විය යුතු වේ. කතෝලික සභාව විසින් ප්‍රයත්න දරා ඇත්තේ සෑම කාලයකම එවැනි දැවැනත්, ගෝලීය දැක්මක් වැඩිදියුණු කර ගැනීමටය.

ලෝකයේ පවතින සෑම ජන සංස්කෘතියකම අඩංගු යහපත්, මානව වාදී, අව්‍යාජ, සත්‍යවාදී, සුබවාදී වටිනාකම් කතෝලික සභාව විසින් අවශෝෂණය කරන ගෙන ආරක්ෂා කර අනාගත පරම්පරා වලට හඳුන්වා දී ඇත්තේ ඒ නිසාය. වෙනත් ආගම් සහ සංස්කෘතීන් තුළ පවතින සෑම යහපත් සහ සත්‍යවාදී වටිනාකමක්ම කතෝලික සභාවට කිසිසේත්ම ආගන්තුක නොවේ. සෑම යහපත් සහ අව්‍යාජ දෙයක් ගැඹුරින්ම අගය කිරීමේ, ආරක්ෂා කිරීමේ, අවශෝෂණය කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ ඔප මට්ටම් කිරීමේ හැකියාව කතෝලික සම්ප්‍රදාය තුළ ආරම්භයේ සිටම පැවති ගති ලක්ෂණයකි.



මහාචාර්ය
**ඇන්ටන් මීමන**

# හතලිස් වසරක් සපිරූ මරිය වන්දනය

**පසුගිය සතියෙන්...**

අවසන් වශයෙන් ශුද්ධෝත්තම පියාණන් මරියතුමිය අනුග මනය කරන ලෙස කිතුනු සැදැහැවතුන් ගෙන් ඉල්ලා සිටීමට හේතුව වශයෙන් දක්වන්නේ "මරියතුමිය ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් මුල්ම හා පරිපූර්ණ ශ්‍රාවකයා වීම හේතුවෙන් (35) ශත වර්ෂ ගණනාවක් පුරා මරියතුමිය ගැන කියන කරන දේ හා දක්වන භක්තියට වඩා ශුද්ධ ලියවිල්ල තුළ එතුමිය ගැන දක්වන ප්‍රතිරූපය වඩාත් වටිනාකමක් ගනියි. (36) දෙවන කොටස අවසන් වන්නේ මරියතුමියට භක්ති ප්‍රණාමය දැක්වීමේදී වැළකී සිටිය යුතු දේ ගැන සඳහන් කරමිනි. ඒවායින් සමහරක් නම්, මරියතුමිය පිළිබඳ පටු ආකල්පවලින් වැළකීම, ඇතුළාන්තර වටිනාකමකින් තොර හුදු බාහිර ක්‍රියාකාරකම්, මිථ්‍යා විශ්වාස හා නිසරු භාවානුගතිකභාවය සහ සැමවිටම අලුතින් යමක් කිරීමේ ඇති අධික ආශාවෙන් පෙළීමයි. (38)

මරියතුමිය වෙත පිදෙන නොයෙකුත් භක්ති අභ්‍යාසයන් අතරින් ශුද්ධෝත්තම පියතුමා භක්ති අභ්‍යාසයන් දෙකක් තෝරා ගනියි. ඒවා නම් තුන්කාල ආරාධනය (41) සහ ශුද්ධ වූ ජපමාලයයි. (42-55) එසේ කිරීමට හේතුව ඒවා සැබවින්ම ශුද්ධ ලියවිල්ල මත පදනම් වූ හා ක්‍රිස්තුවේදීය ඒවා වීමය. ඒවා ඉතා පහසුවෙන් දේව වන්දනාව සමග සම්බන්ධ කළ හැකි වෙයි. එලෙසම ඒවා අපට අවශ්‍ය සැබෑ ඉල්ලීම්, ප්‍රශංසා සහ ධ්‍යානශීලී බවෙන් යුක්ත වෙයි. මෙම භක්ති අභ්‍යාස දෙක මරිය බැතිය පණගැන්වීමට බොහෝ සේ උපකාරී වෙයි. එපමණක් නොව ශුද්ධෝත්තම පියාණන් ජපමාලය යාම යැදුමට පසු පවුලේ යාච්ඤාවට යෝග්‍යම යාච්ඤාව සේ දක්වයි. (54)

තම එඬේර උපදේශනය අවසන් කරමින් ශුද්ධෝත්තම පියාණන් පවසන්නේ මරියතුමිය වෙත දක්වන භක්තිය ක්‍රිස්තියානි වන්දනාවේ අංශයක් හා ක්‍රිස්තියානි ශුද්ධවන්තභාවය වැඩි වර්ධනය කිරීමේදී දේව ධර්මීය අර්ථයක් හා එඬේරිය වටිනාකමක් ගැබ්වී තිබෙන්නක් බවයි.

මරියතුමිය ක්‍රිස්තියානි ජීවිතයේ ප්‍රතිරූපයයි. ක්‍රිස්තියානි ධර්මගුණය වැඩීමේදී මහඟු ආදර්ශයයි. (57) ශුද්ධෝත්තම පියාණන් නූතන මනුෂ්‍යයා ගැන යමක් කීමටද අමතක නොකරයි. සන්තාපයෙන් හා බියෙන් පෙළෙන මනුෂ්‍යයාට ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තුවත්, තනිබව හමුවේ සාමූහිකත්වය පිළිබඳ සිතුවිල්ලත්, උකටලී බව හමුවේ චිත්ත සාමයත්. ජුගුප්සාව සහ කාංසාව හමුවේ ප්‍රීතිය සහ අලංකාරය පිළිබඳ හැඟීමකුත්, ලෞකික ආශාවන් හා කැදරකම හමුවේ සදාකාලික වටිනාකම් සමුදායකුත්, මරණය හමුවේ ජීවිතයත් මරියතුමියගේ චාම් හා නොසැලෙන දර්ශනය හා සැනසිලිදායක වචනය මගින් අපට ප්‍රදානය කරයි. (57)

දොමිනිකානු නිකායික
**ගරු ජයලත් බලගල්ල පියනම**

දසත ආලෝකය විහිදමින් ප්‍රදීපය

දැල්වෙන පහන්

# කතෝලික ගුරුපියෙක් දෙව්ඳුන් අතරට!



ආරච්චිකට්ටුව, ග්‍රාමයේ විසූ දක්ෂ ගුරුවරයකුවූ ඇඩී ප්‍රනාන්දු ගුරු පියාණෝ අවුරුදු අනූවක් පමණ ආයු වළඳා පසුගියදා දෙවිපියාණන් වෙත සැපත් වූහ. එතුමා රාජකදළුව, දෙමටපිටිය, කාක්කපල්ලිය, එලිෆන්ට් පාස්, මොරටුව, බංගදෙණිය ආදි ප්‍රදේශවල ගුරුවරයෙක් වශයෙන් සේවය කොට විශ්‍රාම ගනුලැබුවේද තමා බාල කාලයේදී සිප්සතර හැදැරූ රාජකදළුව කතෝලික විදුහලෙන් වීම විශේෂ සිදුවීමකි.

එතුමාට බාලකාලයේදී අධ්‍යාපනය සඳහා මඟ පෙන්වූ රාජකදළුව දේවස්ථානය භාරව සිටි පියතුමාවද ගරු වැන්සස් ලාවුස්, ගරු බෝර්ජියා පැවිදි සොහොයුරියන්වද එතුමා ජීවත්ව සිටියදී නිතරම සිහිපත් කරයි.

දක්ෂ සංගීතවේදියකු, නාට්‍ය රචකයකු, වේදිකා නාට්‍ය නළුවෙකු, ගීත රචකයෙක් වූ එතුමා ඒ සියල්ල දෙවිඳුන් යැදීම. පිදීම සඳහා පූජා කළේය. එතුමන් විසින් රචිත 'ලෝකා ලෝකය' නම් නාට්‍ය අප ප්‍රදේශයේ දේවස්ථානවල රඟ දැක්විය. එමෙන්ම පාස්කු නාට්‍යද රචනා කොට වේදිකා ගත කළේය. එතුමා ගැයූ පසන් ගීත, මහත්සේ ජනප්‍රිය වූ අතර ඒවා කැසට් පටිවලටද යොදා ගැනින.

ගුරු වෘත්තියෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව හලාවත පදවියට සම්බන්ධ වූ එතුමා 'සත්මග' සඟරාවේ සංස්කාරක ධුරයද, හලාවත පදවි සංස්කෘත කමිටුවේ සමාජිකත්වයද, සාසන සේවක මණ්ඩලයද, නියෝජන කරමින් මහත් සේවයක් කතෝලික සභාවට කළ අතර හලාවත 'සංහිදියාව' නිකේතනයෙහි පාලන ධූරයද උසුලනු ලැබීය.

රාජකදළුව ශුද්ධවූ පවුල දේවස්ථානය ගොඩනැංවීම සඳහා ස්වර්ගස්ථ වූ ගරු හෙක්ටර් ප්‍රනාන්දු පියතුමා සමග දිවා රෑ නොබලා වෙහෙසවූ ආකාරය ප්‍රදේශවාසී කතෝලික බැතිමතුන් නිතර සිහිපත් කරයි. එතුමා අප දේවස්ථානයේ 'දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීමේ සේවක' වශයෙන්ද කටයුතු කළේය.

එතුමාගේ සේවය අගයකරමින් උපහාර උලෙළක් මීට වසර කීපයකට පෙර මහජන සහභාගිත්වයෙන් සිදුකළ අතර එදින එතුමා පිළිබඳ කෙටි චිත්‍රපටියක් ද දේවස්ථාන භූමියේ තිරගත කෙරින. රාජකදළුව ප්‍රදේශයේ මාවතක්ද 'ඇඩී ප්‍රනාන්දු' මාවත යනුවෙන් නම් කරන ලදි.

**ක්‍රිස්ටෝපර් ජාන්ස්**
රාජකදළුව

62 වෙනි ජන්ම සැමරුම වෙනුවෙනි

# නොනිමි නමක් තැබූ ගරු ජෝසෆා පැවිදි සොයුරිය



සී. බෙනඩික් ජෝසප් ප්‍රනාන්දු හා මාර්තා ප්‍රනාන්දු යුවලට දාව 1952 ඔක්තෝබර් මස 25 වැනිදා වැඩි මහල් දරුවා වූ සී. බෙනදික්තා පිලමිනා ප්‍රනාන්දු ළඳැරිය කෙදිනක හෝ සමිඳු මිදි උයනේ සාරවත් කෙතක් වේ යැයි කිසිවකු නොසිතුවද සියල්ල දේව කැමැත්තට අනුව සිදු වෙද්දී මග්ගෙ ාන සාන්ත මරියා විදුහලින් මූලික අධ්‍යාපනය ලැබූ ඈ 1975 අගෝස්තු මස 23 දා යහපත් එඬේරා නිකායේ පැවිදි වරය සඳහා ආධුනික පුහුණුවට නායකකන්ද කන්‍යාරාමයට ඇතුලත් වීමට වරම් ලැබුවාය.

සොයුරු සොයුරියන් අට දෙනෙකුගේ පවුලේ වැඩිමලා වූ ඈ කුඩා කල සිටම සමාජයේ කොන්වූ අය සොයමින් කළ මෙහෙවර උදාරය. රැකවරණයෙන් හා සොයුර සොයුරියන්ගේ ආදර ඇසුරින් මිදී පැවිදි දිවිය ගත කිරීම සඳහා කන්‍යාරාමයට ඇතුලත් වී හරියටම දින දහය පිරෙන දා තම ආදර පියාණන්ගේ හදිසි මරණය සිත තුළ ඇඩි වේදනාවක් ඇති කළද ඉදිරියට තැබූ පය පිටු පසට නොගත් මෙතුමිය 1978 පැවිදි වරියක ලෙස ස්ථිර පොරොන්දු දුන් අතර සිය පියාණන් සිහිවීම සඳහා 'ජෝසෆා' නාමය තම පැවිදි නාමය ලෙස යොදා ගත්තාය.

විශ්ව විද්‍යාලයීය බහුශ්‍රැත ගුරුවරියකු වූ මෙතුමිය 1991 වසරේදී නායකකන්ද මහ විදුහලෙහි විදුහල්පතිනිය ලෙස විසි වසරකට වඩා වැඩි කලක් එහි සේවය කිරීම කාගේත් විමතියට හේතුවිය.

2011 වසරේදී ගුරු වෘත්තියෙන් විශ්‍රාම ගිය ඈ කඳාන හපුගොඩ කන්‍යාරාමයේ ශ්‍රේෂ්ඨ මව් තුමිය ලෙස සේවය කරද්දි රෝගාතුරව 2013 අගෝස්තු මස 18 වැනිදා ස්වර්ග ස්ථ විය.

නිහතමානී සරල දිවියක අගය කියා පාමින් සමිඳු මිදි උයනේ දිදුලන තරුවක් වූ ඈ අප අතරින් සමුගෙන වසරක් පිරුනද ඇගේ තවත් උපන් දිනයක් සැමරීය. එතුමියගේ ආත්මයට අපි මොක් සුව පතමු.

**ඇන්තනි ජයලත්**
සාම මිහිර සංස්කාරක

# විශ්වාස ශක්තිය කරගත් ඇය එකසිය තුන් වැනි වියේදී සගසුව දිනයි



කුරුණෑගල පදවියේ හෙට්ටිපොල ශ්‍රී හෘදය දේවස්ථානයට අයත් රිට්ටාදෙනියේ පදිංචිව සිටි එම්. ඒ. එලිසබෙත් හාමිනේ සිව්දරු මවකි. මිත්තනියෙකි. දේවස්ථානයේ විවිධ සමිති සමාගම්වලට සම්බන්ධව සංඝයේ වර්ධනයට කළාවූ අමිල මෙහෙවර වෙනුවෙන් දේවස්ථාන සංඝයේ උපහාරයෙන්ද පිදුම් ලැබුවාය.

ජපමාල උච්චාරණයට විශේෂ ලැදියාවක් දැක්වූ ඇයගේ ශක්තිය වූයේ යාච්ඤා ජීවිතයයි. දෙවිපියාණන් වෙතින් ලැබූ සුවය ශක්තිය ආශිර්වාදයක් කොට ගනිමින් විශ්වාසයේ ගමනක යෙදුන මේ දයාබර මාතාව මීසම් සේවක ගරු එමාඩ් කොලින් පියතුමා අතින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා රෝගීන්ගේ ආශිර්වාදයද ලබා ගනිමින් ඇයව ආදරයෙන් රැක බලාගත් දියණිය ජෙනට් කලුආරච්චි සහ මිණිබිරිය ප්‍රිස්කා සමුදිනි ඉදිරියේ කුරුසේ ලකුණ සලකුණු කර ගනිමින් තමන් විසින්ම තම ප්‍රාණය ජේසුට බාර කරගනිමින් අවසන් හුස්ම හෙලුවාය. දේවමාතාවන්ට විශේෂ ගෞරවයක් දැක්වූ ඇය වික්ෂෝප දේවමාතාවන්ගේ මංගල්‍ය දිනයේම මෙලොවින් සමුගැනීම විශේෂත්වයකි. ගරු පියතුමන්ව, ගරු පැවිදි සොයුරියන් ඇතුළු පිරිසක් අවසන් ගෞරවය දැක්වීමට පැමිණ සිටි අතර හෙට්ටිපොල කතෝලික සුසාන භූමියේදී අවසන් කටයුතු සිදු කෙරිණි. එකසිය තුන්වැනි වියේදී ජීවිතයෙන් සමුගත් ඇයට අපි මොක්සුව ප්‍රාර්ථනා කරමු.

**කුලියාපිටියේ රීටා සේනානායක**

# පත්තර 350 ක් ගෙයින් ගෙට ගොස් බෙදා දෙන ගිහි ධර්මදූත සේවියා

පත්තර මිටියක් බයිසිකලයේ පිටුපසින් ගැට ගසාගෙන තවත් පත්තර මිටියක් බයිසිකලයේ ඉදිරිපස සවිකර ඇති කූඩයේ දමාගෙන ගම වටා ගෙයින් ගෙට කතෝලික පුවත්පත් බෙදාදෙන වෙන්නප්පුවේ සෙබස්තියන් ප්‍රනාන්දු මහතා සතිපතා මේ කටයුත්තට දේව කාරියකට සේ උරදෙයි.

වෙන්නප්පුව මීසමේ ඥානාර්ථ ප්‍රදීපය සහ මැසෙන්ජර් පත්තර තුන්සියයක්ද, ළමා ප්‍රදීපය 47 ක් ද ගෙයින් ගෙට ගොස් බෙදා දෙන මේ ගිහි ධර්මදූතයා සිය එකම පුත්‍රයා දෙවියන් වහන්සේගේ මිදි උයනේ සේවාවට තිළිණ කළේය. හලාවත පදවියේ ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමාගේ පියා වන සෙබස්තියන් ප්‍රනාන්දු මහතා පත්තර ගෙයින් ගෙට බෙදා දුන්නත් කිසි දිනක මුදල් ඉල්ලන්නේ නැත. මුදල් ලබාදුන් විට සිනාවකින් තුති පූර්වකව එය පිළිගන්නා ඔහු පත්තර බිල් තම අතේ ඇති මුදල්වලින් නුලට පියවන්නේය.




අව්ව, වැස්ස, පින්න මේ කවර බාධකයකින්වත් පසු නොබැස කලට වේලාවට කතෝලික පත්තරය මීසමේ නිවෙස් වලට ලබාදීමට මේ ගිහි ධර්මදූත සේවියා දැඩි සටනක නියැලේ. වෙන්නප්පුව මීසමේ මේ අනගි ධර්මදූත මෙහෙවර ඉටුකරන්නට පටන්ගෙන මේ වනවිට වසර විස්සක් ඉක්මවා ඇති සෙබස්තියන් ප්‍රනාන්දු මහතා සෑම සතියකම බ්‍රහස්පතින්දා සිට ඉරිදා දක්වා ඉතාමත් කාර්ය බුල වන්නේ කතෝලික පත්තර බෙදා දීමේ ධර්මදූත මෙහෙවර නිසාය.

ඉතාමත් සරල, චාම් හා නිහඬ ජීවිතයක් ගතකරන සෙබස්තියන් ප්‍රනාන්දු මහතාගේ මේ සේවාවට දෙවියන් වහන්සේගේ විපුල වරප්‍රසාද නොඅඩුව ලැබෙන බව නම් නිසැකය. නිරතුරු සිනාව පිරි මුවින් යුතුව සිය බිරිඳ සමග දිවිගෙවන සෙබස්තියන් ප්‍රනාන්දු මහතාට නිදුක් නිරෝගි සුවය සමග දේවාසිරි බහුලව ලැබේවායි යන්න වෙන්නප්පුව මීසම් වාසින්ගේ එකම යැදුම මෙන්ම පැතුමයි!

**(පසුබිම් වාර්තා තාරුකා දිලන්ති ප්‍රනාන්දු,) සටහන: ශිරාන් මෛත්‍රි**

# මුළු දිවයිනටම සාම විනිසුරු



දුනගහ බටේපොල පදිංචි ඇම්. සිරිල් අප්පුහාමි මහතා මුළු දිවයිනටම සාම විනිසුරුවරයෙකු වශයෙන් මීගමුව දිසා විනිසුරු ඒ. එම්. ඇන්. පී. අමරිසිංහ මහතා ඉදිරියේ දිවුරුම් දී ඇත. ඔහු ආරම්භයේ සිටම දිවුලපිටිය සමථමුල මණ්ඩලයේ සේවය කරන අතර අදටත් එහි සාමාජිකයෙකි.

බෝලවලාන කතෝලික ගුරු විද්‍යාලයේ පුහුණුව ලබා දිවයිනේ විදුහල් ගණනාවක සේවයේ යෙදුනු ඔහු මීගමුව සා. පිතර විද්‍යාලයෙන් විශ්‍රාම ලබා ඇත. අනතුරුව මීගමුව මාරිස්ටෙලා විදුහලේද වසර ගණනාවක් සේවය කර ඇති ඔහු අදටත් ප්‍රදේශයේ සමාජ සේවා කටයුතුවල යෙදී සිටියි. දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයෙකුවන ඔහු විසින් පුහුණු කරන ලද මඩම්පැල්ල පාසල් වොලිබෝල් කණ්ඩායම සමස්ත ලංකා තරගයෙන් ජය ලබා අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතාගෙන් සම්මාන පවා ලබා ගෙන ඇත. ගණිතය, සිංහල ඉගැන්වීමෙහි දක්ෂ ගුරුවරයකු වශයෙන් ප්‍රසිද්ධියක් දරණ ඔහුගෙන් අදටත් ගුරු උපදෙස් ලබා ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පැමිණෙති.

**ශාස්ත්‍රාචාර්ය ලක්ෂමන් සෙනෙවිරත්න**
ආචාර්ය - මාරිස්ටෙලා විදුහල

# ප්‍රදීපයට ප්‍රදීපයක් වූ අනුරාධපුර දිරිය මාතාව

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත අනුරාධපුරයේ බෙදාහරිමින් කිතුනු ජනතාවට මෙන්ම බොදුනුවනටද ප්‍රදීපය දැක්ම පිළිබඳ දැනුම ලබාදීමට වෙහෙස ගන්නා

කේ. රීටා ප්‍රනාන්දු මහත්මිය අනුරාධපුර ශාන්ත ජෝශප් ආසන දෙව් මැඳුරේ ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය අලෙවිකිරීම වසර 10 කට ආසන්න කාලයක් පුරා සිදු කරන්නීය. සතියෙන් සතිය ප්‍රදීපයේ අලෙවිය එකකින් හෝ වැඩි කිරීම ඇයගේ අරමුණයි. ඒ සඳහා රීටා සියුම් උපක්‍රම පාවිච්චි කරමින් ප්‍රදීපයේ ඇති වටිනාකම, හරය හා දැක්ම පිළිබඳ මීසම් ජනතාව දැනුවත් කරයි. ප්‍රදීපයේ කාලීන වැදගත් ලිපියක් පළවන සැමවිටම ඒ පිළිබඳව ඉරිදා දිව්‍ය පූජාවට සහභාගිවන බැතිමතුන්ව දැනුවත් කිරීම ඇගේ විශේෂ ලක්ෂණයයි.

කේ. රීටා ප්‍රනාන්දු මහත්මිය 1943 ජූලි 26 දා මොරටුව සරික්කාලිමුල්ලේදී උපත ලැබුවාය. පානදුර යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ අධ්‍යාපනය හැදෑරූ ඇය වයස අවුරුදු 12 සිට සරික්කාලිමුල්ල දේවස්ථානයේ දරු සමාග මේ සජීවිකාවක ලෙස කටයුතු කළාය.

කළුතර කලමුල්ලේ ඩබ්. බ්ලාසියුස් ප්‍රනාන්දු මහතා සමග 1984 ඔක්තෝබර් 1 දා යුග දිවියට එළඹි රීටා දරුවන් 4 දෙනෙකුගේ අම්මා කෙනෙකි. විවාහයත් සමග රජයේ සැලසුම් ශිල්පියකු ලෙස අනුරාධපුර දිසාපති කාර්යාලයේ සංරක්ෂණ මණ්ඩලයට ස්ථාන මාරුවක් තම සැමියාට ලැබීම නිසා මෙම යුවළ අනුරාධපුරයේ ස්ථිරව පදිංචි වූහ.

ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ අනුරාධපුර මීසමේ ආරම්භක යුවළක් වෙමින් රීටා හා බ්ලාසියුස් යුවළ එහි ලේකම්, භාණ්ඩාගාරික තනතුරු දරමින් පවුලක් තවත් පවුලකට ලඟාවෙමින් පවුල් ජීවිත පිළිබඳව මීසමෙත්, අනුරාධපුර පදවිය තුළත් පවුල් සේවාවේ නියුක්ත වූහ. රීටා ප්‍රනාන්දු මරිය හමුදාව තුළින්ද අසරණ සරණ සේවාවටද අද දක්වා කැපවීමෙන් සේවය කරයි. සතියේ සෑම බදාදා දිනකම අනුරාධපුර රජයේ ශික්ෂණ රෝහලේ නේවාසික රෝගීන් බැහැ දකිමින් අවශ්‍ය අධ්‍යාත්මික සුවය තම සොයුරු මරිය හමුදා සෙසු සමාජිකාවන් සමගින් රෝගීන්ට ලබාදීම අනෙක් සුවිශේෂි කරුණයි.

**ජෝර්ජ් අයිවන් රෙක්සි**



**සුදුතුම් පිය..** 1 පිටුවෙන්

'මේ සංචාරයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම සාන්තුවර භාග්‍යවන්ත ජුසේවාස් හිමිපාණන් සාන්තුවරයට එසැවීමේ මෙහෙයට ප්‍රමුඛතාවය ලබා දීමට ශ්‍රී ලංකා කතෝලික රදගුරු මංඩලය පොදු තීරණයකට එළැඹ ඇති බැවින් කොළඹ අගරදගුරු පදවියේ සියලු මීසම්වල ජනතාව ඒ ගැන දැනුම්වත් කර සහභාගි කර ගන්නා ලෙසද උන්වහන්සේ ඉල්ලා සිටියහ. සුදුතුම් පිය ලංකා ගමනේ ආරක්ෂක කටයුතු ඇතුලු සෙසු සංවිධාන කටයුතු විදේශ කටයුතු ඇමැතිවරයාගේ මඟ පෙන්වීම යටතේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට රජය පවරා ඇතැයි ද උන්වහන්සේ පැවසූහ.

මේ අතර සසුන් පිය ලංකා ගමනේ කටයුතු පිළියෙළ කිරීම සඳහා වතිකාන නියෝජිත පිරිසක් අද ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත අතර ඔවුන් සමඟ විශේෂ හමුවීම් කීපයක් පැවැත්වේ.

**මරිය වසර ..** 1 පිටුවෙන්

සා. පීතර දේවස්ථානයේ ප්‍රධාන ගේට්ටුව අසළ සිට සහයක රදගුරු හිමි දේවමාතා ප්‍රතිමාව පුදසුන කරා රැගෙන යන අතර පැවිදි පූජක පිරිස් ඒ පෙරහරේ ගමන් කරති.

ගරු දෙව්ශාන් අසංක පියතුමාගේ ගීත භාවනා අඩ පැයක් ඉන් අනතුරුව පැවැත්වෙන අතර ඉන්පසු කාදිනල් හිමිපාණන්ගේ දෙසුම හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කිරීමෙන් පසු දෙව්මව් ප්‍රතිමාවෙන් ආසිරි ගැන්වේ. මෙහෙය අවසන මල් වෙඩි සංදර්ශනයක් ද පැවැත්වේ. කොළඹ උතුර කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් කටයුතු සංවිධානය කැරෙන අතර මීගමුව දිසානායක අතිගරු ක්ලෙමන්ට් රොසයිරෝ, මීගමුව නැගෙනහිර දිසානායක අතිගරු ලින්ටන් ජෝශප්, කටාන දිසානායක අතිගරු නිශාන්ත රුද්‍රිගු ඇතුලු පියතුමන්, පැවිදි සොයුරු සොයුරියන්, ගිහි සැදැහැවතුන්, මීගමුව කතෝලික ශාසන ආරක්ෂක බල මණ්ඩලය එහිලා සහය වේ.



මෙවර මිදෙල්ලවිට මිඛායෙල් අග්‍රදූතතුමන්ගේ වාර්ෂික මංගල්‍ය නිමිතිකොට, මිඛායෙල් දේවදූතයා සාතන්ගේ හිසට හෙල්ලයකින් අනින දර්ශනයක් රැගත් තොරණ දෙව්මැඳුර ඉදිරිපිට මෙසේ ඉදිකර තිබුණි.

**(බෙන්ජමින් කිරිහෙට්ටි)**

## බඩල්ගම මීසම තුළ නිහඬ සේවාවක නියුතුවූ ඇම්. ඇන්සල් අප්පුහාමි මහතා



ඇම්. මාර්ෂල් අප්පුහාමි සහ කැතරින් තිසේරා යුවලගේ තෙවැනි දරුවා ලෙස ඇම්. ඇන්සල් අප්පුහාමි මහතා ක්‍රි.ව. 1942 නොවැම්බර් මස 24 වැනි මොලොවට බිහිවිය. තම ප්‍රාථමික පාසැල් දිවිය පටන් ගන්නා තෙක් දෙමාපියන් සහ වැඩිමහල් සොහොයුරා සහ සොහොයුරිය සමඟ ජීවත් විය. කාලය එළඹීමත් සමගම බඩල්ගම කතෝලික පාසලට ඇතුළු විය. පසුව මීගමුව සා. මරියා විදුහලට ඇතුළත්වූ අතර, ජ්‍යෙෂ්ඨ විභාගය දක්වා එහි ඉගනීමේ කටයුතු වල නිරත විය. මෙම කාලය තුළ ඉතාමත් විනීතව ගත කළ ඔහු ගුරු දෙගුරුන්ගේ සිත් දිනාගන්න කටයුතු කර ඇත.

1972 පෙබරවාරි මස 11 වන දින ඇත්ගාලේ පදිංචි ජී.චාලට් මහත්මිය සමඟ ආශිර්වාදකාර බන්ධනයට ඇතුලුවිය. ඒ අනුව දූවරුන් තිදෙනෙකුගේ මාපියන් විය. මෙයින් බාල දියණිය හදිසියේ වියෝ විය. මෙම දූවරුන් තිදෙනාගේම අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඇන්සල් අප්පුහාමි මහතා තමන්ට හැකි අයුරින් උපාකර විය. ජී. චාර්ලට් මහත්මිය ගෙදර දොරේ සියලු වැඩකටයුතු නිසි අයුරින් ඉටුකරමින් දූවරුන්ගේ වැඩකටයුතු සඳහා ද සහය වී ඇත. වර්ෂ 1987 මීසම් සංවර්ධන සභා ක්‍රමය ආරම්භවූ අවස්ථාවේ සිට ඇම්. ඇන්සල් අප්පුහාමි මහතා බඩල්ගම දේවස්ථානයේ 2 වන ඒකකයේ නායකයා ලෙස කටයුතු කර ඇත. මීසමේ සියළු කටයුතුවලදී එහි දායකත්වය ලබාදෙමින්ද කටයුතු කර ඇත. නිතරම ඔහු සිනාමුසු මුහුනින් සිටිනු දක්නට ලැබූ නිසා "ස්මයිලින් පේස්" යන නමින්ද හඳුන්වනු ලැබීය. ඔහු මීසමේ ලොකු කුඩා කා අතරත් ජනප්‍රසාදයට පත්ව සිත් දිනාගත් අයෙකු විය.

අපගේ සදාදරණීය ඇම්. ඇන්සල් අප්පුහාමි මහතා ස්වර්ගස්ථ වී ඔක්තෝබර් මස 27 දිනට තුන්මාසයකි ඇම්. ඇන්සල් අප්පුහාමි මහතාට නිත්‍ය සැතපීම ලැබේවායි පතමි.

**(බඩල්ගම කේ. ලීනස් පෙරේරා)**

## ස්තුති කිරීම

මාගේ ජේසුටත් දේව අම්මාටත් මම ස්තුති කරනවා. කලක් මම බයිබලයට ගියා. මම උපන් ද සිට කතෝලිකයා. මට කිසිම සැනසිමක් ලැබුනේ නැහැ. මම හුඟක් දුක් කරදර වලට මුහුණ පෑවා. මම 2010 දී පොල්ගහහේන ජේසු බිළිඳුන්ගේ නුවානයට ගියා. එදින මම පියතුමාගේ දේශනාව මම කරපු වරදට මඟ පෙන්නුවා. මම එදින ජේසුගෙන් දේව අම්මාගෙන් සමාව ඉල්ලා පසුතැවිලි වුණා. මාගේ පවුල් පොතේ නමත් කපා තිබුණා. මම හපුගොඩ පල්ලියට ගියා පියතුමාව මුණ ගැහිලා මාගේ ඇත්ත විස්තරය ප්‍රකාශ කළා. පියතුමා මට කිව්වා පාපොච්චාරණයක් කරන්න කියලා. මම පාපොච්චාරණය කළා. ජේසුගෙන් දේව මෑණියන්ගෙන් පිහිට උපකාරය මට හුඟක් ලැබුණා. මාගේ ජේසුටත් දේව මෑණියන්ටත් ස්තුති කරනවා. පවුල් පොතට නමත් දැම්මා. අද මාගේ ජීවිතය තුළ විශාල ආශිර්වාදයක් ලබා ගෙන යාච්ඤාව තුළ ඇදහිල්ලෙන් මම යාච්ඤා කරනවා. **මීට මවක්, කළාන - හපුගොඩ**

## කණුවන කනත්ත හා සම්බන්ධවයි

කනුවන, තුඩැල්ල, ජා-ඇල මීසම් වලට අයත් සුසාන භූමියේ ඉඩකඩ නොමැතිකම නිසා ඉදිරියේදී පියවර කීපයක් ගැනීමට සිදුවී ඇත. එබැවින් මෙම සුසාන භූමිය තුළ භූමදාන කර ඇති අයගේ සියලුම ඥාතින් 2014 නොවැ. 02 ඉරුදින පැවැත්වෙන දිව්‍ය යාගයන් වලට සහභාගි වී එම ස්ථාන ලියාපදිංචි කරගන්නා මෙන් ඉල්ලා සිටින අතර එදින පැවැත්වෙන දිව්‍ය පූජාවන් වලදී විශේෂ දැනුම්වත් කිරීමක් කරනු ඇත. ඔබගේ පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලමි.

නොවැ. 02 දිව්‍ය පූජාවන් පැවැත්වෙන වේලාවන් මෙසේය. උදේ 6.00, උදේ 8.00 සහ සවස 4.30.

ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා හා පරිපාලන කමිටුව සා. ජෝශප් දෙව්මැඳුර, කනුවන, ජා-ඇල.

දු. අංක 0112232622, 071 8661604

## කළාන සා. සෙබස්තියන් සිද්ධස්ථානයේ 150 ජයන්තියට මහා ධර්ම විවේකයක්

කළාන සා. සෙබස්තියන් සිද්ධස්ථානයේ 150 ජුබිලිය 2018 දී සැමරීමට නියමිතය.

අගරදගුරු පදවියේ පැවිදි හා පවුල් වසර හා ජුබිලිය වෙනුවෙන් ප්‍රැන්සිස්කාන ගරු පියවරුන් විසින් පවත්වන මහා ධර්ම විවේකය 2014 නොවැ. 02 දා ආරම්භ වේ. මාසයක් පුරා මීසමේ සෑම නිවසක්ම බැහැ දකිමින් ආධ්‍යාත්මික පෝෂණයක් ලබා දෙන අතර සෑම දිනකම කොට්ඨාශ තුළ දිව්‍ය පූජා යාගයන් සිදුකෙරේ. සිද්ධස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය සෑම දිනකම රාත්‍රි 7.00 ට පැවැත්වෙන අතර දෙසැ. 01 සිට 15 දක්වා දිනයන්හිදී විවිධ වයස් කාණ්ඩ සඳහා උපදේශනය හා යැදුම් මෙහෙයන් පැවැත්වේ. ජනවාරි 4 සිට 20 දක්වා ආධ්‍යාත්මික උපදේශනය හා පාපොච්චාරණ සක්‍රමේන්තුව ලබා දීම සිදුකෙරේ.

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ කතෝලික දහම අතහැර ගිය ජනතාව සොයා යාම හා මීසම් ජනතාවගේ ඇවෙන ප්‍රශ්න වලට සවිමත් පිළියම් ලබා දෙමින් ඉදිරි වසර තුන තුළ එම ක්‍රියාකාරකම් සවිබල ගන්වා 150 වන ජුබිලිය අර්ථාන්විතව සැමරීම බව සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමා පැවසීය. **(පියල් ජයකොඩි)**

## ජාතික පාසල් ක්‍රීඩා උළෙල මාරිස්ටෙලා-ජෝශප්වාස් ක්‍රීඩකයෝ වර්ණවත් කරති

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ කතෝලික බාලක විදුහල් දෙකක් වන මීගමුව මාරිස්ටෙලා විදුහල හා වෙන්නප්පුව ජෝශප්වාස් විදුහල පසුගියදා කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ නිමාව දුටු 2014 ජාතික පාසල් ක්‍රීඩා උළෙලේ විශිෂ්ට දස්කම් දක්වමින් ශූරතාවය මාරිස්ටෙලා විදුහලත් අනුශූරතාවය ජෝශප්වාස් විදුහලත් දිනා ගැනීමට සමත්විය. **(ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු)**

## දහම් ගුරුවරියට සම්මාන



දහම් ගුරුවරියක් වන බෝපිටිය වැල්ලබඩ මීසමේ සීතා ප්‍රනාන්දු පුල්ලෙ ගුරු මහත්මිය 2014 ගුරු ප්‍රතිභා ප්‍රභා සම්මානයෙන් පිදුම් ලැබුවාය. උස්වැටකෙයියාව සාන්ත මරියා මහ විදුහලේ ප්‍රාථමික අංශයේ සේවය කරන ඇය අධ්‍යාපන අමාත්‍යංශය මගින් 2014 ඔක්තෝබර් 06 වන දින ලෝක ගුරු දිනය වෙනුවෙන් සංවිධානය කල උත්සවයේදී සම්මානයෙන් පිදුම් ලැබුවාය.

වසර 30 කට ආසන්න කාලයක් දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කැපවූ ඇය තල්දෙක, උල්හිටියාව රජයේ විදුල්වල හා පමුණුගම මහවිදුහලේ සේවය කර ඇත. පාසල් දරුවන් බාහිර ක්‍රියාකාරි වැඩවලට ද යොදවා හොඳ සේවාවක් කර ඇති සීතා ප්‍රනාන්දු පුල්ලෙ ගුරු මාතාව වැල්ලබඩ දෙව්මැඳුරේ දහම් පාසල් ගුරුවරියක හා මරිය හමුදා ප්‍රසිඩියමේද සේවය කරන්නීය.

**(බෙන්ජමින් කිරිහෙට්ටි)**

### සාන්ත ජෝශප් විද්‍යාලය කොළඹ 14



විශ්‍රාමික විදුහල්පති ගරු ප්ලැසිඩස් ප්‍රනාන්දු සහෝදරතුමාගේ සේවය ඇගයීමේ හමුවක් 2014-11-08 වැනි දින පැවැත්වේ.

මෙම හමුව සඳහා ආදි සිසු ඔබට ආරාධනා ! විමසීම් : සුභාෂ් : 077-3636296, ග්‍රෙගරි : 071-4318366

නිර්මල මරිය නිකායේ ස්වර්ගස්ථ වූ සියලුම ගරු පියතුමන් සහ සහෝදරතුමන් සිහිවීම පිනිස 2014. 11. 03 සඳුදා දින සවස 4.00 ට බොරැල්ල පොදු සුසාන භූමියේ දී දිව්‍ය පූජාව සිදු කැරෙන බැවින් ඔබ සැමට සහභාගි වීමට ආරාධනා කරමු. ගරු ප්‍රාදේශාධිපති පියතුමා, ද මැසනඩ් නිවස, කොළඹ 15. දු. අංක 011 2521180

## උස්වැටකෙයියාව ජනතාව 'මරිය වසර' සමරයි



උස්වැටකෙයියාව මීසමේ මීසම්වාසීන් පසුගියදා 'මරිය වසර' තේමා කර ගනිමින් සංවිධානය කළ විශේෂ වැඩසටහනට ජපමාල උච්චාරණය, දේවමාතා ප්‍රතිමාව වීදි සංචාරයේ රැගෙන යෑම හා ධීවර බෝට්ටු හා ආම්පන්න ආශිර්වාද කිරීම හා දිව්‍ය පූජා යාගයක්ද එක්ව තිබුණි. උස්වැටකෙයියාව මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමන්ගේ සංකල්පයක් අනුව මීසම් ධර්මසේවා සභාවේ සහ මීසම්වාසීන්ගේ සහයෝග යෙන් සංවිධානය කරනු ලැබූ මෙම 'මරිය වසර' උස්වැටකෙයියාව මීසමේ ප්‍රථම වරට දේවමාතා ප්‍රතිමාව හැමිල්ටන් ඇල දිගේ බෝට්ටු පෙරහරින් රැගෙන යෑමද කාගෙත් ප්‍රසාදයට ලක්වූ අංගයකි. **(සටහන හා සේයා - තිළිණ අලහකෝන්)**

## විවාහ සංවත්සර

### 35 වසරක යුග දිවි සැමරුම



ඥානාර්ථ ප්‍රදීප ලේඛකයකු වන නැගෙනහිර නයිනමඩමේ වෝල්ටර් නික්ලස් පෙරේරා මහතා සහ මරිය ජෙකෙමිනි (ජසින්තා) ප්‍රනාන්දු මහත්මිය තිස්පස් වන විවාහ සංවත්සරය සැමරීය. නයිනමඩම වික්ෂෝප දේවමාතා දෙව්මැදුරේ අසිපා කිතුනු සංඝයේ 7 කොට්ඨාශයේ සංඝ නායිකාව ලෙස කටයුතු කරන්නීය. **(ටෙස්මා රෝස් ශ්‍රියන්ති පෙරේරා)**

### 42 වසරක යුගදිවි සැමරුම

**1972.10.11- 2014.10.11**



තලවිල පදිංචි සා.ආනා සිද්ධස්ථානයේ සංක්‍රිස්තියන් ඇන්ටනී පෙරේරා සහ මේරියන් පෙරේරා යුවළගේ විවාහ දිවියේ 42 වසරක් තුළ ලද මහඟු වරප්‍රසාදයට දෙවියන් වහන්සේට තුති පුදන්නේ, දූදරුවන් හා මුණුබුරු, මිනිබිරියන්



නුගපේ සණස 1939 දී ආරම්භ කළ පමුණුගම මීසම්භාරව සිටි සග සැපත් ගරු ලීනස් වාස් ද සිල්වා පියතුමා සිහිකිරීමේ දිව්‍ය පූජාවක් නුගපේ ලීනස් පිය සමරු ශාලාවේ දී බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ මෙහෙයීමෙන් පැවැත්විණි. එහිදී සණස උපසභාපති ඩී.ඩී.එස්.සී. මයිකල් මහතා ලීනස් පියතුමාගේ සේයාරුව අබියස මල් කලඹක් තබා ප්‍රණාමය පුදකළ අයුරුයි මේ. **(එස්.කේ.ජේ. කුරේරා)**

## කළාන ද මැසනඩ් විදුහල් මාතාව මරිය වසර බැතියෙන් සැමරූ පාගමනක්

කළාන ද මැසනඩ් විදුහලේ අධ්‍යාත්මික කමිටුව මඟින් සංවිධානය කළ ජපමාල මංගල රැළිය, පසුගිය දා හපුගොඩ ශාන්ත මරියා දේවස්ථාන භූමියෙන් ආරම්භ කර, විදුහල් භූමිය කරා, පාසල් සංසය තුළ දෙව්මව් බැතිය වඩවන ආකාරයේ අර්ථවත් පාගමනක් පැවැත්විනි.

විදුහලේ වත්මන් අධ්‍යක්ෂ ගරු බ්‍රර්ට්‍රම් පෙරේරා සහෝදරතුමාගේ සංකල්පයක් අනුව සංවිධානය කර තිබූ මෙම ජපමාල රැලියට, පාසලේ සියලුම දරුවන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් රැසක් ද සහභාගි විය. අවසානයේ දී පැවති දෙව්මව් ආසිරි ගැන්වීමේ අවස්ථාවට කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු දේවධර්මාචාර්ය අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන්, ශාන්තිකුමාර වැලිවිට පියතුමන් ඇතුලු පූජක පැවිදි සහෝදරතුමන්ලා, කන්‍යා සොහොයුරියන් රැසක් ද සහභාගි විය. **(සටහන - මැසනඩ් වාර්තාකරු)**